## අ.පො.ස. (උ.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව

# 2020

## 23 දේශපාලන විද්‍යාව


පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.
අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2020
ඇගයීම් වාර්තාව - දේශපාලන විද්‍යාව

| | |
|---|---|
| උපදේශකත්වය | : ජේ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ<br>විභාග කොමසාරිස් ජනරාල් |
| සැලසුම හා සංවිධානය | : ඩබ්. එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| විෂය සම්බන්ධීකරණය | : ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| අන්තර්ගත සංවර්ධන කමිටුව සඳහා<br>විෂය පාදක මඟපෙන්වීම | : මහාචාර්ය ජයදේව උයන්ගොඩ (විශ්‍රාමික)<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| ශාස්ත්‍රීය මගපෙන්වීම | : ඩබ්. එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන<br><br>ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| අන්තර්ගත සංවර්ධන කමිටුව | : එල්. ආර්. ආර්. සිල්වා<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සමාජ විද්‍යා)<br>අධ්‍යාපන අමාත්‍යංශය<br><br>එච්. එම්. ජේ. සෙනරත් බණ්ඩාර<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය, ගලෙන්බිඳුණුවැව<br><br>සී. එම්. අනුර චන්ද්‍රසේකර<br>ශ්‍රී. ලං. ගු. සේ. I<br>අ/වලිසිංහ හරිස්චන්ද්‍ර ජාතික පාසල, අනුරාධපුරය<br><br>ඩබ්. එම්. වයි. සී. වන්නිනායක<br>ශ්‍රී. ලං. ගු. සේ. 2 I<br>නික/ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය, නිකවැරටිය<br><br>බී. ජී. කෙනත්<br>ශ්‍රී. ලං. ගු. සේ. 2 I<br>කු/ශාන්ත ආනා විද්‍යාලය, කුරුණෑගල<br><br>ආර්. චන්ද්‍රමෝහන්<br>ශ්‍රී. ලං. ගු. සේ. 2 II<br>ම/හැ/ලොනැක් දමිළ විද්‍යාලය, වටවල |
| ලේඛන සහාය | : ඩී. පී. එම්. සමන්තිලක<br>කළමනාකරණ සේවා නිලධාරි |
| පරිගණක පිටු සැකසුම | : ආර්. ජේ. නිමේෂා මධුවන්ති පෙරේරා<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| පිටකවර සැකසුම | : ජේ. එල්. කේ. චතුරාණි<br>කළමනාකරණ සේවා නිලධාරි |

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2020 වර්ෂයේ දේශපාලන විද්‍යාව විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලු ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මගින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මග පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමඟ එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමගින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලූ ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

## සංක්ෂිප්තය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2020 වර්ෂයේ දේශපාලන විද්‍යාව විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

පළමු කොටසෙහි, දේශපාලන විද්‍යාව විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ සාමාන්‍ය තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය, ශ්‍රේණි ව්‍යාප්තිය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම විෂය අරමුණු, ඇගයීම් රාමුව සහ විභාගයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද ලබා දී ඇත.

දෙවන කොටසෙහි, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යුහය, ප්‍රශ්න සැකැස්ම, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ එක් එක් ප්‍රශ්නයට අපේක්ෂකයන් දැක්වූ ප්‍රතිචාර පිළිබඳ දත්තමය විශ්ලේෂණ ද අන්තර්ගත වේ. තව ද, අයිතමවල පහසුතාව/පහසුතා දර්ශක, විභේදන හැකියාව සහ අපේක්ෂකයන්ගේ සාමාන්‍ය ප්‍රතිචාර රටා ද විග්‍රහ කර ඇත.

තෙවන කොටසෙහි, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, එහි කොටස් හා අනුකොටස් සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, අයිතමවල පහසුතා දර්ශක, නිපුණතා මට්ටම් සහ සංකල්පමය දුර්වලතා හඳුනාගෙන ඇත. එසේම, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

# පටුන

පිටු අංකය

**I කොටස**

**1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු** 1
1.1 විෂය අරමුණු 1
1.2 අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 2
1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 2
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය 7

**II කොටස**

**2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය** 8
2.1 දේශපාලන විද්‍යාව I පත්‍රයේ ව්‍යුහය 8
2.2 දේශපාලන විද්‍යාව I පත්‍රය 9
2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 13
2.4 I පත්‍රයේ වරණ තෝරා ගෙන ඇති ආකාරය 18
2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 19
2.6 I පත්‍රයේ විශ්ලේෂණය 20

**3. II පත්‍රය හා ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය** 26
3.1 දේශපාලන විද්‍යාව II පත්‍රයේ ව්‍යුහය 26
3.2 II පත්‍රයේ විශ්ලේෂණය 27
3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ සහ නිර්දේශ 31
3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 31
3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 35
3.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 36
3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 40
3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 41
3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 44
3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 45
3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 48
3.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 49
3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 51
3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 52
3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය 55
3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 56
3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය 63
3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 64
3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය 67
3.3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර 68
3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය 71
3.3.19 ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර 72
3.3.20 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය 81
4. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා පොදු නිර්දේශ 82
5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා වන යෝජනා 83

## වගු නාමාවලිය


| | පිටු අංකය |
|---|---|
| වගුව 1.1 මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 2 |
| වගුව 1.2 ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 2 |
| වගුව 1.3 දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 3 |
| වගුව 1.4 අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය | 4 |
| වගුව 1.5 පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය | 7 |
| වගුව 2.1 ලකුණු දීමේ පටිපාටිය | 13 |
| වගුව 2.2 එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය | 18 |

## ප්‍රස්තාර නාමාවලිය

| | | පිටු අංකය |
|---|---|---|
| ප්‍රස්තාරය 2.1 | පළමු පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය | 19 |
| ප්‍රස්තාරය 2.2 | නිපුණතා අනුව පළමු පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතාව | 22 |
| ප්‍රස්තාරය 3.1 | II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය හා එක් එක් ප්‍රශ්නයේ පහසුතාව | 27 |
| ප්‍රස්තාරය 3.2 | පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය | 29 |
| ප්‍රස්තාරය 3.3 | II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක | 30 |
| ප්‍රස්තාරය 3.4 | ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 35 |
| ප්‍රස්තාරය 3.5 | ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක | 35 |
| ප්‍රස්තාරය 3.6 | ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 40 |
| ප්‍රස්තාරය 3.7 | ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක | 40 |
| ප්‍රස්තාරය 3.8 | ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 44 |
| ප්‍රස්තාරය 3.9 | ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක | 44 |
| ප්‍රස්තාරය 3.10 | ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 48 |
| ප්‍රස්තාරය 3.11 | ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශක | 48 |
| ප්‍රස්තාරය 3.12 | ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 51 |
| ප්‍රස්තාරය 3.13 | ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශක | 51 |
| ප්‍රස්තාරය 3.14 | ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 55 |
| ප්‍රස්තාරය 3.15 | ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශක | 55 |
| ප්‍රස්තාරය 3.16 | ප්‍රශ්න අංක 7හි අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 63 |
| ප්‍රස්තාරය 3.17 | ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශක | 63 |
| ප්‍රස්තාරය 3.18 | ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 67 |
| ප්‍රස්තාරය 3.19 | ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශක | 67 |
| ප්‍රස්තාරය 3.20 | ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 71 |
| ප්‍රස්තාරය 3.21 | ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශක | 71 |
| ප්‍රස්තාරය 3.22 | ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය | 81 |
| ප්‍රස්තාරය 3.23 | ප්‍රශ්න අංක 10 සඳහා පහසුතා දර්ශක | 81 |

# I කොටස

## 1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අරමුණු

- ශාස්ත්‍රීය විෂයයක් ලෙස දේශපාලන විද්‍යාවේ අන්තර්ගතය, තේමා සහ වැදගත්කම හඳුනා ගැනීම.
- තමන් ජීවත්වන පරිසරයේ, සමාජයේ සහ ලෝකයේ දේශපාලන ක්‍රියාවලීන්, දේශපාලන ආයතන සහ දේශපාලන වෙනස්වීම් හඳුනාගැනීම හා විචාරාත්මක ව තේරුම් ගැනීම.
- පුරවැසියන් හැටියට රටේත්, ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත්වන සාධනීය දේශපාලන සාරධර්ම, අරමුණු සහ මූලධර්ම පිළිබඳව සවිඥානික වීම.
- දේශපාලන විද්‍යා විෂයයේ ඓතිහාසික සහ සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීම.
- සාධනීය සමාජ, දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට, අවශ්‍ය දැනුම, අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම.

මූලාශ්‍රය : දේශපාලන විද්‍යාව විෂය නිර්දේශය 12/13 ශ්‍රේණි (2017)

## 1.2 අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

**වගුව 1.1**

මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | % | ස්ත්‍රී | % | එකතුව | පුරුෂ | % | ස්ත්‍රී | % | එකතුව | පුරුෂ | % | ස්ත්‍රී | % |
| සිංහල | 28,816 | 9,023 | 31.31 | 19,793 | 68.69 | 3,939 | 1,380 | 35.03 | 2,559 | 64.97 | 32,755 | 10,403 | 31.76 | 22,352 | 68.24 |
| දෙමළ | 9,214 | 2,883 | 31.29 | 6,331 | 68.71 | 3,156 | 1,518 | 48.10 | 1,638 | 51.90 | 12,370 | 4,401 | 35.58 | 7,969 | 64.42 |
| ඉංග්‍රීසි | 45 | 19 | 42.22 | 26 | 57.78 | 48 | 16 | 33.33 | 32 | 66.67 | 93 | 35 | 37.63 | 58 | 62.37 |
| එකතුව | 38,075 | 11,925 | 31.32 | 26,150 | 68.68 | 7,143 | 2,914 | 40.80 | 4,229 | 59.20 | 45,218 | 14,839 | 32.82 | 30,379 | 67.18 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

2020 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ දේශපාලන විද්‍යාව විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 45,218 වේ. මාධ්‍ය තුනම සැලකූ විට ස්ත්‍රී අපේක්ෂකයන් 67.18%ක් ද පුරුෂ අපේක්ෂකයන් 32.82%ක් ද විභාගය සඳහා පෙනී සිට ඇත. සිංහල, දෙමළ මාධ්‍යයන් හා සංසන්දනාත්මකව සැලකූවිට මෙම විෂයය සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව ඉතා අඩුය.

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

**වගුව 1.2**

ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | සියලුම අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | |
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| A | 3,302 | 509 | 4.27 | 2,793 | 10.68 | 183 | 46 | 1.58 | 137 | 3.24 | 3,485 | 555 | 3.74 | 2,930 | 9.64 |
| B | 4,667 | 733 | 6.15 | 3,934 | 15.04 | 363 | 89 | 3.05 | 274 | 6.48 | 5,030 | 822 | 5.54 | 4,208 | 13.85 |
| C | 9,323 | 1,871 | 15.69 | 7,452 | 28.50 | 1,089 | 327 | 11.22 | 762 | 18.02 | 10,412 | 2,198 | 14.81 | 8,214 | 27.04 |
| S | 11,454 | 3,698 | 31.01 | 7,756 | 29.66 | 1,919 | 668 | 22.92 | 1,251 | 29.58 | 13,373 | 4,366 | 29.42 | 9,007 | 29.65 |
| F | 9,329 | 5,114 | 42.88 | 4,215 | 16.12 | 3,589 | 1,784 | 61.22 | 1,805 | 42.68 | 12,918 | 6,898 | 46.49 | 6,020 | 19.82 |
| එකතුව | 38,075 | 11,925 | 100.00 | 26,150 | 100.00 | 7,143 | 2,914 | 100.00 | 4,229 | 100.00 | 45,218 | 14,839 | 100.00 | 30,379 | 100.00 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

දේශපාලන විද්‍යාව විෂය සඳහා පෙනී සිටි මුළු අපේක්ෂකයන්ගෙන් 77%ක් A සාමර්ථ්‍ය ද, 11.12%ක් B සාමර්ථ්‍ය ද, 23.02%ක් C සාමර්ථ්‍ය ද, 29.57% S සාමර්ථ්‍යය ද, 28.56% අසමත් ද වේ. විෂය සඳහා පෙනී සිටි ස්ත්‍රී පුරුෂ අපේක්ෂකයන්ගෙන් ඒ ඒ සාමර්ථ්‍ය ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයන් සංසන්දනාත්මකව සලකා බැලීමේදී A, B, C, S සාමර්ථ්‍යයන් ලබාගත් පුරුෂ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය ස්ත්‍රී අපේක්ෂකයන්ගේ ප්‍රතිශතයට වඩා අඩු බව දැකිය හැකි අතර, අසමත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය ස්ත්‍රී අපේක්ෂකයන්ට වඩා පුරුෂ අපේක්ෂකයන්ගේ වැඩි අගයක් ගන්නා බව දැකිය හැකිය.

## 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය දිස්ත්‍රික්ක අනුව

**වගුව 1.3**

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2,633 | 264 | 10.03 | 302 | 11.47 | 565 | 21.46 | 772 | 29.32 | 1,903 | 72.27 | 730 | 27.73 |
| 2. ගම්පහ | 2,523 | 242 | 9.59 | 321 | 12.72 | 588 | 23.31 | 744 | 29.49 | 1,895 | 75.11 | 628 | 24.89 |
| 3. කලුතර | 1,968 | 230 | 11.69 | 272 | 13.82 | 476 | 24.19 | 491 | 24.95 | 1,469 | 74.64 | 499 | 25.36 |
| 4. මහනුවර | 2,710 | 139 | 5.13 | 216 | 7.97 | 587 | 21.66 | 962 | 35.50 | 1,904 | 70.26 | 806 | 29.74 |
| 5. මාතලේ | 902 | 29 | 3.22 | 69 | 7.65 | 191 | 21.18 | 294 | 32.59 | 583 | 64.63 | 319 | 35.37 |
| 6. නුවරඑළිය | 2,096 | 99 | 4.72 | 219 | 10.45 | 656 | 31.30 | 736 | 35.11 | 1,710 | 81.58 | 386 | 18.42 |
| 7. ගාල්ල | 2,737 | 408 | 14.91 | 382 | 13.96 | 590 | 21.56 | 694 | 25.36 | 2,074 | 75.78 | 663 | 24.22 |
| 8. මාතර | 1,451 | 155 | 10.68 | 212 | 14.61 | 341 | 23.50 | 392 | 27.02 | 1,100 | 75.81 | 351 | 24.19 |
| 9. හම්බන්තොට | 1,623 | 148 | 9.12 | 183 | 11.28 | 384 | 23.66 | 442 | 27.23 | 1,157 | 71.29 | 466 | 28.71 |
| 10. යාපනය | 784 | 21 | 2.68 | 71 | 9.06 | 157 | 20.03 | 265 | 33.80 | 514 | 65.56 | 270 | 34.44 |
| 11. මන්නාරම | 161 | 2 | 1.24 | 16 | 9.94 | 44 | 27.33 | 62 | 38.51 | 124 | 77.02 | 37 | 22.98 |
| 12. වව්නියාව | 258 | 18 | 6.98 | 22 | 8.53 | 62 | 24.03 | 62 | 24.03 | 164 | 63.57 | 94 | 36.43 |
| 13. මුලතිව් | 48 | 0 | 0.00 | 2 | 4.17 | 11 | 22.92 | 21 | 43.75 | 34 | 70.83 | 14 | 29.17 |
| 14. කිලිනොච්චි | 75 | 0 | 0.00 | 10 | 13.33 | 12 | 16.00 | 17 | 22.67 | 39 | 52.00 | 36 | 48.00 |
| 15. මඩකලපුව | 1,158 | 43 | 3.71 | 94 | 8.12 | 237 | 20.47 | 408 | 35.23 | 782 | 67.53 | 376 | 32.47 |
| 16. අම්පාර | 1,672 | 89 | 5.32 | 204 | 12.20 | 388 | 23.21 | 525 | 31.40 | 1,206 | 72.13 | 466 | 27.87 |
| 17. ත්‍රිකුණාමලය | 577 | 47 | 8.15 | 79 | 13.69 | 160 | 27.73 | 170 | 29.46 | 456 | 79.03 | 121 | 20.97 |
| 18. කුරුණෑගල | 3,365 | 297 | 8.83 | 477 | 14.18 | 870 | 25.85 | 1001 | 29.75 | 2,645 | 78.60 | 720 | 21.40 |
| 19. පුත්තලම | 1,710 | 170 | 9.94 | 219 | 12.81 | 434 | 25.38 | 526 | 30.76 | 1,349 | 78.89 | 361 | 21.11 |
| 20. අනුරාධපුරය | 1,734 | 228 | 13.15 | 219 | 12.63 | 406 | 23.41 | 496 | 28.60 | 1,349 | 77.80 | 385 | 22.20 |
| 21. පොළොන්නරුව | 798 | 84 | 10.53 | 118 | 14.79 | 222 | 27.82 | 220 | 27.57 | 644 | 80.70 | 154 | 19.30 |
| 22. බදුල්ල | 2,387 | 173 | 7.25 | 324 | 13.57 | 703 | 29.45 | 765 | 32.05 | 1,965 | 82.32 | 422 | 17.68 |
| 23. මොණරාගල | 1,154 | 109 | 9.45 | 178 | 15.42 | 305 | 26.43 | 337 | 29.20 | 929 | 80.50 | 225 | 19.50 |
| 24. රත්නපුරය | 2,378 | 235 | 9.88 | 337 | 14.17 | 600 | 25.23 | 678 | 28.51 | 1,850 | 77.80 | 528 | 22.20 |
| 25. කෑගල්ල | 1,173 | 72 | 6.14 | 121 | 10.32 | 334 | 28.47 | 374 | 31.88 | 901 | 76.81 | 272 | 23.19 |
| සමස්ත දිවයින | 38,075 | 3,302 | 8.67 | 4,667 | 12.26 | 9,323 | 24.49 | 11,454 | 30.08 | 28,746 | 75.50 | 9,329 | 24.50 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

ඒ ඒ දිස්ත්‍රික්කවල සමස්ත සමර්ථ්‍ය ව්‍යාප්තිය සැලකීමේදී වැඩි ම අපේක්ෂකයන් සංඛ්‍යාවක් විභාගය සඳහා පෙනී සිටි කුරුණෑගල දිස්ත්‍රික්කයේ සමත් ප්‍රතිශතය 78.60%ක් වේ. A සමර්ථ්‍ය සැලකීමේදී ගාල්ල දිස්ත්‍රික්කයේ අපේක්ෂකයන්ගෙන් 14.91%ක් A සාමර්ථ්‍ය ලබාගෙන ඇති අතර එය සියලු ම දිස්ත්‍රික්ක අතර A සාමර්ථ්‍යය වැඩිම ප්‍රමාණයක් ගත් දිස්ත්‍රික්කය වේ.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය අධ්‍යාපන කලාප අනුව

### වගුව 1.4

අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1,159 | 177 | 15.27 | 166 | 14.32 | 232 | 20.02 | 317 | 27.35 | 892 | 76.96 | 267 | 23.04 |
| 2. හෝමාගම | 345 | 20 | 5.80 | 34 | 9.86 | 83 | 24.06 | 109 | 31.59 | 246 | 71.30 | 99 | 28.70 |
| 3. ශ්‍රී ජයවර්ධනපුර | 578 | 46 | 7.96 | 60 | 10.38 | 122 | 21.11 | 178 | 30.80 | 406 | 70.24 | 172 | 29.76 |
| 4. පිළියන්දල | 551 | 21 | 3.81 | 42 | 7.62 | 128 | 23.23 | 168 | 30.49 | 359 | 65.15 | 192 | 34.85 |
| 5. ගම්පහ | 779 | 123 | 15.79 | 131 | 16.82 | 183 | 23.49 | 193 | 24.78 | 630 | 80.87 | 149 | 19.13 |
| 6 මිනුවන්ගොඩ | 410 | 28 | 6.83 | 67 | 16.34 | 103 | 25.12 | 140 | 34.15 | 338 | 82.44 | 72 | 17.56 |
| 7. මීගමුව | 708 | 41 | 5.79 | 67 | 9.46 | 135 | 19.07 | 202 | 28.53 | 445 | 62.85 | 263 | 37.15 |
| 8. කැලණිය | 626 | 50 | 7.99 | 56 | 8.95 | 167 | 26.68 | 209 | 33.39 | 482 | 77.00 | 144 | 23.00 |
| 9. කළුතර | 817 | 85 | 10.40 | 106 | 12.97 | 208 | 25.46 | 213 | 26.07 | 612 | 74.91 | 205 | 25.09 |
| 10. මතුගම | 554 | 71 | 12.82 | 98 | 17.69 | 125 | 22.56 | 126 | 22.74 | 420 | 75.81 | 134 | 24.19 |
| 11. හොරණ | 597 | 74 | 12.40 | 68 | 11.39 | 143 | 23.95 | 152 | 25.46 | 437 | 73.20 | 160 | 26.80 |
| 12. මහනුවර | 1,071 | 53 | 4.95 | 82 | 7.66 | 235 | 21.94 | 378 | 35.29 | 748 | 69.84 | 323 | 30.16 |
| 13. දෙවිනුවර | 229 | 18 | 7.86 | 30 | 13.10 | 55 | 24.02 | 68 | 29.69 | 171 | 74.67 | 58 | 25.33 |
| 14. ගම්පොල | 442 | 28 | 6.33 | 42 | 9.50 | 109 | 24.66 | 166 | 37.56 | 345 | 78.05 | 97 | 21.95 |
| 15. තෙල්දෙණිය | 376 | 22 | 5.85 | 27 | 7.18 | 81 | 21.54 | 129 | 34.31 | 259 | 68.88 | 117 | 31.12 |
| 16. වත්තේගම | 290 | 13 | 4.48 | 17 | 5.86 | 44 | 15.17 | 115 | 39.66 | 189 | 65.17 | 101 | 34.83 |
| 17. කටුගස්තොට | 302 | 5 | 1.66 | 18 | 5.96 | 63 | 20.86 | 106 | 35.10 | 192 | 63.58 | 110 | 36.42 |
| 18. මාතලේ | 491 | 11 | 2.24 | 29 | 5.91 | 93 | 18.94 | 156 | 31.77 | 289 | 58.86 | 202 | 41.14 |
| 19. ගලේවෙල | 222 | 9 | 4.05 | 22 | 9.91 | 43 | 19.37 | 62 | 27.93 | 136 | 61.26 | 86 | 38.74 |
| 20. නාඋල | 56 | 0 | 0.00 | 3 | 5.36 | 16 | 28.57 | 21 | 37.50 | 40 | 71.43 | 16 | 28.57 |
| 21. විල්ගමුව | 133 | 9 | 6.77 | 15 | 11.28 | 39 | 29.32 | 55 | 41.35 | 118 | 88.72 | 15 | 11.28 |
| 22. නුවරඑළිය | 573 | 12 | 2.09 | 50 | 8.73 | 176 | 30.72 | 228 | 39.79 | 466 | 81.33 | 107 | 18.67 |
| 23. කොත්මලේ | 302 | 13 | 4.30 | 33 | 10.93 | 110 | 36.42 | 97 | 32.12 | 253 | 83.77 | 49 | 16.23 |
| 24. හැටන් | 619 | 18 | 2.91 | 64 | 10.34 | 188 | 30.37 | 234 | 37.80 | 504 | 81.42 | 115 | 18.58 |
| 25. වලපනේ | 316 | 40 | 12.66 | 50 | 15.82 | 111 | 35.13 | 74 | 23.42 | 275 | 87.03 | 41 | 12.97 |
| 26. හගුරන්කෙත | 286 | 16 | 5.59 | 22 | 7.69 | 71 | 24.83 | 103 | 36.01 | 212 | 74.13 | 74 | 25.87 |
| 27. ගාල්ල | 1,148 | 162 | 14.11 | 160 | 13.94 | 263 | 22.91 | 287 | 25.00 | 872 | 75.96 | 276 | 24.04 |
| 28. ඇල්පිටිය | 576 | 96 | 16.67 | 92 | 15.97 | 131 | 22.74 | 136 | 23.61 | 455 | 78.99 | 121 | 21.01 |
| 29. අම්බලන්ගොඩ | 577 | 95 | 16.46 | 74 | 12.82 | 101 | 17.50 | 140 | 24.26 | 410 | 71.06 | 167 | 28.94 |
| 30. උඩුගම | 436 | 55 | 12.61 | 56 | 12.84 | 95 | 21.79 | 131 | 30.05 | 337 | 77.29 | 99 | 22.71 |
| 31. මාතර | 553 | 56 | 10.13 | 87 | 15.73 | 130 | 23.51 | 149 | 26.94 | 422 | 76.31 | 131 | 23.69 |
| 32. අකුරැස්ස | 144 | 4 | 2.78 | 13 | 9.03 | 39 | 27.08 | 56 | 38.89 | 112 | 77.78 | 32 | 22.22 |
| 33. මුලටියන-හක්මණ | 294 | 31 | 10.54 | 47 | 15.99 | 62 | 21.09 | 62 | 21.09 | 202 | 68.71 | 92 | 31.29 |
| 34. මොරවක-දෙනියාය | 460 | 64 | 13.91 | 65 | 14.13 | 110 | 23.91 | 125 | 27.17 | 364 | 79.13 | 96 | 20.87 |
| 35. තංගල්ල | 429 | 42 | 9.79 | 46 | 10.72 | 93 | 21.68 | 114 | 26.57 | 295 | 68.76 | 134 | 31.24 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 36. හම්බන්තොට | 781 | 85 | 10.88 | 104 | 13.32 | 188 | 24.07 | 215 | 27.53 | 592 | 75.80 | 189 | 24.20 |
| 37. වලස්මුල්ල | 413 | 21 | 5.08 | 33 | 7.99 | 103 | 24.94 | 113 | 27.36 | 270 | 65.38 | 143 | 34.62 |
| 38. යාපනය | 238 | 10 | 4.20 | 15 | 6.30 | 52 | 21.85 | 77 | 32.35 | 154 | 64.71 | 84 | 35.29 |
| 39. දූපත් | 91 | 0 | 0.00 | 9 | 9.89 | 24 | 26.37 | 32 | 35.16 | 65 | 71.43 | 26 | 28.57 |
| 40. තෙන්මාරච්චි | 54 | 0 | 0.00 | 2 | 3.70 | 7 | 12.96 | 24 | 44.44 | 33 | 61.11 | 21 | 38.89 |
| 41. වලිකාමම් | 319 | 9 | 2.82 | 39 | 12.23 | 66 | 20.69 | 100 | 31.35 | 214 | 67.08 | 105 | 32.92 |
| 42. වඩමාරච්චි | 82 | 2 | 2.44 | 6 | 7.32 | 8 | 9.76 | 32 | 39.02 | 48 | 58.54 | 34 | 41.46 |
| 43. කිලිනොච්චි දකුණ | 39 | 0 | 0.00 | 2 | 5.13 | 6 | 15.38 | 11 | 28.21 | 19 | 48.72 | 20 | 51.28 |
| 44. කිලිනොච්චි උතුර | 36 | 0 | 0.00 | 8 | 22.22 | 6 | 16.67 | 6 | 16.67 | 20 | 55.56 | 16 | 44.44 |
| 45. මන්නාරම | 145 | 2 | 1.38 | 14 | 9.66 | 42 | 28.97 | 54 | 37.24 | 112 | 77.24 | 33 | 22.76 |
| 46. මඩු | 16 | 0 | 0.00 | 2 | 12.50 | 2 | 12.50 | 8 | 50.00 | 12 | 75.00 | 4 | 25.00 |
| 47. වව්නියාව දකුණ | 233 | 18 | 7.73 | 19 | 8.15 | 60 | 25.75 | 54 | 23.18 | 151 | 64.81 | 82 | 35.19 |
| 48. වව්නියාව උතුර | 25 | 0 | 0.00 | 3 | 12.00 | 2 | 8.00 | 8 | 32.00 | 13 | 52.00 | 12 | 48.00 |
| 49. මුලතිව් | 37 | 0 | 0.00 | 2 | 5.41 | 9 | 24.32 | 17 | 45.95 | 28 | 75.68 | 9 | 24.32 |
| 50. තුනුක්කායි | 11 | 0 | 0.00 | 0 | 0.00 | 2 | 18.18 | 4 | 36.36 | 6 | 54.55 | 5 | 45.45 |
| 51. මඩකලපුව | 355 | 9 | 2.54 | 25 | 7.04 | 77 | 21.69 | 116 | 32.68 | 227 | 63.94 | 128 | 36.06 |
| 52. කල්කුඩා | 176 | 5 | 2.84 | 11 | 6.25 | 25 | 14.20 | 84 | 47.73 | 125 | 71.02 | 51 | 28.98 |
| 53. පදිරිප්පු | 155 | 2 | 1.29 | 12 | 7.74 | 32 | 20.65 | 60 | 38.71 | 106 | 68.39 | 49 | 31.61 |
| 54. මඩකලපුව මධ්‍යම | 337 | 23 | 6.82 | 38 | 11.28 | 79 | 23.44 | 99 | 29.38 | 239 | 70.92 | 98 | 29.08 |
| 55. මඩකලපුව බටහිර | 135 | 4 | 2.96 | 8 | 5.93 | 24 | 17.78 | 49 | 36.30 | 85 | 62.96 | 50 | 37.04 |
| 56. අම්පාර | 352 | 28 | 7.95 | 52 | 14.77 | 89 | 25.28 | 106 | 30.11 | 275 | 78.13 | 77 | 21.88 |
| 57. කල්මුණේ | 419 | 15 | 3.58 | 37 | 8.83 | 97 | 23.15 | 145 | 34.61 | 294 | 70.17 | 125 | 29.83 |
| 58. සමන්තුරෙයි | 196 | 2 | 1.02 | 24 | 12.24 | 36 | 18.37 | 56 | 28.57 | 118 | 60.20 | 78 | 39.80 |
| 59. මහඔය | 127 | 16 | 12.60 | 19 | 14.96 | 32 | 25.20 | 43 | 33.86 | 110 | 86.61 | 17 | 13.39 |
| 60. දෙහිඅත්තකණ්ඩිය | 219 | 15 | 6.85 | 34 | 15.53 | 60 | 27.40 | 54 | 24.66 | 163 | 74.43 | 56 | 25.57 |
| 61. අක්කරෙයිපත්තුව | 148 | 9 | 6.08 | 25 | 16.89 | 31 | 20.95 | 48 | 32.43 | 113 | 76.35 | 35 | 23.65 |
| 62. තිරුක්කෝවිල් | 211 | 4 | 1.90 | 13 | 6.16 | 43 | 20.38 | 73 | 34.60 | 133 | 63.03 | 78 | 36.97 |
| 63. ත්‍රිකුණාමලය | 75 | 3 | 4.00 | 8 | 10.67 | 20 | 26.67 | 27 | 36.00 | 58 | 77.33 | 17 | 22.67 |
| 64. මුතූර් | 212 | 27 | 12.74 | 42 | 19.81 | 70 | 33.02 | 52 | 24.53 | 191 | 90.09 | 21 | 9.91 |
| 65. කන්තලේ | 183 | 10 | 5.46 | 12 | 6.56 | 40 | 21.86 | 62 | 33.88 | 124 | 67.76 | 59 | 32.24 |
| 66. කින්නියා | 62 | 3 | 4.84 | 11 | 17.74 | 23 | 37.10 | 14 | 22.58 | 51 | 82.26 | 11 | 17.74 |
| 67. ත්‍රිකුණාමලය උතුර | 45 | 4 | 8.89 | 6 | 13.33 | 7 | 15.56 | 15 | 33.33 | 32 | 71.11 | 13 | 28.89 |
| 68. කුරුණෑගල | 716 | 66 | 9.22 | 91 | 12.71 | 173 | 24.16 | 230 | 32.12 | 560 | 78.21 | 156 | 21.79 |
| 69. කුලියාපිටිය | 621 | 52 | 8.37 | 107 | 17.23 | 167 | 26.89 | 161 | 25.93 | 487 | 78.42 | 134 | 21.58 |
| 70. නිකවැරටිය | 553 | 53 | 9.58 | 80 | 14.47 | 159 | 28.75 | 155 | 28.03 | 447 | 80.83 | 106 | 19.17 |
| 71. මහව | 736 | 69 | 9.38 | 108 | 14.67 | 189 | 25.68 | 225 | 30.57 | 591 | 80.30 | 145 | 19.70 |
| 72. ගිරිඋල්ල | 457 | 35 | 7.66 | 44 | 9.63 | 110 | 24.07 | 133 | 29.10 | 322 | 70.46 | 135 | 29.54 |
| 73. ඉබ්බාගමුව | 282 | 22 | 7.80 | 47 | 16.67 | 72 | 25.53 | 97 | 34.40 | 238 | 84.40 | 44 | 15.60 |
| 74. පුත්තලම | 957 | 99 | 10.34 | 131 | 13.69 | 257 | 26.85 | 292 | 30.51 | 779 | 81.40 | 178 | 18.60 |
| 75. හලාවත | 753 | 71 | 9.43 | 88 | 11.69 | 177 | 23.51 | 234 | 31.08 | 570 | 75.70 | 183 | 24.30 |

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 76. අනුරාධපුරය | 570 | 102 | 17.89 | 69 | 12.11 | 147 | 25.79 | 147 | 25.79 | 465 | 81.58 | 105 | 18.42 |
| 77. තඹුත්තේගම | 189 | 14 | 7.41 | 16 | 8.47 | 53 | 28.04 | 59 | 31.22 | 142 | 75.13 | 47 | 24.87 |
| 78. කැකිරාව | 350 | 49 | 14.00 | 50 | 14.29 | 61 | 17.43 | 111 | 31.71 | 271 | 77.43 | 79 | 22.57 |
| 79. ගලෙන්බිදුණුවැව | 337 | 38 | 11.28 | 50 | 14.84 | 84 | 24.93 | 89 | 26.41 | 261 | 77.45 | 76 | 22.55 |
| 80. කැබිතිගොල්ලෑව | 288 | 25 | 8.68 | 34 | 11.81 | 61 | 21.18 | 90 | 31.25 | 210 | 72.92 | 78 | 27.08 |
| 81. පොළොන්නරුව | 264 | 29 | 10.98 | 36 | 13.64 | 86 | 32.58 | 62 | 23.48 | 213 | 80.68 | 51 | 19.32 |
| 82. හිගුරක්ගොඩ | 299 | 34 | 11.37 | 44 | 14.72 | 63 | 21.07 | 94 | 31.44 | 235 | 78.60 | 64 | 21.40 |
| 83. දිඹුලාගල | 235 | 21 | 8.94 | 38 | 16.17 | 73 | 31.06 | 64 | 27.23 | 196 | 83.40 | 39 | 16.60 |
| 84. බදුල්ල | 557 | 38 | 6.82 | 98 | 17.59 | 174 | 31.24 | 176 | 31.60 | 486 | 87.25 | 71 | 12.75 |
| 85. බණ්ඩාරවෙල | 569 | 56 | 9.84 | 79 | 13.88 | 180 | 31.63 | 176 | 30.93 | 491 | 86.29 | 78 | 13.71 |
| 86. මහියංගණය | 337 | 18 | 5.34 | 33 | 9.79 | 69 | 20.47 | 113 | 33.53 | 233 | 69.14 | 104 | 30.86 |
| 87. වැලිමඩ | 515 | 42 | 8.16 | 68 | 13.20 | 146 | 28.35 | 158 | 30.68 | 414 | 80.39 | 101 | 19.61 |
| 88. පස්සර | 263 | 10 | 3.80 | 31 | 11.79 | 87 | 33.08 | 90 | 34.22 | 218 | 82.89 | 45 | 17.11 |
| 89. වියලුව | 146 | 9 | 6.16 | 15 | 10.27 | 47 | 32.19 | 52 | 35.62 | 123 | 84.25 | 23 | 15.75 |
| 90. මොනරාගල | 333 | 35 | 10.51 | 41 | 12.31 | 88 | 26.43 | 111 | 33.33 | 275 | 82.58 | 58 | 17.42 |
| 91. වැල්ලවාය | 207 | 22 | 10.63 | 30 | 14.49 | 52 | 25.12 | 58 | 28.02 | 162 | 78.26 | 45 | 21.74 |
| 92. බිබිල | 348 | 34 | 9.77 | 59 | 16.95 | 102 | 29.31 | 101 | 29.02 | 296 | 85.06 | 52 | 14.94 |
| 93. තණමල්විල | 266 | 18 | 6.77 | 48 | 18.05 | 63 | 23.68 | 67 | 25.19 | 196 | 73.68 | 70 | 26.32 |
| 94. රත්නපුර | 822 | 77 | 9.37 | 106 | 12.90 | 205 | 24.94 | 261 | 31.75 | 649 | 78.95 | 173 | 21.05 |
| 95. බලන්ගොඩ | 354 | 23 | 6.50 | 61 | 17.23 | 94 | 26.55 | 96 | 27.12 | 274 | 77.40 | 80 | 22.60 |
| 96. නිවිතිගල | 400 | 40 | 10.00 | 51 | 12.75 | 99 | 24.75 | 123 | 30.75 | 313 | 78.25 | 87 | 21.75 |
| 97. ඇඹිලිපිටිය | 802 | 95 | 11.85 | 119 | 14.84 | 202 | 25.19 | 198 | 24.69 | 614 | 76.56 | 188 | 23.44 |
| 98. කෑගල්ල | 383 | 35 | 9.14 | 47 | 12.27 | 118 | 30.81 | 116 | 30.29 | 316 | 82.51 | 67 | 17.49 |
| 99. මාවනැල්ල | 360 | 18 | 5.00 | 26 | 7.22 | 83 | 23.06 | 108 | 30.00 | 235 | 65.28 | 125 | 34.72 |
| 100. දෙහිඕවිට | 430 | 19 | 4.42 | 48 | 11.16 | 133 | 30.93 | 150 | 34.88 | 350 | 81.40 | 80 | 18.60 |
| සමස්ත දිවයින | 38,075 | 3,302 | 8.67 | 4,667 | 12.26 | 9,323 | 24.49 | 11,454 | 30.08 | 28,746 | 75.50 | 9,329 | 24.50 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

අධ්‍යාපන කලාප 100 අතුරින් දිවයිනේ සමත් ප්‍රතිශතය වන 75.50% ඉක්මවා ඇති අධ්‍යාපන කලාප සංඛ්‍යාව 53 වේ. මෙම විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් අතුරින් වැඩිම A සාමාර්ථ්‍යය ප්‍රතිශතයක් ලබාගෙන ඇත්තේ අනුරාධපුරය (17.89%), ඇල්පිටිය (16.67%) හා අම්බලන්ගොඩ (16.46%) අධ්‍යාපන කලාපවලය. මූතූර් (90.09%) හා විල්ගමුව (88.72%) යන අධ්‍යාපන කලාපවල දේශපාලන විද්‍යා විෂය සමත් සමස්ත අපේක්ෂක ප්‍රතිශතය ඉහළ අගයකි. අසමත් අපේක්ෂක ප්‍රතිශතය සැලකූ විට කිලිනොච්චි දකුණ (51.28%), වව්නියාව උතුර (48.00%) හා තුනුක්කායි (45.45%)යන අධ්‍යාපන කලාපවල අසමත් ප්‍රතිශතය ඉහළ අගයකි.

## 1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය

### වගුව 1.5

**පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබාගෙන ඇති ආකාරය**

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 42 | 0.09 | 45,218 | 100.00 |
| 81 - 90 | 1293 | 2.86 | 45,176 | 99.91 |
| 71 - 80 | 4025 | 8.90 | 43,883 | 97.05 |
| 61 - 70 | 5352 | 11.84 | 39,858 | 88.15 |
| 51 - 60 | 6171 | 13.65 | 34,506 | 76.31 |
| 41 - 50 | 7065 | 15.62 | 28,335 | 62.66 |
| 31 - 40 | 7579 | 16.76 | 21,270 | 47.04 |
| 21 - 30 | 7650 | 16.92 | 13,691 | 30.28 |
| 11 - 20 | 5211 | 11.52 | 6,041 | 13.36 |
| 00 - 10 | 830 | 1.84 | 842 | 1.87 |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී.ලං.වි.දෙ.

පන්ති ප්‍රාන්තර විශ්ලේෂණය කිරීමේදී පෙනී යන විශේෂ කරුණක් වන්නේ අඩු සාධන මට්ටමක් සහිත එනම් ලකුණු 40ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 47.04%ක් තරම් ඉහළ අගයක් බවයි. ලකුණු 51ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 37.34%කි. ඉහළම පන්ති ප්‍රාන්තරය තුළ එනම් 91-100 අතර ලකුණු ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 0.09%කි. ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් අපේක්ෂක ප්‍රතිශතය 1.84%කි. ලකුණු 0 ලබාගත් අපේක්ෂකයන් සංඛ්‍යාව 12කි.

# II කොටස

## 2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

### 2.1 දේශපාලන විද්‍යාව I පත්‍රයේ ව්‍යුහය

I පත්‍රය - කාලය පැය 02යි

**A** කොටස
වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 30කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

**B** කොටස
කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.
එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.
I පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

මූලාශ්‍රය : අ.පො.ස (උ.පෙළ) විභාගය වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග ප්‍රශ්න සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.2 දේශපාලන විද්‍යාව I පත්‍රය

### A කොටස

- අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය යන්නෙන් අදහස් වන්නේ,
(1) රාජ්‍ය බලය හා සම්බන්ධ ක්‍රියාවලියකි.
(2) ආණ්ඩුව ඇතුළත සිදුවන ක්‍රියාකාරකම් ය.
(3) දේශපාලනඥයන් සිය බලය තහවුරු කර ගැනීමට යොදා ගන්නා යාන්ත්‍රණයකි.
(4) ජාත්‍යන්තර පද්ධතිය තුළ රාජ්‍යවල හැසිරීම විස්තර කෙරෙන සංකල්පයකි.
(5) රාජ්‍යය, එහි ආයතන සහ සමාජය අතර අන්තර් ක්‍රියාකාරකම් සිදුවන ක්ෂේත්‍රයයි. (……)

**2.** දේශපාලනය අධ්‍යයනය කිරීම
(1) දාර්ශනික සහ තුලනාත්මක ප්‍රවේශවලට සීමා වේ.
(2) ආනුභවික අධ්‍යයන ප්‍රතික්ෂේප කරයි.
(3) ගුණාත්මක දත්තවලට අඩු වැදගත්කමක් දෙයි.
(4) ප්‍රායෝගික දේශපාලනයේ නිරතවීමෙන් වෙනස් ය.
(5) ප්‍රතිමානීය මූලධර්ම ප්‍රතික්ෂේප කරයි. (……)

**3.** දේශපාලන මතවාදයක්
(1) එකිනෙකට පටහැනි අදහස්වලින් සමන්විත වේ.
(2) සමාජයේ දේශපාලන විඥානය හැඩගස්වයි.
(3) පුරවැසියන්ගේ දේශපාලන චර්යාවට බලපෑම් කිරීමෙන් වැළකී සිටී.
(4) ආගමික කණ්ඩායම්වල පක්ෂපාතිත්වය සෑම විට ම අපේක්ෂා කරයි.
(5) සෑම විටම පවත්නා ක්‍රමයට විරුද්ධව යයි. (……)

**4.** රාජ්‍යය,
(1) සමාජයේ නිර්මාණයක් නොවේ.
(2) ආණ්ඩුවේ ප්‍රධාන අංගයකි.
(3) දේශපාලන ප්‍රජාවක ස්වාධිපත්‍යය මූර්තිමත් කරයි.
(4) ආණ්ඩුව යන්නට සමාන පදයකි.
(5) අභ්‍යන්තර ස්වාධිපත්‍යයට පමණක් හිමිකම් කියයි. (……)

**5.** ස්වාධිපත්‍යය
(1) සමාජයේ සෑම සංවිධානයකටම හිමිවන බලයකි.
(2) යන්නෙන් අදහස් වන්නේ රාජ්‍යයට එහි භෞමික දේශසීමා ඇතුළත හිමිවන උත්තරීතර අධිකාර බලයයි.
(3) රාජ්‍යයකට අනෙකුත් රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට ඉඩ ලබා දෙයි.
(4) සෑම විටම අභේද්‍යය (බෙදිය නොහැකි) ය.
(5) සන්ධීය රාජ්‍යවල මධ්‍යගතව පවතියි. (……)

**6.** පුද්ගලික නිදහස පිළිබඳ ලිබරල්වාදී න්‍යාය උපකල්පනය කරන පරිදි,
(1) සමාජය සමන්විත වන්නේ සමාජ පංතිවලිනි.
(2) නිදහස සමාජයේ සෑම පුද්ගලයකුටම හිමිවිය යුතු නැත.
(3) පන්ති අරගලය තුළින් පුද්ගල නිදහස සාක්ෂාත් කරගත හැකි ය.
(4) ආණ්ඩුව පුද්ගලයන්ට නිදහස භුක්ති විඳීමට සුදුසු පරිසරයක් නිර්මාණය නොකළ යුතු ය.
(5) පුද්ගල නිදහස සුරක්ෂිත කිරීම සඳහා නීතියේ ආධිපත්‍යය අත්‍යවශ්‍ය වේ. (……)

**7.** දේශපාලන දෘෂ්ටිවාදයක් වශයෙන් ෆැසිස්ට්වාදය
(1) විසිවන ශතවර්ෂයේ තෙවන සහ සිව්වන දශකවල දී වර්ධනය විය.
(2) නැපෝලියන් බොනපාට් යටතේ ප්‍රංශය තුළ වර්ධනය විය.
(3) ආගමික නිදහස අවධාරණය කෙළේ ය.
(4) ලිබරල්වාදයේ ආභාසය ලැබී ය.
(5) ලෝක සාමය වෙනුවෙන් පෙනී සිටියේ ය. (……)

**8.** ගැටුම් පිළිබඳ කෘත්‍යවාදී වර්ගීකරණයට නිදසුනක් වන්නේ,
(1) රාජ්‍ය නිර්මාණ ගැටුම් ය.
(2) සාධනීය ගැටුම් ය.
(3) අන්තර් පුද්ගල ගැටුම් ය.
(4) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් ය.
(5) ජාතීන් අතර ගැටුම් ය. (……)

**9.** සංවරණ සහ තුලන මූලධර්මයේ අරමුණු පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම ය.
(2) කැබිනට් මණ්ඩලයේ බලය ශක්තිමත් කිරීම ය.
(3) පුරවැසි දේශපාලන සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම ය.
(4) ආණ්ඩුව වෙත මහජන සහයෝගය සහතික කිරීම ය.
(5) ආණ්ඩුව බලය අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම ය. (……)

**10.** දේශපාලනය අධ්‍යයනය කිරීමේ දේශපාලන අර්ථශාස්ත්‍රීය ප්‍රවේශය
(1) ආරම්භ වූයේ ස්ත්‍රීවාදී ප්‍රවේශයට විකල්පයක් ලෙස ය.
(2) සමාජයේ පවතින බල ව්‍යූහයන් සාධාරණය කරයි.
(3) දේශපාලනයේ ආර්ථික, සමාජ සහ පන්ති පදනම්වල වැදගත්කම අවධාරණය කරයි.
(4) සමාජ සහ දේශපාලන බලය පිළිබඳ රැඩිකල් විවේචනයක් ඉදිරිපත් කිරීමට අසමත් වෙයි.
(5) ලිබරල් දේශපාලන දර්ශනවාදය සමඟ සැසඳේ. (……)

**11.** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දී
(1) අග්‍රාමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකිව යුතු නැත.
(2) කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම අත්‍යවශ්‍ය ලක්ෂණයක් නොවේ.
(3) කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වන්නේ රාජ්‍ය නායකයා ය.
(4) පාර්ලිමේන්තුවට පිටතින් කැබිනට් අමාත්‍යවරුන් තෝරාපත් කරගැනීමට අග්‍රාමාත්‍යවරයාට හැකි වේ.
(5) ආණ්ඩුව පාර්ලිමේන්තු බහුතරයේ සහයෝගය මත රඳා පවතියි. (……)

**12.** සන්ධීය ක්‍රමයකදී
(1) මධ්‍යම ආණ්ඩුව ප්‍රාන්ත ආණ්ඩුවලට වඩා දුර්වල ය.
(2) විවිධත්වය සහ ජාතික සමගිය ප්‍රවර්ධනය නොවේ.
(3) සන්ධීය රාජ්‍ය සංගමයෙන් ඒකපාර්ශ්වීය ලෙස ඉවත් වීමට ප්‍රාන්ත ආණ්ඩුවලට හැකි ය.
(4) ආණ්ඩුව තල දෙකකින් සමන්විත ය.
(5) ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික ය. (……)

**13.** ජාත්‍යන්තර දේශපාලන අධ්‍යයනය
(1) ආර්ථික රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතාවලට සීමා වෙයි.
(2) රාජ්‍යය සහ එහි පුරවැසියන් අතර සම්බන්ධතා අවධාරණය කරයි.
(3) ජාතික-රාජ්‍යයන් අතර අන්තර්-සම්බන්ධතා කෙරෙහි අවධානය යොමු කරයි.
(4) ස්වෛරී ජාතීන් අතර සිදුවන දේශපාලනය නොසලකා හරියි.
(5) රාජ්‍යයන් ඇතුළත ආයතනික ව්‍යූහ ක්‍රියාත්මක වන්නේ කෙසේදැයි සැලකිලිමත් වෙයි. (……)

**14.** ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය ක්‍රියාධරයන්ට අයත් වන්නේ,
(1) ජාතික-රාජ්‍යයන් ය.
(2) ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ය.
(3) බහුජාතික සමාගම් ය.
(4) කීර්තිමත් පුද්ගලයන් ය.
(5) ජාත්‍යන්තර මූල්‍ය ආයතන ය. (……)

**15.** ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සිවිල් සමාජ සංවිධාන
(1) ආණ්ඩුවේ ආයතන සමඟ තරඟ කරති.
(2) සතුව තිබෙන්නේ ප්‍රතිපත්ති විශ්ලේෂණයට සීමා වූ න්‍යායපත්‍රයකි.
(3) ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා පෙනී සිටින්නේ නැත.
(4) සමාජීය වශයෙන් බැහැර කරන ලද කණ්ඩායම්වල ද අභිලාෂ ප්‍රවර්ධනය කරති.
(5) සැම විටම දේශපාලන බලපෑම්වලින් නිදහස් ය. (……)

**16.** දේශපාලන මතවාදයක් ලෙස සමූහාණ්ඩුවාදය
(1) විකාශනය වූයේ රාජාණ්ඩුවාදයට එරෙහිව ය.
(2) නිදහස සුරක්ෂිත කරගැනීමට පුරවැසියන් උනන්දු නොවිය යුතු ය යන අදහස දරයි.
(3) පුරවැසියන්ගේ දේශපාලන අකර්මණ්‍යත්වය අවධාරණය කරයි.
(4) ජනතා පරමාධිපත්‍ය සංකල්පය පිළිබඳ සැක පහළ කරයි.
(5) රාජ්‍ය නායකයා ජනතාවට වගකිවයුතු නැත යන මූලධර්මය හඳුන්වා දී ඇත. (……)

**17.** පහත සඳහන් ජාත්‍යන්තර සංවිධාන අතුරෙන් යුද්ධමය න්‍යාය පත්‍රයක් තිබෙන්නේ,
(1) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට ය.
(2) සාර්ක් සංවිධානයට ය.
(3) ආසියාන් සංවිධානයට ය.
(4) නේටෝ සංවිධානයට ය.
(5) පොදු රාජ්‍ය මණ්ඩලයට ය. (……)

**18.** නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය
(1) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය තුළින් පරිණාමය වී ඇත.
(2) ඍජු ප්‍රජාතන්ත්‍රවාදයට සමාන වූ ලක්ෂණවලින් සමන්විත ය.
(3) ඒකතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් වේ.
(4) එක් පුද්ගලයෙකුට එක් ඡන්දයක් යන අදහසට පටහැණි වේ.
(5) ජනමත විචාරණයට ආදේශකයකි. (……)

**19.** ශ්‍රී ලංකාවේ මෑතකාලීන විදේශ ප්‍රතිපත්තිය
(1) සමාජවාදී දිශානතියකට යොමු වී ඇත.
(2) ආර්ථික රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා අවධාරණය කර ඇත.
(3) ජාත්‍යන්තර ආර්ථික බලතුලනයේ වෙනස්වීම්වලට ප්‍රතිචාර දක්වා නොමැත.
(4) අරාබි රාජ්‍යයන් නොසලකා හැර ඇත.
(5) ගෝලීය ප්‍රවණතාවලින් හුදෙකලා වී තිබේ. (……)

**20.** බලපෑම් කණ්ඩායම්
(1) සෞඛ්‍ය සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදයක සළකුණකි.
(2) සිය අයිතීන් දිනා ගැනීමට කම්කරු පංතිය මෙහෙයවති.
(3) සමාජවාදී රටවල් තුළ බලපෑම් සහගත කාර්යභාරයක් ඉටු කර ඇත.
(4) මැතිවරණවලට තරඟ කිරීම සඳහා දේශපාලන පක්ෂ සමඟ සන්ධානගත වෙති.
(5) ආණ්ඩුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට බලපෑම් කිරීමෙන් වැළකී සිටිති. (……)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** ශ්‍රී ලංකාවේ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
A - කැබිනට් ආණ්ඩු ක්‍රමයක් නිර්මාණය කෙළේ ය.
B - රාජ්‍ය සේවය කැබිනට් මණ්ඩලය යටතට පත් කෙළේ ය.
C - ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත කෙළේ ය.
D - ජනාධිපතිවරයා පත් කිරීමේ බලය අග්‍රාමාත්‍යවරයාට ලබා දුන්නේ ය.
E - නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කෙළේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**22.** වර්තමානයේ ක්‍රියාත්මක වන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම මාදිලිය
A - සම්ප්‍රදායන් සහ චාරිත්‍ර ව්‍යවස්ථාවේ අංග ලෙස සලකයි.
B - පාර්ලිමේන්තු පරමාධිපත්‍යය සහ සාමූහික වගකීම යන සංකල්පවලින් මඟපෙන්වනු ලබයි.
C - ජාතික ව්‍යවස්ථාදායකය තුළ බලය කේන්ද්‍රගත වීමට ඉඩ සලසයි.
D - බහු පක්ෂ ක්‍රමයක් මත ගොඩනැගී ඇත.
E - අසමමිතික බලය බෙදා ගැනීමේ ක්‍රමයක් නිර්මාණය කර ඇත.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**23.** නව ලිබරල් රාජ්‍ය මාදිලිය අවධාරණය කරන්නේ,
A - රාජ්‍යය සමාජ සුභසාධනයට කැප විය යුතු බවයි.
B - අවම රාජ්‍යය පිළිබඳ සංකල්පයයි.
C - ආර්ථික සහ සමාජ සංවර්ධනයේ දී වෙළෙඳපොළ බලවේගවල කේන්ද්‍රීය වැදගත්කමයි.
D - රාජ්‍ය නිර්බාධවාදී ප්‍රතිපත්ති යළි හඳුන්වා දීමේ අවශ්‍යතාවයි.
E - ජාතික ආර්ථිකයන්, ගෝලීය ආර්ථිකය සමඟ බද්ධ විය යුතු බවයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**24.** ප්‍රංශයේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය යටතේ,
A - ආණ්ඩුක්‍රමය ඒකීය සහ මධ්‍යගත වේ.
B - වෙස්ට්මින්ස්ටර් මාදිලිය සමඟ සැසඳීමේ දී අග්‍රාමාත්‍යවරයාගේ බලය සීමා සහිත වේ.
C - ජනාධිපතිවරයා ඡන්ද විද්‍යාලයකින් තෝරා පත්කර ගැනේ.
D - පරිපාලන විමධ්‍යගතකරණය ප්‍රාදේශීය ආණ්ඩුකරණයේ මූලික ලක්ෂණයකි.
E - අමාත්‍යවරු ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෝ නොවෙති.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

**25.** දේශපාලන න්‍යායාට අනුව පුරවැසිභාවය
A - පුද්ගලයන්ට නෛතික තත්ත්වයකට වඩා වැඩි දෙයක් ලබා දෙයි.
B - පුද්ගලයන්ට රාජ්‍යයේ කටයුතුවලට සහභාගි වීමට හැකියාව ලබා දෙයි.
C - දේශපාලන ප්‍රජාවේ සාමාජිකයන් රාජ්‍යයට පක්ෂපාත වීම අපේක්ෂා කරයි.
D - රටකට ඇතුල් වනවිට පුද්ගලයන්ට ලැබෙන වරප්‍රසාදයකි.
E - පුද්ගලයන්ට සමාජ සහ දේශපාලන අයිතිවාසිකම් සඳහා හිමිකම් කීමට හැකිකම ලබා දෙයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (……)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔම්බුඩ්ස්මන්වරයාට පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට බලය පවරා තිබේ. | නිල ධුර කාලය තුළ දී ඔම්බුඩ්ස්මන්වරයාගේ වැටුප් අඩු කිරීමට පාර්ලිමේන්තුවට බලය තිබේ. | (……) |
| **27.** | 1978 ආරම්භක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තුව තුළ නියෝජනය ලබා ගැනීම සඳහා ලබා ගතයුතු ඡන්ද ප්‍රතිශතය 5% කි. | සමානුපාතික නියෝජන ක්‍රමය සාමාන්‍යයෙන් කුඩා පක්ෂවලට සහ සුළු ජනවාර්ගික පක්ෂවලට නියෝජනය ලබා ගැනීමේ වාසිය අත්කර දෙයි. | (……) |
| **28.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභාවලට සාමාජිකයන් පත් කිරීමට ජනාධිපතිවරයාට තිබූ අභිමතානුසාරී බලය අඩු කෙරිණි. | 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාට සෑම තුන් මසකට වරක් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට සහභාගී වීමට විධිවිධාන සැලැස්විණි. | (……) |
| **29.** | 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලයක් පිහිටු වූයේ නැත. | ජනතාව විසින් තෝරා පත්කර නොගන්නා සාමාජිකයන්ගෙන් සමන්විත සභාවක් පාර්ලිමේන්තුවෙහි තිබිය යුතු නැතැයි පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සම්පාදකයෝ විශ්වාස කළ හ. | (……) |
| **30.** | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කථානායකවරයාට පාර්ලිමේන්තුව කැඳවීමට සහ වාර අවසාන කිරීමට බලය ඇත. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ ගණපූරණය වන්නේ මන්ත්‍රීන් 40 දෙනෙකි. | (……) |

## 2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය

**වගුව 2.1**

ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 5 | 16. | 1 |
| 02. | 4 | 17. | 4 |
| 03. | 2 | 18. | 1 |
| 04. | 3 | 19. | 2 |
| 05. | 2 | 20. | 1 |
| 06. | 5 | 21. | 3 |
| 07. | 1 | 22. | 3 |
| 08. | 2 | 23. | 5 |
| 09. | 5 | 24. | 3 |
| 10. | 3 | 25. | 2 |
| 11. | 5 | 26. | 2 |
| 12. | 4 | 27. | 3 |
| 13. | 3 | 28. | 1 |
| 14. | 1 | 29. | 5 |
| 15. | 4 | 30. | 4 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

මූලාශ්‍රය : අ. පො. ස (උ.පෙළ) දේශපාලන විද්‍යාව ලකුණු දීමේ පටිපාටිය 2020, ශ්‍රී. ලං. වි. දෙ.

## B කොටස

**31.** පහත සඳහන් ලක්ෂණ මත පදනම් වන ආණ්ඩුක්‍රම මාදිලි **දෙක** මොනවා ද?

(1) රාජ්‍ය බලය කේන්ද්‍රගතව පැවතීම

ඒකීය මාදිලිය

(2) රාජ්‍ය බලය බෙදා ගැනීම

සන්ධීය/ ෆෙඩරල් මාදිලිය

**32.** 1978 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපති ක්‍රමය නිර්මාණය කිරීමේ දී ආදර්ශයට ගන්නා ලද රටවල් **දෙක** මොනවාද?

(i) ප්‍රංශය

(ii) ඇමෙරිකාව/ ඇමරිකා එක්සත් ජනපදය

**33.** ගැටුම් සමථනය දීර්ඝ සහ දුෂ්කර ක්‍රියාවලියකි. එහෙත් ගැටුම් සම්බන්ධයෙන් ගත හැකි වෙනත් සාධනීය ක්‍රියා මාර්ග තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(i) ගැටුම් ගැන කල්තබා අනතුරු ඇඟවීම
(ii) ගැටුම් වැලැක්වීම
(iii) ගැටුම් කළමනාකරණය
(iv) ගැටුම් පරිවර්තනය
(v) පශ්චාත් ගැටුම් - සාමය ගොඩනැඟීම
(vi) ගැටුම් සමථනය

**34.** (1) දේශපාලනය සහ ආගම එකිනෙකින් වෙන් කළ යුතුයැයි කියා සිටින දේශපාලන මතවාදය කුමක්ද?

නිරාගමික වාදය/ අනාගමිකවාදය
ලෝකායතවාදය / ලෞකිකවාදය

(2) පීතෘමූලික බලය විවේචනය කරන දේශපාලන න්‍යාය කුමක්ද?

ස්ත්‍රීවාදය

**35.** (1) ශ්‍රී ලංකාවේ පසුකාලීනව මධ්‍යගත රාජ්‍යයකට පදනම දැමූ, යටත්විජිත යුගයේ දී හඳුන්වාදෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක්ද?

(i) කෝල්බෲක්-කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය/ 1833

(ii) 1910/1912 / කෲව්-මැකලම් ආණ්ඩුක්‍රමය,/මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

**36.** පහත සඳහන් දේශපාලන චින්තකයන් දෙදෙනා සමඟ හඳුනා ගැනෙන දේශපාලන සංකල්ප **දෙක** නම් කරන්න.

(1) මොන්ටෙස්කියු : බලතල බෙදීම/ බලතල වෙන් කිරීම/ බලතල පංගු කිරීම
(2) ජෝන් ඔස්ටින් : ස්වාධිපත්‍යය/ පරමාධිපත්‍ය/ නීතිය

**37. පහත සඳහන් එක් එක් න්‍යාය ඉදිරිපත් කළ දේශපාලන න්‍යායවේදියා නම් කරන්න.**

**(1) සමාජ පුරවැසිභාවය** ටී.එච්. මාර්ෂල්/ මාෂල්

**(2) පශ්චාත්-යටත් විජිත රාජ්‍යය** හම්සා අලාවි/ අලාවි

**38. 'දේශපාලනය හැදෑරීම' යන්නෙහි අර්ථ දෙකක් තිබේ. ඒ දෙක මොනවාද?**

(i) දේශපාලනය ව්‍යහාරික ඥානයක් ලෙස ලබන අවබෝධය සහ සවිඥානකත්වය.
එදිනෙදා දැනුම අනුව/ ව්‍යවහාරික ඥානය අනුව/අවිධිමත්ව/ ප්‍රායෝගිකව

(ii) දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම.
විධිමත්ම/ ශාස්ත්‍රීය ලෙස/ විද්‍යාත්මකව හැදෑරීම

**39. දේශපාලන පක්ෂ ක්‍රම පස් ආකාරයකට වර්ගීකරණය කොට තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

(i) ඒක පක්ෂ/ තනි පක්ෂ/ කේවල පක්ෂ
(ii) ද්වි පක්ෂ ක්‍රමය
(iii) අධිපති තනි පක්ෂ ක්‍රමය
(iv) අධිපති ද්වි පක්ෂ ක්‍රමය
(v) බහු පක්ෂ ක්‍රමය

**40. (1) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය හැඳින්විය හැකි සංකල්පයක් නම් කරන්න.**

අධිපති ද්විපක්ෂ ක්‍රමය/ අධිපති ද්විපක්ෂ ක්‍රමයන් සහිත බහු පක්ෂ ක්‍රමය

(2) 1956 දී ශ්‍රී ලංකාවේ ආණ්ඩුව පිහිටු වූ දේශපාලන පක්ෂ සන්ධානයේ නම කුමක් ද?

මහජන එක්සත් පෙරමුණ/ MEP

**41. ස්ත්‍රීවාදී මතවාදයේ සහ ව්‍යාපාරයේ සම්ප්‍රදාය/ධාරා දෙකක් නම් කරන්න.**

(i) ලිබරල් ස්ත්‍රීවාදය
(ii) සමාජවාදී ස්ත්‍රීවාදය/ මාක්ස්වාදී ස්ත්‍රීවාදය
(iii) රැඩිකල් ස්ත්‍රීවාදය
(iv) පශ්චාත් යටත් විජිත ස්ත්‍රීවාදය
(v) පශ්චාත් නූතන ස්ත්‍රීවාදය

(ඉහත පිළිතුරුවලින් ඕනෑම දෙකක්)

**42.** **ඓතිහාසික වශයෙන් විකාශනය වී ඇති රාජ්‍ය ආකෘති/මාදිලි කිහිපයක්ම තිබේ. ඒවායින් දෙකක් නම් කරන්න.**

(i) ගෝත්‍රික රාජ්‍යය

(ii) ග්‍රීක නාගරික රාජ්‍යය/ ග්‍රීක පෞර රාජ්‍යය

(iii) රාජාණ්ඩුව/ රදල/ වැඩවසම් රාජ්‍යය

(iv) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය

(v) ධනවාදී රාජ්‍යය/ ***ධනේශ්වර රාජ්‍යය***

(vi) සමාජවාදී රාජ්‍යය/ ***කොමියුනිස්ට් රාජ්‍යය***

(vii) ෆැසිස්ට් රාජ්‍යය

(viii) යටත් විජිත රාජ්‍යය

(ix) පශ්චාත් යටත් විජිත රාජ්‍යය

(x) නව ලිබරල්වාදී රාජ්‍යය

(ඉහත පිළිතුරුවලින් ඕනෑම දෙකක්)

**43.** ලිබරල්වාදයේ ප්‍රධාන ධාරා තුනෙන් **දෙකක්** නම් කරන්න.

(i) සම්භාව්‍ය ලිබරල්වාදය/ පැරණි ලිබරල්වාදය

(ii) පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදය/ සමාජීය ලිබරල්වාදය/ ***සුභ සාධන ලිබරල්වාදය***

(iii) නව ලිබරල්වාදය/ ***නූතන ලිබරල්වාදය/ නියෝ ලිබරල් වාදය***

(ඉහත පිළිතුරුවලින් ඕනෑම දෙකක්)

**44.** ගෝලීයකරණය ජාතික රාජ්‍යයට සිදු කොට ඇති බලපෑම පිළිබඳ න්‍යායික ප්‍රවේශ දෙකක් තිබේ. ඒ **දෙක** නම් කරන්න.

(i) ගෝලීයකරණය මගින් ජාතික රාජ්‍යය අවසානයට පත්විය හැකි බව

(ii) ජාතික රාජ්‍යය අවසාන වන්නේ නැතිව එය යළි ව්‍යුහගත කිරීමකට ලක්වන බව

**45.** රාජ්‍යය සමස්ත සමාජයේම පලප්‍රයෝජන සඳහා සේවය කළ යුතු ය යන තර්කය ඉදිරිපත් කිරීමට රූසෝ සංකල්ප දෙකක් භාවිත කෙළේ ය. එම සංකල්ප **දෙක** මොනවාද?

(i) මහජන පරමාධිපත්‍යය/ ***ජනතා පරමාධිපත්‍යය***

(ii) පොදු කැමැත්ත/ ***පොදු අභිමතය***

**46.** (1) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයනය ආරම්භ වූයේ කවර රටෙහිද?

ඇමරිකාව/ ඇමරිකා එක්සත් ජනපදය/ U.S.A

(2) නිලබලක්‍රමය පිළිබඳ පරමාදර්ශී න්‍යායික ආකෘතිය හඳුන්වා දුන්නේ කවුරුන් ද ?

මැක්ස් වේබර්/ ***වේබර්***

**47.** **නිදහස් සහ සාධාරණ මැතිවරණ පිළිබඳ අදහසට පදනම් වී ඇති සංකල්ප දෙකක් නම් කරන්න.**

(i) ජනතා පරමාධිපත්‍යය
(ii) වරණයේ (තෝරා ගැනීමේදී) නිදහස
(iii) මහජනතාවට වගවීම
(iv) මහජන කැමැත්ත සහ සුජාතභාවය

**(ඉහත පිළිතුරුවලින් ඕනෑම දෙකක්)**

**48.** **ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට ප්‍රාදේශීය මට්ටම දක්වා පරිපාලන බලය විසුරුවා හැරීම (විසරණය) ආකාර තුනකින් සිදු වේ. ඉන් දෙකක් නම් කරන්න.**

(i) බලය විතැන් කිරීම/ විකේන්ද්‍රණ කිරීම
(ii) පරිපාලන බලය විමධ්‍යගත කිරීම
(iii) *බලතල පැවරීම*

**(ඉහත පිළිතුරුවලින් ඕනෑම දෙකක්)**

**49.** **1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද සංශෝධනවල ජනාධිපති ධූරයේ බලතල සම්බන්ධව ප්‍රවණතා දෙකක් දක්නට ලැබේ. ඒවා මොනවාද?**

(i) බලය අඩු කිරීම/ *බලය සංවරණය කිරීම*
(ii) බලය වැඩි කිරීම/ *බලය වර්ධනය කිරීම/ බලය ප්‍රසාරණය කිරීම*

**50.** **සහසන්ධීය ආණ්ඩුක්‍රම වශයෙන් ආරම්භ වී පසුව සන්ධීය ආණ්ඩුක්‍රම බවට පත් වී ඇති රටවල් දෙක නම් කරන්න.**

(i) ඇමරිකාව/ ඇමරිකා එක්සත් ජනපදය
(ii) ස්විට්සර්ලන්තය
(iii) කැනඩාව

**(ඉහත පිළිතුරුවලින් ඕනෑම දෙකක්)**

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.

## 2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය

### වගුව 2.2

එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය (%) | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | පළමුවන වරණය | දෙවන වරණය | තෙවන වරණය | සිවුවන වරණය | පස්වන වරණය | ප්‍රතිචාර නො දක්වූ |
| 1 | 5 | 26.67 | 3.47 | 12.13 | 2.45 | 55.00 | 0.28 |
| 2 | 4 | 12.96 | 7.27 | 3.01 | 73.84 | 2.78 | 0.14 |
| 3 | 2 | 26.25 | 62.73 | 5.56 | 1.48 | 3.52 | 0.46 |
| 4 | 3 | 4.95 | 16.90 | 70.09 | 2.69 | 4.95 | 0.42 |
| 5 | 2 | 5.37 | 65.14 | 3.10 | 22.73 | 3.43 | 0.23 |
| 6 | 5 | 7.22 | 4.91 | 12.08 | 2.59 | 72.87 | 0.32 |
| 7 | 1 | 51.71 | 22.64 | 8.10 | 11.53 | 5.69 | 0.32 |
| 8 | 2 | 8.38 | 62.59 | 13.15 | 9.03 | 6.44 | 0.42 |
| 9 | 5 | 16.76 | 3.80 | 10.32 | 5.42 | 63.24 | 0.46 |
| 10 | 3 | 5.46 | 9.72 | 71.06 | 5.05 | 8.43 | 0.28 |
| 11 | 5 | 4.35 | 1.99 | 15.23 | 7.59 | 70.60 | 0.23 |
| 12 | 4 | 5.37 | 2.50 | 8.06 | 76.16 | 7.64 | 0.28 |
| 13 | 3 | 5.88 | 7.55 | 71.30 | 4.12 | 10.97 | 0.19 |
| 14 | 1 | 52.18 | 11.30 | 13.01 | 7.59 | 15.74 | 0.19 |
| 15 | 4 | 13.61 | 19.81 | 8.15 | 41.11 | 16.94 | 0.37 |
| 16 | 1 | 75.79 | 3.61 | 10.37 | 5.46 | 4.40 | 0.37 |
| 17 | 4 | 47.69 | 9.91 | 2.92 | 31.67 | 7.45 | 0.37 |
| 18 | 1 | 35.46 | 23.52 | 8.01 | 4.77 | 27.59 | 0.65 |
| 19 | 2 | 12.22 | 69.58 | 5.05 | 2.45 | 10.19 | 0.51 |
| 20 | 1 | 25.56 | 36.62 | 17.96 | 12.87 | 6.57 | 0.42 |
| 21 | 3 | 13.29 | 22.45 | 49.03 | 10.23 | 4.68 | 0.32 |
| 22 | 3 | 27.69 | 34.49 | 12.04 | 5.60 | 19.91 | 0.28 |
| 23 | 5 | 13.84 | 24.58 | 14.86 | 22.08 | 23.98 | 0.65 |
| 24 | 3 | 38.47 | 11.48 | 30.05 | 11.34 | 8.15 | 0.51 |
| 25 | 2 | 3.33 | 57.55 | 18.70 | 4.77 | 15.23 | 0.42 |
| 26 | 2 | 12.59 | 61.99 | 4.44 | 8.70 | 11.94 | 0.32 |
| 27 | 3 | 23.19 | 7.27 | 44.91 | 11.30 | 12.82 | 0.51 |
| 28 | 1 | 51.57 | 11.85 | 18.84 | 10.97 | 6.44 | 0.32 |
| 29 | 5 | 14.63 | 13.06 | 10.88 | 21.53 | 39.63 | 0.28 |
| 30 | 4 | 16.02 | 28.94 | 8.19 | 38.75 | 7.69 | 0.42 |


මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී.ලං.වි.දෙ.

* එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති අපේක්ෂක ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

** එක් වරණයකට වඩා ප්‍රතිචාර දක්වා ඇති හෝ ප්‍රතිචාර දක්වා නොමැති අපේක්ෂක ප්‍රතිශතය

## 2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක

**ප්‍රස්තාරය 2.1**
I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/AL පරීක්ෂාවෙන් රැස් කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.6. I පත්‍රයේ විශ්ලේෂණය

**සමස්ත අයිතම විශ්ලේෂණය**

දේශපාලන විද්‍යාව I ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකි. A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20කින් යුක්ත වේ.
A කොටසෙහි 70% සහ ඊට වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න 08ක් හඳුනාගත හැකිය. එම ප්‍රශ්න වන්නේ 2, 4, 6, 10, 11, 12, 13, 16 යන ප්‍රශ්නයි. එමෙන්ම පහසුතාව 40%ට අඩු ප්‍රශ්න සංඛ්‍යාව 08කි. ඒවා නම් 17, 18, 20, 22, 23, 24, 29 සහ 30 යන ප්‍රශ්න වේ. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව අඩුම 22 ප්‍රශ්නයෙහි පහසුතාව 12%කි.

B කොටසෙහි 70% සහ ඊට වැඩි පහසුතාවක් සහිත ප්‍රශ්න 06ක් හඳුනාගත හැකිය. එම ප්‍රශ්න වන්නේ 31, 34, 38, 39, 41 සහ 43 යන ප්‍රශ්නයන්ය. එසේම පහසුතාව 40%ට අඩු ප්‍රශ්න සංඛ්‍යාව 04කි. ඒවා නම් 33, 40, 47 සහ 49 යන ප්‍රශ්න වේ. මෙම ප්‍රශ්න අතුරෙන් පහසුතාව අඩුම 40වන ප්‍රශ්නයෙහි වන අතර එහි පහසුතාව 29%කි.

**A කොටස**

I පත්‍රය දේශපාලන විද්‍යාව විෂය නිර්දේශයේ නිපුණතා 15න් 13ක් ආවරණය වන පරිදි බහුවරණ ප්‍රශ්න 30කින් සමන්විත වේ. ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල පහසුතාවය 12% සිට 76%ක් දක්වා පරාසයක විහිදී ඇත. බහුවරණ ප්‍රශ්න 30 අතුරෙන් ප්‍රශ්න අංක 16හි පහසුතාවය 76%කි. එය සාපේක්ෂව ඉහළ අගයකි. එය දැනුම මත පදනම් වූ ප්‍රශ්නයක් වීමත්, දේශපාලන විද්‍යාව තුළ ඇති අනෙකුත් මතවාදවලට සාපේක්ෂව සංක්ෂිප්ත කරුණුවලින් යුක්ත වීමත් එම ප්‍රශ්නයෙහි ඉහළ පහසුතාවට හේතුව විය හැක.

පහසුතාව අඩුම ප්‍රශ්න අංක 22හි පහසුතාව 12%කි. මෙම ප්‍රශ්නය දැනුම යාවත්කාලීන කරගනිමින් තාර්කිකව පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්නයක් වන නමුත් බොහෝ අපේක්ෂකයන් සාම්ප්‍රදායික කරුණු මත පමණක් පදනම්ව පිළිතුර තෝරාගෙන ඇති බව පෙනී යයි.
අභියෝගාත්මක වී ඇති 22 හා 24 ප්‍රශ්න සඳහා බොහෝ අපේක්ෂකයන් නිර්දේශිත රටවල්වල ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ අවබෝධයෙන් තොරව පිළිතුරු සපයා ඇති බව පෙනී යයි.

**B කොටස**


I පත්‍රයේ B කොටසෙහි පහසුතාව වැඩිම ප්‍රශ්නය වන 31 ප්‍රශ්නයෙහි පහසුතාව 79%කි. මෙය ශාස්ත්‍රීය හා ව්‍යවහාරික දැනුම මත පදනම් වන සංකල්පමය ප්‍රශ්නයක් වීම අපේක්ෂක සාධනය වැඩි වීමට හේතුවක් විය හැකිය.

පහසුතාව අඩුම 40 ප්‍රශ්නයෙහි පහසුතාව 29%කි. එම බොහෝ අපේක්ෂකයන් තුළ පක්ෂ ක්‍රමය හා පක්ෂ වර්ගීකරණය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැතිවීම සහ වර්තමාන දේශපාලන පක්ෂ ක්‍රමය තුළ පවතින ව්‍යාකූලභාවය එම ප්‍රශ්නයෙහි අඩු පහසුතා අගයට හේතු විය හැකිය. මීට අමතරව 33 ප්‍රශ්නය (33%) සහ 47 ප්‍රශ්නය (32%) පහසුතාව අඩු ප්‍රශ්න වේ. එම ප්‍රශ්නවලින් විමසා ඇති විෂය කරුණු පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පහළ මට්ටමක පැවතීමත් ප්‍රශ්නය නිවැරදිව ග්‍රහණය කර නොගැනීමත් මෙම ප්‍රශ්න සඳහා අපේක්ෂක සාධනය අඩු වීමට බලපා තිබිය හැකිය.

**දේශපාලන විද්‍යාව නිපුණතා අනුව විශ්ලේෂණය**

| නිපුණතාව | ප්‍රශ්න අංක |
|---|---|
| 01. මෙම පාඩම හදාරන ශිෂ්‍යයා, ශිෂ්‍යාව දේශපාලනයේ හා දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියෙකු ලෙස ක්‍රියා කරයි. | 01 , 02, 10 |
| 02. දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර හඳුනා ගනිමින් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරයි. | 20 |
| 03. තමා ද පුරවැසියකු වන රාජ්‍ය පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනි. | 04, 05, 23, 25 |
| 04. ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති ප්‍රභේද ආශ්‍රයෙන් ආණ්ඩුක්‍රම විග්‍රහ කිරීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කරයි. | 11, 12 |
| 05. දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්යය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 03, 06 , 07, 16 |
| 06. ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි. | 08 |
| 07. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ සමාජ, ආර්ථික සහ දේශපාලන පැතිකඩ හඳුනා ගනි. | - |
| 08. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 21, 29 |
| 09. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබද ඇති අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 9, 18 |
| 10. සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරයි. | 22, 24 |
| 11. රාජ්‍ය ප්‍රතිපත්ති දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් යන අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 15 |
| 12. 1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යුහාත්මක ලක්ෂණ ආයතනික සංයුතිය හා බලතුලනය හඳුනාගෙන පැහැදිලි කරයි. | 26, 27, 28, 30 |
| 13. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය සහ ප්‍රවණතා ඒවායේ ක්‍රියාකාරීත්වය ඔස්සේ ගෙනහැර දක්වයි. | - |
| 14. ජාත්‍යන්තර දේශපාලනයේ ස්වභාවය සහ ප්‍රවණතා හඳුනාගෙන අදහස් දක්වයි. | 13, 14 |
| 15. බාහිර ලෝකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවල ස්වභාවය සහ ඵල විපාක පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි. | 17, 19 |

**ප්‍රස්තාරය 2.2**
නිපුණතා අනුව බහුවරණ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/5/OL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**නිපුණතාව 01 :** මෙම පාඩම හදාරන ශිෂ්‍යයා, ශිෂ්‍යාව දේශපාලනයේ හා දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියෙකු ලෙස ක්‍රියාකරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 03කි.

⋆ පුරවැසියකු ලෙස රටේත් ලෝකයේත් ජීවත්වීමේදී වැදගත් වන යහපත් දේශපාලන සාරධර්ම හා අරමුණු පිළිබඳ ව අවබෝධයක් ලබාගැනීම මෙහිදී අපේක්ෂිතය. මෙම නිපුණතාවට අයත් අධ්‍යයන ප්‍රවේශ සම්බන්ධ දෙවන ප්‍රශ්නයේ පහසුතාව 74%ක් සහ 10 ප්‍රශ්නයේ පහසුතාව 71%කි. පළමු නිපුණතාවයේ අධ්‍යයන ප්‍රවේශ පිළිබඳ වැඩි අවබෝධයක් බොහෝ අපේක්ෂකයන් සතුව තිබූ බව පැහැදිලි වේ.

**නිපුණතාව 02 :** දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර හඳුනාගනිමින් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 01කි.

⋆ මෙම නිපුණතාව මඟින් දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් තේමා පිළිබඳ අවබෝධය ලබාගැනීම අපේක්ෂිතය.

**නිපුණතාව 03 :** තමා ද පුරවැසියකු වන රාජ්‍ය පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනී.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 04කි.

⋆ මෙය රාජ්‍ය හා ඒ හා බැඳුන සංකල්ප මත පදනම් වී ඇත. මෙම නිපුණතාව යටතේ ඇති 04 හා 05 යන ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 70%ක් හා 65%කි. මේ යටතේ ඇති 23 හා 25 ප්‍රශ්නවල පහසුතා පිළිවෙළින් 24%ක් හා 58%කි. බොහෝ අපේක්ෂකයන් සතුව රාජ්‍ය හා ඒ හා බැඳුණු සංකල්ප පිළිබඳ මධ්‍යස්ථ මට්ටමේ අවබෝධයක් තිබී ඇති නමුත් 23 ප්‍රශ්නයේදී නිවැරදි පිළිතුරට ළඟාවීම අභියෝගාත්මක වී ඇති බව පෙනී යයි.

**නිපුණතාව 04 :** ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති ප්‍රභේද ආශ්‍රයෙන් ආණ්ඩුක්‍රම විග්‍රහ කිරීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 02කි.

⋆ රාජ්‍ය බලය බෙදීම හා විධායක බලය සංවිධානය කර ඇති ආකාරය අනුව ඇති ආණ්ඩුක්‍රම ආකෘති පිළිබඳ අවබෝධයක් ලබාදීම මෙම නිපුණතාවෙන් අපේක්ෂිතය.

**නිපුණතාව 05 :** දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්යය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 04කි.

⋆ විවිධ දේශපාලන මතවාද හඳුනාගනිමින් ඒවායේ මූලික ලක්ෂණ හා කාර්යභාරය පිළිබඳ විචාරාත්මක දැනුමක් ලබාගැනීම මෙහිදී අපේක්ෂිතය.

**නිපුණතාව 06 :** ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 01කි.

⋆ ගැටුම් හා ගැටුම් සමථනය පිළිබඳ න්‍යායික සහ ප්‍රායෝගික දැනුමක් ලබාගැනීම මෙහිදී අපේක්ෂිතය.

**නිපුණතාව 08 :** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 02කි.

⋆ නිදහසින් පසු ව්‍යවස්ථා සම්පාදනයට පසුබිම් වූ සාධක විස්තර කරන අතර ආණ්ඩුක්‍රමවල ලක්ෂණ වෙන් වෙන්ව පැහැදිලි කර එම ආණ්ඩුක්‍රමවල ප්‍රවණතා හා ගැටලු හඳුනාගැනීම මෙහි දී අපේක්ෂිතය. මෙම නිපුණතාව යටතේ ඇති 21 හා 29 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 49%ක් හා 40%ක් වේ. මේ අනුව බොහෝ අපේක්ෂකයන් සතුව වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය පිළිබඳ මධ්‍යස්ථ මට්ටමක අවබෝධයක් පැවති බව පෙනී යයි.

**නිපුණතාව 09 :** ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ ඇති අවබෝධය ප්‍රදර්ශනය කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 02කි.

⋆ මෙහිදී ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ න්‍යායික පදනම හා ප්‍රායෝගික පැතිකඩ විශ්ලේෂණාත්මකව දැක්වීම බලාපොරොත්තු වේ. මේ යටතේ ඇති 09 සහ 18 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 63%ක් හා 35%ක් වේ. පහසුතාව ඉහළ අගයක් වන 9 ප්‍රශ්නය සඳහා අපේක්ෂක සාධනය වැඩි වීමට අදාළ මාතෘකාව පිළිබඳ න්‍යායාත්මක අවබෝධය ඉහළ මට්ටමක පැවතීම හේතු විය හැකිය. නමුත් 18 ප්‍රශ්නය බොහෝ අපේක්ෂකයන්ට අභියෝගාත්මක වී ඇත. ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයෙහි ප්‍රායෝගික පැතිකඩ පිළිබඳ අවබෝධය පහළ මටට්මක පැවති නිසා බව ඊට හේතු විය හැකිය.

**නිපුණතාව 10 :** සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයෙකු ලෙස ක්‍රියාකරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 02කි.

⋆ සමකාලීන ලෝකයේ ඒකීය සහ සන්ධීය ආණ්ඩුක්‍රමවල අනන්‍යතාව, වෙනස්කම් සහ විවිධ ආණ්ඩුක්‍රම ආකෘතිවල න්‍යායාත්මක පදනම සහ ප්‍රායෝගික ලක්ෂණ තුලනාත්මකව අධ්‍යයනය කිරීම මෙයින් අපේක්ෂිත ය. මේ යටතේ ඇති 22 සහ 24 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 12%ක් හා 30% ක් වේ. 22 ප්‍රශ්නයෙහි පහසුතාව ඉතාම අඩු මට්ටමක පැවතීම සඳහා ප්‍රශ්නය නිවැරදිව අවබෝධකර නොගැනීමත්, දැනුම යාවත්කාලීන නොවීමත් හේතු වී ඇති බව අනුමාන කළ හැකිය.

**නිපුණතාව 11 :** රාජ්‍ය ප්‍රතිපත්ති දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ය යන අවබෝධය ප්‍රදර්ශනය කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 01කි.

⋆ දේශපාලනය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ කරන ක්‍රියාවලිය, දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජයේ කාර්යභාරය, රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවීමෙහි ලා නිලබල ක්‍රමයේ භූමිකාව පැහැදිලි කිරීම මෙමඟින් අපේක්ෂිත ය. මෙම ප්‍රශ්නයේ පහසුතාව 41%හි රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක ක්ෂේත්‍රය පිළිබඳ බොහෝ අපේක්ෂකයන් සතු දැනුම හා අවබෝධය අඩුම මට්ටමක පැවතීම විය මෙම ප්‍රශ්නයෙහි පහසුතාව අඩුවීමට හේතු විය හැකිය.

**නිපුණතාව 12 :** 1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යුහාත්මක ලක්ෂණ, ආයතනික සංයුතිය හා බල තුලනය හඳුනාගෙන පැහැදිලි කරයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 04කි.

⋆ 1978 පිහිටුවන ලද ආණ්ඩුක්‍රම ව්‍යුහය, බල කේන්ද්‍රණය සහ ආයතනික සංයුතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහාත්මක ස්වභාවය වෙනස් කළ සංශෝධනවල පසුබිම හඳුනාගැනීම මෙහිදී අපේක්ෂිත ය. මේ යටතේ ඇති 26, 27, 28, හා 30 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 62%, 45%, 52%, 39% ක් වේ. මෙම ප්‍රශ්නවල සාධන මට්ටම මධ්‍යස්ථ මට්ටමකි. වර්තමානයේ ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමය වන බැවින් දැනුම යාවත්කාලීන වීම මෙයට හේතු විය හැකිය.

**නිපුණතාව 14 :** ජාත්‍යන්තර දේශපාලනයේ ස්වභාවය සහ ප්‍රවණතා හඳුනාගෙන අදහස් දක්වයි.

⋆ මෙම නිපුණතාවට අදාළ ප්‍රශ්න සංඛ්‍යාව 02කි.

⋆ ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ වෙනස්කම්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ක්‍රියාධරයන් හඳුනා ගැනීම සහ ජාතික බලයේ හා ජාතික අභිලාශවල ස්වරූපය හඳුනාගැනීම මෙයින් බලාපොරොත්තු වේ. මේ යටතේ ඇති 13 සහ 14 ප්‍රශ්නවල පහසුතාව පිළිවෙළින් 71%ක් හා 52%ක් වේ. අන්තර්ජාතික දේශපාලනය කාලීන මාතෘකාවක් වන බැවින් අපේක්ෂකයන් ඒ පිළිබඳ උනන්දුවීම මෙම නිපුණතාවය සඳහා අපේක්ෂක සාධනය ඉහළ මට්ටමක පැවතීමට හේතු වී තිබිය හැකිය.

**නිපුණතාව 15 :** බාහිර ලෝකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවල ස්වභාවය සහ එල විපාක පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි.

⋆ මේ යටතේ ඇති ප්‍රශ්න සංඛ්‍යාව 02කි.

⋆ නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ලක්ෂණ සහ ප්‍රවණතා හඳුනාගැනීම, ශ්‍රී ලංකාව සහ ගෝලීය සංවිධාන පිළිබඳ කරුණු විශ්ලේෂණය කිරීම මෙමඟින් අපේක්ෂිත ය. මේ යටතේ ඇති 17 සහ 19 යන ප්‍රශ්න සඳහා පහසුතාව පිළිවෙලින් 32%ක් හා 70%කි. 17 ප්‍රශ්නයෙහි අඩු සාධන මට්ටමට හේතු බොහෝ අපේක්ෂකයන්ට ගෝලීය සංවිධාන පිළිබඳ ඇති දැනුම ප්‍රමාණවත් නොවීම විය හැකිය. නමුත් 19 ප්‍රශ්නය සඳහා බොහෝ අපේක්ෂකයන්ගෙන් ඉහළ සාධන මට්ටමක් ඇත. ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ නව ප්‍රවණතා පිළිබඳ දැනුම නිරන්තරයෙන් යාවත්කාලීන වීම සහ අපේක්ෂකයන් ඒ පිළිබඳ උනන්දුවෙන් පසුවීම මෙම ඉහළ සාධනයට හේතු විය හැකිය.

## සුවිශේෂී නිරීක්ෂණ

A කොටසෙහි පහසුතාව අඩුම ප්‍රශ්නය 22 ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර ඇත්තේ සමකාලීන ලෝකයේ පවතින ඒකීය රාජ්‍යවල පරිවර්තනය බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම මාදිලිය ඇසුරින් විග්‍රහ කිරීමය. මෙම ප්‍රශ්නයේ දී නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තේරීම සිදුකළ යුතු ය. මෙහි නිවැරදි ප්‍රකාශ කාණ්ඩය වන්නේ ABDE යන තුන්වන වරණයයි. නමුත් අපේක්ෂකයන් අතුරෙන් මෙම නිවැරදි පිළිතුර තෝරා ඇත්තේ 12.04%ක් වැනි සුළු ප්‍රමාණයකි. වැඩි අපේක්ෂකයන් ප්‍රමාණයක් නිවැරදි පිළිතුර ලෙස තෝරාගෙන ඇත්තේ ABCE ප්‍රකාශවලින් යුක්ත දෙවැනි වරණයයි. එම පිළිතුර තෝරාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 34.49%කි. මෙහි ප්‍රකාශ අතරින් D ප්‍රකාශය වන "බහු පක්ෂ ක්‍රමයක් මත ගොඩ නැගී ඇත" යන්න බොහෝ අපේක්ෂකයන් වැරදි පිළිතුරක් ලෙස තෝරාගෙන ඇත. නමුත් බ්‍රිතාන්‍ය තුළ වර්තමානය වන විට ද්වි පක්ෂ ක්‍රමයෙන් ඔබ්බට ගොස් එහි පක්ෂ ක්‍රමය, බහු පක්ෂ ක්‍රමයක් දක්වා වර්ධනය වී ඇත. නමුත් බොහෝ අපේක්ෂකයන් සම්ප්‍රදායික බ්‍රිතාන්‍ය පක්ෂ ක්‍රමය වන ද්වි පක්ෂ ක්‍රමය මත පදනම්ව පිළිතුරු තෝරා ඇති බව පෙනී යයි.

**B** කොටසෙහි පහසුතාව අඩුම ප්‍රශ්නය 40 ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය මඟින් ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ආරම්භය හා විකාශනය මෙන්ම ලක්ෂණ සහ නව ප්‍රවණතා පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම මැන බැලීම සිදුකර ඇත. මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්තව ගොඩනගා ඇත. පළමු කොටස ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය පිළිබඳවත් දෙවැනි කොටසින් මෙරට දේශපාලන පක්ෂ සන්ධානගත වීම පිළිබඳවත් දැනුම මැන බැලීම සිදුකර ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර ලියා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 29%ක් පමණි. වර්තමාන දේශපාලන පක්ෂ ක්‍රමය තුළ පවතින ව්‍යාකූලභාවයත්, ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වය පිළිබඳ අපේක්ෂකයන් තුළ පැවති දැනුම අල්පවීමත් මෙයට හේතු විය හැකිය.

# III කොටස

## 3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය

### 3.1 දේශපාලන විද්‍යාව II පත්‍රයේ ව්‍යුහය

- කාලය පැය 03යි.
- මෙම ප්‍රශ්න පත්‍රය I, II, III යනුවෙන් කොටස් 03කින් යුක්ත ය.
- I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II වැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ, තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු ලිවිය යුතු ය.

I කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 03කි.

II කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 04කි.

III කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කි.


II පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය = 100
II පත්‍රය = 100
අවසාන ලකුණ = 200 ÷ 2 = 100

මූලාශ්‍රය : අ.පො.ස (උ.පෙළ) විභාගය වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග ප්‍රශ්න සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018, ශ්‍රී.ලං.වි.දෙ.

## 3.2 II පත්‍රයේ විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.1**
II පත්‍රයේ ප්‍රශ්න තෝරා ඇති ආකාරය හා එක් එක් ප්‍රශ්නයේ පහසුතාව




මූලාශ්‍රය : RD/16/04/AL , RD/16/03/AL පත්‍රිකාවලින් ලබාගත් පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටසට අයත් ප්‍රශ්න තුනෙන් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II කොටසට අයත් ප්‍රශ්න හතරෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, III කොටසට අයත් ප්‍රශ්න තුනෙන් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ. දේශපාලනයෙහි න්‍යායාත්මක සංකල්ප සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය යටතේ මෙම ප්‍රශ්න සකස් වේ. මෙහි පළමු ප්‍රශ්නය අපේක්ෂකයන්ගෙන් 89%ක් තෝරාගෙන ඇති අතර එය මෙම කොටසේ ජනප්‍රියම ප්‍රශ්නය වේ. මෙහි පහසුතාව 52%කි. මෙම ප්‍රශ්නය පළමු පාඩමේ දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ ආශ්‍රිතව සකස්වී ඇති බැවින් විෂය කරුණු සංක්ෂිප්ත වීමත් ඉලක්කගත මාතෘකාවක් වීමත් නිසා අපේක්ෂකයන් වැඩි පිරිසක් තෝරාගෙන ඇති බව පෙනී යයි.

දෙවන ප්‍රශ්නය තෝරාගැනීමේ ප්‍රතිශතය 75%ක් වන අතර පහසුතාව 63%ක් වැනි ඉහළ අගයකි. ප්‍රශ්නයට අදාළ විෂය කරුණු අනෙකුත් මාතෘකාවන්ට සාපේක්ෂව සරල වීම හා නිශ්චිත විෂය කරුණු වලින් යුක්ත වීම මෙහි පහසුතාව ඉහළ අගයක් ගැනීමට හේතු විය හැකිය. පළමු ප්‍රශ්නයට සාපේක්ෂව දෙවැනි ප්‍රශ්නයේ පහසුතාව ඉහළ මටට්මක පවතී.

I කොටසේ තුන්වන ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 31%කි. එහි පහසුතාව 40%කි. මේ අනුව මෙම ප්‍රශ්නය තෝරාගැනීම හා පහසුතාව යන දෙකම අඩු මට්ටමක පවතින බව පැහැදිලි වේ. එයට හේතු විය හැක්කේ මාතෘකා දෙකකට අදාළ ව (ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී රාජ්‍ය මාදිලිය) විෂය කරුණු සම්භාරයක් පැවතීමත්, මාදිලි දෙකෙහි තොරතුරු තුලනාත්මකව විග්‍රහ කිරීමේ ඇති අපහසුතාවයත් නිසා බව උපකල්පනය කළ හැකිය.

II කොටස ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රමය ආවරණය වන පරිදි ප්‍රශ්න 04කින් සමන්විතය. (ප්‍රශ්න අංක 04 - 07 දක්වා) මෙම කොටසෙහි 04 ප්‍රශ්නය තෝරාගැනීමේ ප්‍රතිශතය 92%ක් වන අතර සමස්ත II පත්‍රයෙහිම ජනප්‍රිය ප්‍රශ්නය වී ඇත්තේද මෙම ප්‍රශ්නයයි. නමුත් මෙහි පහසුතාවය 52%කි. මෙම ප්‍රශ්න තෝරාගැනීමට හේතු වී ඇත්තේ සරල විෂය කරුණු වලින් යුක්ත වීම සහ පහළ ශ්‍රේණිවල සිටම ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය වැනි විෂයයන් තුළින්ද අදාළ මාතෘකාව පිළිබඳ පෙර දැනුමක් ලැබීම විය හැකිය. නමුත් මෙහි පහසුතාව 52%ක් දක්වා අඩුවීමට ප්‍රශ්නයට අදාළව නිශ්චිත කරුණු දැක්වීමට අපේක්ෂකයන් අපොහොසත් වීම හේතු විය හැකිය.


මෙම කොටස යටතේ අඩුම තෝරාගැනීමක් සහ අඩුම පහසුතාවක් ඇති ප්‍රශ්නය වන්නේ 07 ප්‍රශ්නයයි. එය තෝරාගැනීමේ ප්‍රතිශතය 36%ක් වන අතර පහසුතාවය 31%කි. මෙම ප්‍රශ්නය තෝරාගැනීම අඩුම මට්ටමක පැවතීමට හේතු විය හැකිය. මෙම ප්‍රශ්නය මඟින් ඉතා පුළුල් විෂය කරුණු සම්භාරයකට අදාළ දැනුම හා අවබෝධය අපේක්ෂා කර තිබීම. එමෙන්ම මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට සමස්ත ප්‍රංශ ආණ්ඩුක්‍රමය පිළිබඳ දැනුමක් ද අපේක්ෂකයාට තිබිය යුතු ය. මෙහි පහසුතාව අඩු මට්ටමක පැවතීමට ද ඉහත කරුණු ම බලපා ඇති බව උපකල්පනය කළ හැක.

II පත්‍රයේ III කොටස ප්‍රශ්න 03කින් යුක්ත වේ. (ප්‍රශ්න අංක 08, 09, 10) මෙම කොටසේ ජනප්‍රියම ප්‍රශ්නය වී ඇත්තේ 10 ප්‍රශ්නයයි. එම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 84%කි. මෙම ප්‍රශ්නය මඟින් කෙටි සටහන් ලිවීම අපේක්ෂා කර ඇති බැවින් බොහෝ අපේක්ෂකයන් අතර ජනප්‍රිය ප්‍රශ්නයක් වී ඇත. නමුත් මෙහි පහසුතාව 42%කි. අදාළ මාතෘකා යටතේ පිළිතුර තුළ ප්‍රමාණවත් ලෙස විෂය කරුණු පෙළගස්වා නොතිබීම මෙම ප්‍රශ්නයෙහි පහසුතාව අඩු අගයක්වීමට හේතු විය හැකිය.

මෙම කොටසේ ඇති 09 ප්‍රශ්නය සමස්ත II පත්‍රයෙහිම ජනප්‍රියතාව අඩු ම ප්‍රශ්නය බවට පත්වී ඇත. එය තෝරාගැනීමේ ප්‍රතිශතය 19%ක් වන අතර පහසුතාව 29%කි. පුළුල් පරාසයක විහිදෙන විෂය කරුණු සම්භාරයකින් සමන්විත වීම සහ සංකල්ප කිහිපයක තුලනාත්මක දැනුමක් මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබීම මෙම ප්‍රශ්නය තෝරාගැනීම හා පහසුතාව අඩු අගයක්වීමට හේතු විය හැකිය.

**ප්‍රස්තාරය** 3.2


පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය




මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවලින් ලබාගත් පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රය කොටස් තුනකින් යුක්ත වන අතර එක් ප්‍රශ්නයක් සඳහා ලැබෙන ලකුණු සංඛ්‍යාව 20කි. 2 ප්‍රශ්නය හැර අනෙක් ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් වැඩි ප්‍රතිශතයක් ලකුණු ලබාගෙන ඇත්තේ අඩුම පන්ති ප්‍රාන්තරය වන වෙන්කළ ලකුණින් 00-25 ප්‍රාන්තරය තුළය. එමෙන්ම 2 ප්‍රශ්නය හැර අනෙකුත් ප්‍රශ්න සඳහා අඩුම අපේක්ෂකයන් ප්‍රතිශතය ලකුණු ලබාගෙන ඇත්තේ 76-100 ඉහළ පන්ති ප්‍රාන්තරය තුළය.

**ප්‍රස්තාරය 3.3**
II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවලින් ලබාගත් පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020. ශ්‍රී. ලං. වි. දෙ.

## 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂි නිරීක්ෂණ සහ නිර්දේශ

3.3.1. ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

**(01). දේශපාලනය අධ්‍යයනය කිරීමේ දී භාවිත කරන තුලනාත්මක ප්‍රවේශය විස්තර කරන්න.**

**අභිමතාර්ථය :**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ දේශපාලන අධ්‍යයනය සම්බන්ධව පොදුවේත් තුලනාත්මක ප්‍රවේශය පිළිබඳව විශේෂයෙනුත් විභාග අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමයි. මෙය විස්තරාත්මක පිළිතුරක් වුවද තුලනාත්මක දේශපාලන අධ්‍යයනය පිළිබඳ ඇගයීමක් ද කර තිබේ නම් වැඩිපුර ලකුණු ප්‍රදානය කරන්න.

පිළිතුරේ ප්‍රධාන විෂය කරුණු

* දේශපාලන විද්‍යාවේ තුලනාත්මක ප්‍රවේශය අර්ථ දැක්වීම
* තුලනාත්මක ප්‍රවේශයේ අරමුණු පෙන්වාදීම
* දේශපාලන විද්‍යාවෙහි තුලනාත්මක ප්‍රවේශයේ විවිධ අවධි සහ සම්ප්‍රදාය පෙන්වා දීම
* තුලනාත්මක ප්‍රවේශයේ ප්‍රයෝජනවත් බව පැහැදිලි කිරීම

හැඳින්වීම/ ප්‍රවේශය : දේශපාලන අධ්‍යයනය සඳහා ඇති ප්‍රවේශය ගැන කෙටි හැඳින්වීමක් කරමින්, එම සන්දර්භය තුළ තුලනාත්මක ප්‍රවේශය ස්ථානගත කරන හරයාත්මක ඡේද එකකින් හෝ දෙකකින් සමන්විත විය හැකිය. තුලනාත්මක අධ්‍යයනය දේශපාලන විද්‍යා අධ්‍යයනයේ පැරණිතම ප්‍රවේශයක් වන අතර, එහි ඉතිහාසය ග්‍රීක සහ රෝම යුගය දක්වා දිවෙයි. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් එහි පුරෝගාමීන්ය. එහිදි දීර්ඝ ඉතිහාසයක් තුළ, තුලනාත්මක ප්‍රවේශ අවධි තුනක් තුළින් ගමන් කර ඇත. ඒවා නම් සම්භාව්‍ය, විසි වැනි සියවසට අයත් සහ සමකාලීන යන ඒවාය. තුලනාත්මක ප්‍රවේශය භාවිත වන්නේ දේශපාලන විද්‍යාවේ පමණක් නොවේ. එය සියලු සමාජ විද්‍යාවන්ට පොදු ප්‍රවේශයකි.

තොරතුරු, විෂය කරුණු සහ සාකච්ඡාව :

I. තුලනාත්මක ප්‍රවේශය කුමක්දැයි පැහැදිලි කිරීම: සමාජීය විද්‍යාවන් තුළ යොදා ගන්නා අර්ථ කථනයක් මඟින් තුලනාත්මක ප්‍රවේශයෙන් අපේක්ෂා කරන්නේ සමාජ වස්තූන් හෝ සමාජ සංසිද්ධීන් දෙකක් හෝ වැඩි ප්‍රමාණයක් සන්සන්දනය කරමින්, ඒවා අධ්‍යයනය කිරීමයි. ඒවා අතර සමානකම් ද, වෙනස්කම් ද, ඒවායේ රටා, හේතු සහ ප්‍රතිඵල හඳුනාගැනීම ද එයින් අපේක්ෂා කෙරේ.

II. දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ තුලනාත්මක ප්‍රවේශයෙන් යෝජනා වන්නේ, දේශපාලන සිදුවීම්, ක්‍රියාදාම හා ප්‍රපංච දෙකක් හෝ කිහිපයක් තුලනාත්මක අධ්‍යයනය කිරීමයි. මේ සඳහා නිදසුන් සැපයීම මෙතැනදී අපේක්ෂා කෙරේ

III. දේශපාලන තුලනාත්මකව හදාරාන්නේ මන් ද ? යන කරුණු විමසා බැලීම මෙහිදී කෙනත් නිව්ටන් සහ ජාන් වැන්ඩන් යන දේශපාලන විද්‍යාඥයින් දෙදෙනා ඉදිරිපත් කර ඇති පිළිතුර සඳහන් කළ හැකිය. එම පිළිතුර නම්,

(අ) එක් රටක දේශපාලනය හැදෑරීමේදී අන් රටවල දේශපාලනය ගැන ද අවබෝධයක් තිබීම ප්‍රයෝජනවත්ය;

(ආ) රටවල්වල දේශපාලනය සංසන්දනාත්මකව අධ්‍යයනය කරන විට එම එක් එක් රටක දේශපාලනය අවබෝධ කර ගැනීම සඳහා ඒ මගින් විශේෂ ආලෝකයක් සැපයේ.

IV. පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න ඇසීම මගින්, අප අධ්‍යයනය කරන ගැටළු පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට තුලනාත්මක ප්‍රවේශය මගින් අපට අවකාශ ලැබේ; ඇතැම් රටවල් ප්‍රජාත්‍රන්තවාදි ක්‍රමය අතහැර දමා තිබියදී සමහර රටවල්වල ප්‍රජාත්‍රන්තවාදය පවතින්නේ ඇයි? ඇතැම් රටවල බහු-පක්ෂ ක්‍රමයක් තිබීයදී තවත් රටවල ද්වි-පක්ෂක්‍රමයක් පවතින්නේ ඇයි? බංග්ලාදේශය, පකිස්ථානය සහ නේපාලය වැනි රටවල ස්ත්‍රීන් බොහෝ දෙනෙකු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සහ ඇමතිවරුන් වී සිටියදී ලංකාවේ ස්ත්‍රීන් ස්වල්ප දෙනෙකු පමණක් පාර්ලිමේන්තුවේ සිටින්නේ ඇයි? අමරිකාවේ මැතිවරණවල ඡන්දායක සහභාගිත්වය අඩුව තිබෙද්දී, ලංකාවේ එය ඉහළ මට්ටමක තිබෙන්නේ ඇයි?

V. දේශපාලන සංසිද්ධීන් වර්ගීකරණය සඳහා තුලනාත්මක ප්‍රවේශය බෙහෙවින් ප්‍රයෝජනවත්ය. නිදසුනක් ලෙස එක් දේශපාලන සංසිද්ධියක සුවිශේෂ ලක්ෂණ හඳුනාගෙන, ඒ මත අපගේ වර්ගීකරණය ගොඩ නගා ගැනීමට, තුලනාත්මක ප්‍රවේශය අපට අධාරවෙයි. ඒ සඳහා නිශ්චිත මිනුම් දඬු ද අවශ්‍ය වේ. නිදසුනක් ලෙස ග්‍රීක පෞර-රාජ්‍යවල පැවති දේශාපාලන ක්‍රම සංසන්දනය කිරීම සඳහා ප්ලේටෝ මිනුම් දඬු තුනක් භාවිතා කළේය.

(අ) දේශපාලන බලය හිමි වූයේ කාට ද?

(ආ) රටේ පවතින නීතිය හා සාමය පිළිබඳ තත්ත්වය

(ඇ) දේශපාලන බලය සංවිධානය වී ඇති ආකාර

VI. තුලනාත්මක දේශපාලනයේ ප්‍රධාන අවධීන් තුනඃ සම්භාව්‍ය, විසිවැනි සියවසේ සහ සමකාලීන ප්‍රවේශය. ඒවා විස්තර කිරීම මෙසේ කළ හැකිය.

(අ) ග්‍රීක, රෝම සහ මධ්‍යතන දේශපාලන චින්තනය කරා දිවෙන සම්භාව්‍ය අවධිය:
ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්, ග්‍රීක පෞර රාජ්‍යවල දේශපාලන ක්‍රම හැදෑරීමට මෙම ප්‍රවේශය භාවිත කළහ. ඔවුහු සම්භාව්‍ය තුලනාත්මක ප්‍රවේශයේ ආරම්භකයෝ වූහ. ආණ්ඩුක්‍රම වර්ගීකරණය සඳහා ඔවුහු එය යොදා ගත්හ.

(ආ) තුලනාත්මක දේශපාලනයෙහි විසිවන සියවසේ අවධිය වර්ධනය වූයේ 1960 ගණන්වලදී ඇමරිකාවේ විශ්ව විද්‍යාලවලය. ඒ දේශපාලනය පිළිබඳ විද්‍යාත්මක සහ ආනුභවික අධ්‍යයනයේ අංගයක් ලෙසය. එහි ප්‍රධාන අධ්‍යයන තේමා වූයේ දේශපාලන නවීකරණය, දේශපාලන වර්ධනය, දේශපාලන සංස්කෘතිය, දේශපාලන සමාජියකරණය, සහ දේශාපාලන චර්යාවයි. ඒවායේ පුරෝගාමීන් වූයේ "විද්‍යාත්මක"/ ආනුභවිකවාදි දේශපාලන විද්‍යාඥයින්ය.

(ඇ) දේශපාලන අධ්‍යයනය පිළිබඳ තුලනාත්මක ප්‍රවේශයෙහි සමකාලීන අවධියෙහිදී, විද්‍යාත්මක/ ආනුභවිකවාදි ප්‍රවේශය විවේචනයට ලක් කරනු ලැබිණි. එයට හේතුව, දේශපාලන නවීකරණය සහ දේශපාලන වර්ධනය මැනීමෙහි දී භාවිත කර තිබුණු බටහිර රටවල් ආදර්ශයට ගැනීමයි. මෙම නව සමකාලීන ප්‍රවේශය තුළ සංසන්දනය සඳහා යොදා ගන්නා මාතෘකා වන්නේ දේශපාලන ආයතන, දේශපාලන ක්‍රියාවලින්, දේශපාලන වෙනස් වීම්, දේශපාලන ගැටුම්, සාම ක්‍රියාවලින්, රාජ්‍යයේ ස්වභාවය සහ පරිවර්තනය, ප්‍රජාත්‍රන්තවාදි පරිවර්තනය සහ ප්‍රජාතන්ත්‍රීයකරණය, පුරවැසි ක්‍රියාකාරිත්වය, මානව අයිතිවාසිකම්, ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය වැනි ගුණාත්මක තේමාවන්ය. මෙය "ගුණාත්මක තුලනාත්මක විග්‍රහය " ලෙස ද හැඳින් වේ.

(ඈ) මෙම නව සමකාලීන තුලනාත්මක ප්‍රවේශයේ ඇති විශේෂත්වය නම්, එය විසින්, වඩා දියුණු හෝ නොදියුණු, සංවර්ධිත හෝ ඌණ සංවර්ධිත හෝ වශයෙන් සමාජ සහ ඒවායේ ඇති දේශපාලන ක්‍රම වර්ගීකරණය නොකිරීමයි. තුලනාත්මක අධ්‍යයනයේ අරමුණ වන්නේ එක් එක් රටවල දේශපාලන අත්දැකීම්වලින් පාඩම් ඉගෙන ගැනීමයි. එක් එක් රට සඳහා සංසන්දනාත්මක වටිනාකම් විනිශ්චයන් ඉදිරිපත් කිරීම නොවේ.

VII. වර්තමාන දේශපාලන විද්‍යාව තුළ, සමකාලීන දේශපාලන අධ්‍යයන ප්‍රවේශයේ ප්‍රධාන සම්ප්‍රදාය/ ප්‍රවේශ දෙකක් තිබේ. ඒවානම්, ඉහත දැක්වූ,

(අ) අනුභාවික/ විද්‍යාත්මක තුලනාත්මක ප්‍රවේශය, සහ
(ආ) ගුණාත්මක තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයයි.

මෙයින් පළමු වැන්න 1960 ගණන්වල වර්ධනය වූ ප්‍රධාන ප්‍රවාහයේ ඇමරිකානු දේශපාලන විද්‍යාවට සම්බන්ධ තුලනාත්මක දේශපාලන විද්‍යාවයි. දෙවැන්න, රැඩිකල්, තුන්වෙනි ලෝක දේශපාලන විද්‍යාව සමඟ සම්බන්ධය.

**නිගමනය :**


පිළිතුරේ ගොඩනගා ඇති විස්තරයේ සහ සාකච්ඡාවේ හරවත් සාරාංශයක් මෙන්ම දේශපාලනය හැදෑරීමේදී තුලනාත්මක ප්‍රවේශයේ ඇති වැදගත් කම පිළිබඳව ඇගයීමක් ඉදිරිපත් කර ඇත්නම්, වැඩිපුර ලකුණු දීමට සළකා බලන්න.

සංසන්දනය තුළින් අප අධ්‍යයනය කරන ප්‍රපංචය පිළිබඳව වඩාත් පරිපූර්ණ අවබෝධයක් ලැබීමට අපට හැකියාව ලැබෙන බවද නිගමනය තුළ ප්‍රකාශ කළ හැකිය.

### 3.3.2. ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.4**

ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි. ඉන්,


ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. ඉහළම ලකුණු ප්‍රාන්තරය වන 16-20 ලකුණු ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 14%කි.

මූලාශ්‍රය : RD/16/03/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 01 සඳහා සමස්ත පහසුතාව 52%කි. මෙම ප්‍රශ්නයෙන් පිරික්සා කර ඇත්තේ තුලනාත්මක ප්‍රවේශය විස්තර කිරීමයි. පිළිතුරට ප්‍රවේශ වීම ඊට අදාළ විෂය කරුණු අන්තර්ගතය තුළ තහවුරු කිරීම, හා නිගමනය දැක්වීම ඉන් අපේක්ෂා කර ඇත. නමුත් සමහර අපේක්ෂකයන් සතුව මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමේ දී අදාළ විෂය කරුණු පිළිබඳ දැනුම හා අවබෝධය ප්‍රමාණවත්ව නොතිබූ බව පෙනී යයි.

**3.3.3. ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර**

02. **නූතන භෞමික රාජ්‍යය ප්‍රධාන අංග/ මූලධර්ම හතරක් යටතේ සංවිධානය කර ඇත. ඒවා විස්තර කරන්න.**

**අභිමතාර්ථය :**
මේ ප්‍රශ්නයෙන් අරමුණු කරන්නේ රාජ්‍යය පිළිබඳව ඇති න්‍යාය සහ සංකල්ප යොදා ගනිමින් රාජ්‍යය තේරුම් ගැනීම පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමයි. අපේක්ෂිත පිළිතුර විස්තරාත්මක එකක් වුවත් එය සංකල්පමය වශයෙන් ගොඩනගන ලද්දක් විය යුතුය. මෙම තේමාව රාජ්‍යය පිළිබඳ ඓතිහාසික සහ න්‍යායික අවබෝධය සමග සම්බන්ධවීම එයට හේතුවයි.

පිළිතුරේ අන්තර්ගත මූලික කරුණු

* භෞමික රාජ්‍යය සහ ජාතික රාජ්‍යය කෙටියෙන් අර්ථ දැක්වීම
* භෞමික රාජ්‍යයෙහි අංග සතර පැහැදිලි කිරීම
* භෞමික රාජ්‍යයේ ප්‍රධාන අංග හඳුනා ගැනීම සහ විස්තර කිරීම
* නූතන රාජ්‍ය පමණක් භෞමික රාජ්‍ය වන්නේ මන්දැයි පෙන්වා දීම

**01. හැඳින්වීම :**

භෞමික රාජ්‍යය යනු රාජ්‍යයේ ඓතිහාසික විකාශනය තුළ බිහිවූ නූතන රාජ්‍ය මාදිලියක් බව ප්‍රකාශ කරමින් හැඳින්වීම ආරම්භ කළ හැකිය. නිශ්චිත සහ වෙනස් නොවන භූමි ප්‍රදේශයක් තිබීම නූතන ජාතික රාජ්‍යයේ ද ලක්ෂණයකි. එබැවින් දේශපාලන විද්‍යා සංකල්ප ලෙස භෞමික රාජ්‍යය සහ ජාතික රාජ්‍යය සමාන අර්ථ දෙන ඒවාය. එමෙන්ම ඒවා නූතන යුගයේදී රාජ්‍යය පත්වන පරිවර්තනය පෙන්වා දීමට යොදා ගන්නා සංකල්ප වෙති. එහෙත් භෞමික රාජ්‍යය සංකල්පයෙන් අවධාරණය කරන්නේ නූතන රාජ්‍යයේ නිශ්චිත භූමි ප්‍රදේශය පිළිබඳ සංකල්පය වන අතර ජාතික රාජ්‍යයෙන් අවධාරණය කරන්නේ එහි ජාතිකත්වය පිළිබඳ සාධකයයි.

**(ලකුණු 02 යි)**

**02. තොරතුරු විෂයකරුණු සහ සාකච්ඡාව**

I. භෞමික රාජ්‍යය අර්ථ දැක්වීම සහ එය නූතන වන්නේ මන්දැයි දක්වා සිටීම.
රාජ්‍යයට නිශ්චිත භෞමික සීමා පවත්වා ගැනීමේ හැකියාව ලැබුණේ දහහත් වැනි සියවසේදී ජාතික රාජ්‍ය ක්‍රමය බිහිවීමක් සමගය. භෞමික රාජ්‍යය යනු නිශ්චිත දේශ සීමා සහිත රාජ්‍යයකි. සෑම රාජ්‍යයකටම භූමියක් සහ දේශ සීමා තිබේ. එහෙත් නිශ්චිත භූමි ප්‍රදේශ සහ නිශ්චිත දේශ සීමා තිබෙන්නේ නූතන රාජ්‍යයට පමණි.

II. නූතන භෞමික රාජ්‍යයේ අංග හතර දක්වා ඒවා එකිනෙකට විස්තර කර තිබීම.

(අ) නිශ්චිත භූමි ප්‍රදේශය

(ආ) ජාතිකත්වය

(ඇ) ආණ්ඩුව

(ඈ) ස්වාධිපත්‍යය

III. නිශ්චිත සහ ස්ථාවර දේශ සීමා තිබීම නූතන රාජ්‍යයේ ප්‍රධාන ලක්ෂණයකි. පූර්ව නූතන රාජ්‍යවල මෙම ලක්ෂණ තිබුණේ නැත. ස්ථිර දේශ සීමා පවත්වා ගැනීමට අවශ්‍ය ආර්ථික සහ ද්‍රව්‍යමය සම්පත් හිමි නොවීම, යුද බලය සහ ස්ථාවර යුද හමුදා නොතිබීම. ප්‍රවාහන සහ සන්නිවේදන පහසුකම්වල සීමා සහ රාජ්‍ය තුළ ආර්ථික ඒකාබද්ධතාව පවත්වා ගැනීමට අධාර වන ඒකාබද්ධ දේශීය වෙළෙඳ පොළක් නොතිබීම එයට හේතුවූහ. නූතන රාජ්‍යයට මේවා සියල්ලම තිබේ.

IV 1648 වෙස්ට්ෆේලියානු සාම ගිවිසුම නූතන රාජ්‍යය භෞමික රාජ්‍යයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියේදී තීරණාත්මක කාර්යය ඉටු කර ඇත. ඒ මගින් රාජ්‍යවල දේශ සීමා අනෙකුත් රාජ්‍ය විසින් ද පිළිගැනීමේ සම්ප්‍රදාය ආරම්භ විය. පසුව යුරෝපයේ නූතන භෞමික රාජ්‍ය සංකල්පයේ මුල්ගලක් බවට පත් වූයේ මෙම වෙස්ට්ෆේලියානු මූලධර්මයයි. පූර්ව නූතන රාජ්‍යවල දේශ සීමා එපරිදි නොවීය. ඒවා නම්‍යශීලි විය. එමෙන්ම නිතර ඇතිවන යුද්ධ සහ ආක්‍රමණ නිසා දේශ සීමා පහසුවෙන් වෙනස් වීමට පාත්‍ර විය. ප්‍රාදේශීය පාලකයින් තම දේශපාලන ලැදියාව වෙනස් කිරීම නිසා ද දේශසීමා නම්‍ය ශීලි විය.

V නිශ්චිත භූමි ප්‍රදේශය : නූතන රාජ්‍යවලට දේශ සීමාවලින් නිර්ණය කරන ලද භූමි ප්‍රදේශයක් තිබේ. මේ දේශ සීමා ජාත්‍යන්තර නීතිය විසින් ද පිළිගනු ලැබේ. රාජ්‍යයේ භෞතික පදනම තිබෙන්නේ එම භූමි ප්‍රදේශය ඇතුළතය.

ජාත්‍යන්තර නීතිය සහ අනෙකුත් රාජ්‍ය විසින් පිළිගන්නා නිසා නූතන රාජ්‍යවල දේශ සීමා සාපේක්ෂ වශයෙන් වෙනස් නොවන සුළුය. ඒවා ආර්ථික ඒකක ද වෙයි. එවැනි දේශ සීමා උල්ලංඝනය කිරීමට ඇති එකම මාර්ගය අන්තර් රාජ්‍ය යුද්ධයයි. එය සාමාන්‍යයෙන් කලාතුරකින් සිදුවන්නකි.

VI **ජාතිකත්වය :**

නූතන රාජ්‍යයන් ජාතික ඒකක නිසා ඒවා ජාතික රාජ්‍ය ලෙස හැඳින්වෙති. ජාතීන් යනු නිශ්චිත භූමි ප්‍රදේශයක් තුළ දේශපාලන වශයෙන් සංවිධානය වී සිටින ඒකකයි. ජාතීහු එකිනෙකින් වෙනස් ජාතික සහ ආර්ථික සංස්කෘතික අනන්‍යතා සහිත ප්‍රජා කණ්ඩායම් වෙති.

ජාතිකත්වය යනු රාජ්‍යයක් වශයෙන් සංවිධානය වී සිටින එවැනි දේශපාලන ප්‍රජාවකට, භාෂාව, ආගම, සංස්කෘතිය සහ ඉතිහාසය වැනි පොදු සාධකයක් මත පොදු අනන්‍යතාවයක් තිබෙන්නේය යන හැඟීමයි. ජාතියකට අයත් ජනතාවකට පොදු දේශපාලන අනන්‍යතාවයක් තිබේ. පූර්ව-නූතන රාජ්‍යවල එවැනි පොදු ජාතිකත්වය සහිත විශාල දේශපාලන ඒකක තිබුණේ නැත.

නූතන රාජ්‍ය සංවිධානය වී තිබෙන්නේ එක් ජාතියක්-එක් රාජ්‍යයක් යන මූල ධර්මය මතය. මෙය නූතන රාජ්‍යයේ ජාතිකත්වය පිළිබඳ මූලධර්මයේ පදනමයි.

ජාතිකත්වයෙන් සිදු වන්නේ ජාතික අනන්‍යතාව තුළින් රාජ්‍යයකට අයත් ජනතාව එකට බැඳ තැබීමයි. ජාතිකවාදය යනු මෙම බැඳීම පිළිබඳ විඥානයයි. ඒ මගින් ජාතික සමගිය සහ ඒකාග්‍රතාව ඇති වෙතැයි අපේක්ෂා කෙරේ.

VII **ආණ්ඩුව :**

රාජ්‍ය තම කාර්යයන් ඉටු කර ගැනීමට යොදා ගන්නා ප්‍රධාන ආයතනය ආණ්ඩුවයි. ආණ්ඩුව යනු තම කාර්යයන් ඉටු කර ගන්නා ආයතනවල ඓක්‍යය යැයි කිව හැක්කේ ඒ නිසාය.

ආණ්ඩුවල ප්‍රධාන ආයතන කලාප තුනක් තිබේ. ඒවා නම් ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණයයි.

විවිධ ආණ්ඩු මාදිලින් තිබේ. ප්‍රජාතන්ත්‍රවාදී, ඒකතන්ත්‍රවාදී, අධිකාරවාදී සහ සමාජවාදී යනු එවැනි ආණ්ඩු මාදිලිවලට නිදසුන්ය. පාර්ලිමේන්තු, ජනාධිපති සහ මිශ්‍ර ආදි ආණ්ඩු ක්‍රම ද තිබේ.

VIII **පරමාධිපත්‍යය :**

සමාජය එහි පුද්ගලයින් සහ ආයතන මත බල පැවැත්වීමට හැකි රාජ්‍යය පමණක් සතු අසහාය බලය පරමාධිපත්‍යය යනුවෙන් හැඳින්වේ. රාජ්‍යයකට එම බලය තිබෙන්නේ රාජ්‍යයේ නිශ්චිත දේශ සීමා ඇතුළත පමණි. එය රාජ්‍යයට පමණක් හිමි බලයක් වන අතර එය පවතින්නේ රාජ්‍යයේ දේශ සීමා ඇතුළත පමණි.

නීති සෑදීම, නීති ක්‍රියාත්මක කිරීම සහ යුක්තිය පසිඳලීම රාජ්‍යයේ පරමාධිපත්‍ය බලයට අයත් වේ. සමාජයේ අන් කිසිදු ආයතනයට මෙම බලය හිමි නැත. මේ අනුව රාජ්‍යයේ පරමාධිපත්‍ය බලය යනු අන් අයට ආඥා කිරීමට හැකියාව ඇති රට තුළ අන් බලයක ආඥාවන්ට යටත් නොවන රාජ්‍යය පමණක් සතු බලයයි.

රාජ්‍යයට තම දේශ සීමා ඇතුළත විශේෂ අධිකාර බලයක් තිබේ යැයි කිව හැක්කේ පරමාධිපත්‍ය බලය නිසාය. තම දේශ සීමා ඇතුළත ජීවත්වන සියලු දෙනාගේ අවනත භාවය රාජ්‍යය අපේක්ෂා කරන්නේ ද ඒ නිසාය.


**නිගමය :**

ඉහත සඳහන් සාකච්ඡාවේ කෙටි සාරාංශයක් මත නිගමනය ගොඩ නැගිය හැකිය. ඒ අතරින් නූතන භෞතික රාජ්‍යයේ අත්දැකීම් පිළිබඳ තම නිරීක්ෂණ එකක් හෝ දෙකක් මෙහිදී ඉදිරිපත් කළ හැකිය. නිදසුනක් ලෙසට (අ) නූතන බොහෝ රාජ්‍ය අතරේ රාජ්‍ය දේශ සීමා ගැටුම් සහ යුද්ධ හටගනී. (ආ) බොහෝ රාජ්‍ය ඇතුළත සුළුජන ප්‍රශ්න නිසා ජාතික අර්බුද සහ ගැටුම් ඇතිවී තිබේ. (ඇ) බොහෝ බහු වාර්ගික , භෞමික රාජ්‍යවල ජාතික සමගිය දුෂ්කර අභියෝගයක් බවට පත් වී තිබේ. (ඈ) බොහෝ රාජ්‍යවල පරමාධිපත්‍යය, බලගතු රාජ්‍ය සහ ජාත්‍යන්තර සමාගම්වල අභියෝගයට ලක් වී තිබේ.

### 3.3.4. ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.6**

ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි. ඉන්,


ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 19%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 58%ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ලකුණු 11ක් හෝ ඊට වඩා වැඩියෙන් ලබාගෙන ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.7**

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 02 සඳහා සමස්ත පහසුතාව 63% කි. එය සතුටුදායක මට්ටමකි. ඉහළ අපේක්ෂක සාධනය සඳහා හේතු වී ඇත්තේ මෙම ප්‍රශ්නයට අපේක්ෂිත පිළිතුර නිශ්චිත සහ න්‍යායාත්මක කරුණු වලින් සමන්විත වීම විය හැකිය. ඇතැම් අපේක්ෂකයන් සතුව පැවති කරුණු ඉදිරිපත් කිරීමේ දුර්වලතා හා කරුණු ප්‍රමාණාත්මකව ඉදිරිපත් නොකිරීම යන දුර්වලතා මඟහරවා ගැනීමට කටයුතු කළේ නම් මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂක සාධනය තවදුරටත් සංවර්ධනය කරගත හැකිව තිබුණි.

### 3.3.5. ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

**(3). ලිබරල් ප්‍රජාතාන්ත්‍රික සහ සමාජවාදී රාජ්‍ය මාදිලි අතර ඇති වෙනස්කම් සාකච්ඡා කරන්න.**

**අභිමතාර්ථය :**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ අපේක්ෂකයින් සතු විස්තරාත්මක, තුලනාත්මක, සහ විචාරාත්මක නිපුණතා පරීක්ෂා කිරීමය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී රාජ්‍ය මාදිලි දෙක කෙටියෙන් විස්තර කර, එම මාදිලි දෙක අතර වෙනස්කම් හඳුනාගෙන ඒවා සාකච්ඡා කිරීම මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. පිළිතුරේ වැඩි අවධානය යොමු විය යුත්තේ තුලනාත්මක සාකච්ඡාවටයි.

පිළිතුරේ මූලික විෂය කරුණු

* ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි සහ සමාජවාදි රාජ්‍ය මාදිලි අර්ථ දැක්වීම
* ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ බිහිවීම සහ එහි ස්වභාවය පෙන්වාදීම
* සමාජවාදී රාජ්‍යය බිහිවීම සහ එහි ස්වභාවය පෙන්වා දීම.
* ඒවා අතර වෙනස්කම් හඳුනාගෙන ඒවා සාකච්ඡා කිරීම

හැඳින්වීම : මෙම රාජ්‍ය මාදිලීන් දෙක ඒවායේ ඓතිහාසික සන්දර්භවලට සම්බන්ධ කරමින් ඒවා දේශපාලන විද්‍යාව අධ්‍යනය අදාළවන්නේ මන්දැයි පැහැදිලි කරමින් හැඳින්වීම ආරම්භ කළ හැකිය. මේවා යුරෝපයේ කාර්මික ධනවාදයේ වර්ධනයේ පසුබිම තුළ පහළ වූ දෙයාකාර රාජ්‍ය මැදිලි දෙකකි.

I. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදි රාජ්‍යමාදිලි පිළිබඳ කෙටි විස්තරයක්

(අ) යුරෝපයේ ධනවාදයේ වර්ධනය පසුබිම තුළ 17 වැනි සහ 18 වැනි සියවස්වල බිහි වී වර්ධනය වීම

(ආ) යුරෝපීය වැඩවසම් රාජ්‍ය හා රාජාණ්ඩු ක්‍රම අහෝසි කර බිහිවීම

(ඇ) නූතන යුරෝපයේ බිහිවු ධනවාදී සහ කාර්මික ධනපතිපන්තිවල අභිලාෂ සහ අවශ්‍යතා නියෝජනය කරන රාජ්‍ය මාදිලිය වීම.

(ඈ) පසුව යුරෝපයෙන් පිටත ලෝකයට (ඇමරිකාව සහ ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකානු සමජාවලට පැතිරීම)

II. සමාජවාදී රාජ්‍ය මාදිලිය

(අ) යුරෝපයේ, ලිබරල් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයට විකල්ප ලෙස බිහිවූ රාජ්‍ය මාදිලියකි.

(ආ) මාක්ස්වාදී දේශපාලන න්‍යායායෙන් අනුප්‍රාණය ලැබීය,

(ඇ) පළමුවැනි සමාජවාදි රාජ්‍යය අත්හදා බලන ලද්දේ 1917 විප්ලවයෙන් පසු සෝවියට් රුසියාවෙහිය.

(ඈ) සෝවියට් සංගමයේ, නැගෙනහිර යුරෝපයේ සහ චීනයේ සමාජවාදී ක්‍රමය බිඳ වැටීමෙන් පසුව සමාජවාදි රාජ්‍ය මාදිලිය පිළිබඳ අදහස් දුර්වල වී ඇත.

III. <u>තුලනාත්මක සාකච්ඡාව</u>

i ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජවාදී රාජ්‍ය බිහිවූ වෙනස් ඓතිහාසික සන්දර්භය පිළිබඳ විස්තරයක් කිරීම. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය බිහිවූයේ ධනවාදයේ වර්ධනයත් සමගය. සමාජවාදී රාජ්‍යය බිහි වූයේ පශ්චාත් ධනවාදී රාජ්‍ය මාදිලියක් ලෙසටය. එහෙත් ඒ දෙකම කාර්මික ධනවාදයට එල්ල වූ දෙයාකාරයක ප්‍රතිචාර වූහ.

ii රාජ්‍ය මාදිලි දෙකේ සමාජ/ පංති පදනම් : ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය අනන්‍ය වූයේ, වැඩවසම් ඉඩම් හිමි පන්තිවල තැන ගනිමින් පාලක පන්තිය ලෙස මතු වූ ධනේශ්වර පන්තිය සමගය. සමාජවාදී රාජ්‍යයේ සමාජ පදනම වූයේ කම්කරු පන්තියයි.

iii දේශපාලන අරමුණ: ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ අරමුණ නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයේ කාර්යක්ෂමතාව පැවතීමට අවශ්‍ය සමාජ ආර්ථික, දේශපාලන සහ නෛතික තත්ත්වයන් නිර්මාණය කර පවත්වා ගැනීමටයි. සමාජවාදි රාජ්‍යයේ අරමුණ ඊට වෙනස්ව ධනවාදී ක්‍රමය අහෝසි කර සමාජවාදය ගොඩ ගැනීමයි.

iv ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය සේවය කරන්නේ ධනේශ්වර පන්තියට සහ අනෙකුත් දේපළහිමි සමාජ පන්තිවල අභිලාෂවලටය. ඊට වෙනස්ව, සමාජවාදී රාජ්‍යයේ අරමුණ කම්කරු පන්තියේ සහ අනෙකුත් පීඩිත සහ සූරාකෑමට ගොදුරු වූ සමාජ පන්තිවල අභිලාෂවලට සේවය කිරීමටය.

v ලිබරල් ප්‍රජාත්‍රන්ත්‍රවාදී රාජ්‍යයේ ආණ්ඩුව සහ ආණ්ඩුක්‍රමය පදනම් වන්නේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මය මතය. සමාජවාදී රාජ්‍යවල ආණ්ඩු ක්‍රමය සකස්වීමේ මූලධර්මය වන්නේ නිර්ධන පන්ති අඥාදායකත්වයයි.

vi ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ දේශපාලන බහුත්වවාදය, තරඟය, නිදහස්වරණය, බහු පක්ෂ ක්‍රමය, සීමිත ආණ්ඩුව, බලතල වෙන් කිරීම සහ සංවරණ තුලන ක්‍රමය අවධාරණය කරයි. සමාජවාදී රාජ්‍යයේ දේශපාලනය සහ ආණ්ඩු ක්‍රමය මෙම ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මය සමඟ එඟවන්නේ නැත. නිර්ධන පන්තියේ අඥාදායකත්වය යන සංකල්පය මත පදනම්ව සමාජවාදී රාජ්‍යවල ආණ්ඩුක්‍රමය විසින් සමාජ සහ දේශපාලන බහුත්වවාදය, නිදහස් තරඟය සහ බහු පක්ෂ ක්‍රමය පිළිගනු ලැබෙන්නේ පිළිගන්නේ නැත. සමාජවාදි රාජ්‍යවල සාමාන්‍යයෙන් පවතින්නේ තනි පක්ෂ ක්‍රම වෙති.

vii සමාජවාදි රාජ්‍යය සමාජයේ පන්ති අහෝසි කිරීමෙන් සහ සමාජවාදය ගොඩ නැගීමෙන් පසුව රාජ්‍යයක් ලෙස ඉබේම අහෝසි වී යනු ඇතැයි සමාජවාදීහු අපේක්ෂා කළහ. එම අපේක්ෂාවට පදනම වූයේ, පන්ති ක්‍රමය අහෝසි කරනු ලැබුවාට පසුව, රාජ්‍යයක් පැවතීම සඳහා තර්කය තව දුරටත් නොපවතිනු ඇත යන්නයි. එහෙත් එවැන්නක් සිදු වී නැත. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි රාජ්‍යයේ අනාගතය ගැන මෙවැනි අනාගත විග්‍රහයක් ලිබරල් දේශපාලන න්‍යායේ නැත. ලිබරල් වාදය මනුෂ්‍ය වර්ගයාගේ දේශපාලන ඉරණමේ පොදු සාධකයක් වන බව එය විශ්වාස කරයි. එය ද සිදු වී නැත.


**නිගමනය :**

පිළිතුරෙන් ගොඩ නගන ලද සාකච්ඡාවේ හරයාත්මක සාරාංශයක් එහි ප්‍රධාන තර්කය අවාධාරණය කරමින් ඉදිරිපත් කළ හැකිය. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි සහ සමාජවාදී රාජ්‍ය මාදිලීන් දෙක පිළිබඳව අපේක්ෂකයා සතු ඇගයීම ද මෙහි දී ඉදිරිපත් කළ හැකිය. මෙම රාජ්‍ය ක්‍රම දෙකෙන් නියෝජනය වූයේ එකිනෙකට වෙනස් අරමුණු. දේශපාලන සහ සංවිධානමය ස්වරූප සහ දේශපාලන හා සමාජ ජීවිතයේ වෙනස් මාදිලීන්ය. ඒවා එකිනෙකට තරඟකාරී රාජ්‍ය මාදිලීන් දෙකක් විය. එකක් සළකනු ලැබුවේ අනෙකෙහි විපක්ෂය ලෙසය. එහෙත් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය වඩාත් දීර්ඝ කාලයක් පැවති අතර, සමාජවාදී රාජ්‍යය පැවැත තිබෙන්නේ කෙටි කාලයකි. මෙම රාජ්‍ය මාදිලීන් දෙක ගැන තමන්ගේම ඇගයීම් කෙටියෙන් ඉදිරිපත් කිරීම ද අපේක්ෂයින්ට මෙහිදී කළ හැකිය. එය තුලනාත්මක ඇගයීමක් විය යුතුය.

### 3.3.6. ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.8**

ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.
ඉන්,


ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 40%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් ද

ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 63%ක් ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබාගෙන ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.9**

ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ අංක 03 සඳහා සමස්ත පහසුතාවය 40%කි. එය සාපේක්ෂව අඩු මට්ටමක පවතී. මෙම අඩු අපේක්ෂක සාධනය හේතු ලෙස ඉතා පුළුල් විෂය කරුණු සම්භාරයක් සහිත මාතෘකා දෙකක් වීමත් එකී මාතෘකා තුලනාත්මකව විග්‍රහ කිරීම සඳහා අපේක්ෂකයන් අපොහොසත් වීමත් මෙම ප්‍රශ්නයේ පහසුතාව අඩු වීමට හේතු විය හැකිය. මෙය ගුරුභවතුන්ගේ ද අවධානය යොමුවිය යුතු කරුණකි. තුලනාත්මක පිළිතුරු ලිවීමට සිසුන් පුහුණු කිරීමද සුදුසු ක්‍රියාමාර්ගයකි.

### 3.3.7. ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

**II කොටස**

4. **ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී වර්ධනයට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ විසින් සිදුකරන ලද දායකත්වය සාකච්ඡා කරන්න.**

පිළිතුරේ මූලික විෂය කරුණු

* ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මොනවාදැයි හඳුන්වා දීම
* ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනය අර්ථ දැක්වීම
* ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ වූ මූලික ප්‍රතිසංස්කරණ යෝජනා විස්තර කිරීම
* යටත් විජිත ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී සංවර්ධනය සඳහා ඒවා සිදු කළ දායකත්වය පෙන්වාදීම
* එම දායකත්වය ඇගයීමකට ලක් කිරීම

**අභිමතාර්ථය :**

මෙම ප්‍රශ්නයේ අරමුණ ප්‍රශ්නයට අදාළව අපේක්ෂයින්ගේ විස්තරාත්මක සහ විග්‍රහාත්මක නිපුණතා ඇගයීමට භාජනය කිරීමයි. පිළිතුර සම්පූර්ණ වීමට නම්, ඩොනමෝර් ප්‍රතිසංස්කරණ පිළබඳ දීර්ඝ විස්තරයක් පමණක් තිබීම ප්‍රමාණවත් නැත. එවැනි විස්තරයක්,කෙටියෙන් ඉදිරිපත් කර ප්‍රශ්නයේ ප්‍රධාන කොටස වන ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදි වර්ධනයට සිදු කළ දායකත්වය ගැන කරන සාකච්ඡාවකට වැඩි අවධානයක් යොමු කළ යුතුය.

**හැඳින්වීම**

"හැඳින්වීම" ලිවීමේදි, ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටත් විජිත ලංකාවේ සමාජ සහ දේශපාලන පරිවර්තන පිළිබඳ සනිදර්භය තුළ බිහි වූ වැදගත් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් වු බව ප්‍රකාශ කරමින් "හැඳින්වීම" ආරම්භ කළ හැකිය. විසි වැනි සියවසේ ලංකාවේ සිදු වූ දේශපාලන පරිවර්තනය නිසි ලෙස තේරුම් ගැනීමට නම් ප්‍රජාතන්ත්‍රීයකරණය සඳහා ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලින් කරන ලද දායකත්වය ඇගයීමට ලක් කරීම අත්‍යවශ්‍ය වන බව ප්‍රකාශ කළ හැකිය. ඒ සමගම ඩොනමෝර් ප්‍රතිපත්තිකරණවල ප්‍රජාතාන්ත්‍රික දායකත්වය දේශපාලන සහ සමාජ යන ක්ෂේත්‍ර දෙකෙහිම සිදු වූ බව ද මෙහිදි පෙන්විය හැකිය.

**විෂය කරුණු සහ සාකච්ඡාව**

ප්‍රජාතන්ත්‍රවාදි වර්ධනය යන්න අර්ථ කථනය කිරීම : එයින් අදහස වන්නේ, වැඩවසම් සහ යටත් විජිත සමාජ සහ දේශපාලන තත්ත්වයන් නූතන ප්‍රජාතන්ත්‍රවාදි මූලධර්ම, ආයතන සහ භාවිත තුළින් පරිවර්තනයට පාත්‍රවීමයි. ප්‍රජාතන්ත්‍රවාදය මගින් සිදුවන්නේ ජනතාව දේශපාලන බලයේ මූලාශ්‍රය වීමයි. ජනතාවට සිවිල් සහ දේශපාලන අයිතීන්ද ලැබේ. මේ අතර දේශපාලන ක්‍රමය සහ දේශපාලනඥයෝද, දේශපාලන බලයේ මූලාශ්‍රය වන්නේ මහජනතාවය යන අදහසට අනුව හැඩ ගැසෙති. මේ අනුව, සර්වජන ඡන්ද බලය, මැතිවරණ, නියෝජනය සහ නියෝජන ආණ්ඩුක්‍රමය යන මූලධර්මවලට අනුකූලව තව දේශපාලන අයතන සහ භාවිත ද පැන නගී.

I. ලංකාවේ යටත් විජිත සමාජයේ අවසාන අවධියෙහිදී සිදුවූ ප්‍රජාතන්ත්‍රවාදි පරිවර්තනයට දායකත්වය සැපයූ ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අංග කෙටියෙන් විස්තර කිරීම.

(අ) සර්වජන ඡන්දබලය සහ එහි බලපෑම.

(ආ) නියෝජන ප්‍රජාත්‍රන්තවාදය ව්‍යාප්ත වීම. එය සිදුවූයේ සර්වජන ඡන්දබලය මත පදනම් වූ රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම සහ එහි මන්ත්‍රීවරුන් ප්‍රාදේශීය පදනම මත ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම නිසාය.

(ඇ) විධායක කාරක සභා ක්‍රමය සහ එය විසින් නූතන විධායක ආණ්ඩු ක්‍රමයකට පදනම දැමීම

(ඉ) අමාත්‍ය මණ්ඩලයේ වැදගත්කම - නූතන කැබිනට් ආණ්ඩුක්‍රමයේ ආරම්භය එය විසින් සළකුණු කිරීම

II. ඉහත ප්‍රතිසංස්කරණ තුළින් ප්‍රවර්ධනය කරන ලද ප්‍රජාතාන්ත්‍රික වර්ධනයේ පැති කඩ :

(අ) සර්වජන ඡන්දබලය නිසා ජනතාවට ඔවුන්ගේ සමාජ, ආර්ථික තත්ත්වය නොතකා තමන් දේශපාලන බලයේ සැබෑ හිමිකරුවන් ලෙස සිතා ගැනීමට අවකාශය ලැබීම.

(ආ) පාලකයින්ට පාලන බලය සඳහා අධිකාරබලය සපයන්නේ තමන් බව සමාන්‍ය ජනතාවට පවා වැටහීම.

(ඇ) තමන් ජනතාවට වගකිව යුතු බව පිළිගැනීමට දේශපාලකයින්ට සහ පාලකයින්ට සිදු විම.

(ඈ) ලංකාවේ නූතන දේශපාලන පක්ෂ ක්‍රමය බිහිවීම සඳහා පදනම දැමීම.

(ඉ) සර්වජන ඡන්දබලය සහ නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාප්තිය නිසා පොදු ජනතාව බල ගැන්වීම තුළින් නූතන පුරවැසිභාවය පිළිබඳ හැඟීමට සහ ප්‍රජාතන්ත්‍රවාදි දේශපාලන සංස්කෘතියකට පදනම සැපයීම.

(ඊ) ශ්‍රී ලංකාවේ නූතන සුභසාධනවාදී රාජ්‍යයේ බිහිවීමට පදනම දැමීම.

(ඵ) සුළු ජනතා කොටස්වලට වඩා හොඳ නියෝජන අවකාශයක් ලැබිණ. එහෙත් වාර්ගික නියෝජනය සපුරා අහෝසි කරන ලද අතර, 1936 දෙවැනි රාජමන්ත්‍රණ සභාවේ අමාත්‍ය මණ්ඩලයෙහි නියේජනය සුළු ජනතා කොටස්වලට නොලැබිණි.

(ඒ) ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය සමාජයේ ව්‍යාප්ත වීම නිසා එය සිවිල් සමාජය සඳහා අවකාශය පුළුල් වීමට තුඩු දුන්නේය.


**නිගමනය**

සාකච්ඡාවේ මූලික හරයාත්මක කරුණු සහ සාකච්ඡාව සාරාංශය කරමින් ඩෝනමෝර් ප්‍රතිසංස්කරණ යටත් විජිත ලංකාවේ ප්‍රජාතාන්ත්‍රිකකරණයේ වැදගත් සන්ධිස්ථානයක් වූවාක් පමණක් නොවූ බව පෙන්වා දීම. ලංකාවේ ප්‍රජාත්‍රන්තවාදය ගොඩනැගීමට මේතාක් වැඩියෙන්ම දායකත්ව සිදු කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වූ බව නිගමනය කළ හැකි බව ද පෙන්වා දෙන්න. විසිවැනි සියවසේ මුලදී සෙමින් ආරම්භ වූ ලංකාවේ යටත්විජිත සමාජයේ ප්‍රජාතන්ත්‍රීයකරණ ක්‍රියාවලිය ගුණාත්මක වශයෙන් ඉදිරියට ගියේ ඩෝනමෝර් ප්‍රතිසංස්කරණය තුළිනි. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ තුළින් රටේ දේශපාලන ව්‍යුහයත් දේශපාලනය, යටත් විජිත රාජ්‍යය, රාජ්‍යය සහ සමාජය අතර සම්බන්ධතා ප්‍රජාතන්ත්‍රීය පරිවර්තනයට භාජනය කිරීම යන මේවා ආරම්භ විය. එමෙන්ම තවමත් විජිත පාලන ක්‍රමයක් තිබිය දී පවා පුරවැසිභාවය සහ සිවිල් සමාජය බිහිවීමට පදනම වැටුණේ ද ඒමගිනි.

### 3.3.8. ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.10**

ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





මෙම ප්‍රශ්නයට හිමි ලකුණු සංඛ්‍යාව 20කි.
ඉන්,
ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 14%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 59%ක්ම ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.11**

ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 04 සඳහා සමස්ත පහසුතාවය 52% කි. එය මධ්‍යස්ථ මට්ටමකි. ජනප්‍රිය මාතෘකාවක් වුවද ප්‍රශ්නයට අදාළව කරුණු ගොනු කිරීමේ දී බොහෝ අපේක්ෂකයන් දුර්වලතාවයක් දක්වා ඇත. මෙවැනි ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් පන්ති කාමරයේදී පුහුණු කිරීම වැදගත්ය.

### 3.3.9. ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**05. සෝල්බරි ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි තිබූ වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතියට අයත් අංග කවරේදැයි විස්තර කරන්න.**

**අභිමතාර්ථය :**

මෙම ප්‍රශ්නයෙන් අරමුණු කරන්නේ (i) වෙස්මින්ස්ටර් මාදිලිය සහ සෝල්බරි ආණ්ඩුක්‍රමය පිළිබඳවත්, ඒ දෙකෙහි අන්තර් සම්බන්ධතා පිළිබඳවත් අපේක්ෂකයින් සතු දැනුම සහ තුලනාත්මක හැකියාව පරීක්ෂා කිරීමයි.

**පිළිතුරේ මූලික විෂය කරුණු**

* වෙස්ට්මින්ස්ටර් මාදිලිය අර්ථ දැක්වීම
* වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලියේ ලක්ෂණ හඳුනා ගැනීම
* සෝල්බරි ව්‍යවස්ථාවේ තිබි වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ හඳුනාගෙන විස්තර කොට සකාච්ඡා කිරීම

**හැඳින්වීම :**

ශ්‍රී ලංකාවේ සෝල්බරි ආණ්ඩු ක්‍රමය සකස් කරන ලද්දේ බ්‍රිතාන්‍ය වෙස්ට්මින්ස්ටර් මාලිදියට අනුවය. එසේ වුවත් එම රටවල් දෙකෙහි ඓතිහාසික පසුබිම එකිනෙකට වෙනස් බව සඳහන් කරමින් "හැඳින්වීම" ඡේදය ආරම්භ කළ හැකිය. බ්‍රිතාන්‍යය කාර්මික වශයෙන් දියුණු සහ ආර්ථික සහ දේශපාලන වශයෙන් බලගතු රාජ්‍යයක් වූ අතර, ශ්‍රී ලංකාව අඩු දියුණු බ්‍රිතාන්‍ය යටත් විජිතයක් විය. එහෙත් යටත් විජිත පාලකයයින් මෙන්ම ලංකාවේ දේශීය ප්‍රභූ පන්තිය ද විශ්වාස කළේ වෙස්ට්මින්ස්ටර් මාදිලිය ලංකාව සුදුසු ආණ්ඩුක්‍රමයක් බවයි. ලංකාවේ 1972 දක්වා ක්‍රියාත්මක වූයේ එම සෝල්බරි ආණ්ඩු ක්‍රමයයි. 1972 සහ 1978 ආණ්ඩුක්‍රම වලද සෝල්බරි/ වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ තිබේ.

**විෂය කරුණු සාකච්ඡාව**

වෙස්ට්මින්ස්ටර් මාදිලිය යනුවෙන් බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමය මෙන්ම බ්‍රිතාන්‍යයේ ඇති කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය ද අදහස් වේ. වෙස්ට්මින්ස්ටර් යන නම ලැබී ඇති තිබෙන්නේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ලන්ඩන් නුවර එම නම ඇති ස්ථානයේ පිහිටා තිබෙන නිසාය. වෙස්ටර්මින්සටර් මාදිලිය ලෝකයේ ඇති ප්‍රධාන පෙළේ ආණ්ඩු මාදිලියකි. බ්‍රිතාන්‍ය යටත් විජිත දේශපාලන නිදහස ලැබූ පසු එම රටවල දේශපාලන ක්‍රමය සකස් කරන ලද්දේ මෙම වෙස්ට්මින්ස්ටර් මාදිලියට අනුවය. ශ්‍රී ලංකාවේ නිදහසින් පසු ඇති කරන ලද පළමු වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ද වෙස්ට්මින්ස්ටර් මාදිලියට අනුකූල වූයේ එබැවිනි.

i. වෙස්ට්මින්ස්ටර් මාදිලියේ ප්‍රධාන අංග

(අ) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය

(ආ) කැබිනට් ආණ්ඩුක්‍රමය සහ කැබිනට් ඇමතිවරුන් මාර්ගයෙන් පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුව මෙහෙයවනු ලැබීම

(ඇ) කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහික ලෙස වගකීම

(ඈ) අග්‍රාමාත්‍යවරයා "සමානයන් අතරේ ප්‍රමුඛයාය" යන මූලධර්මය

(ඉ) පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය

(ඊ) ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය

(එ) නිදහස් අධිකරණය. එහෙත් පාර්ලිමේන්තුවේ පණත්වල වලංගුභාවය පරීක්ෂාකිරීමේ අධිකරණ නිරීක්ෂණ බලය අධිකරණයට නොතිබීම

(ඒ) කේවල ඡන්ද ක්‍රමය මත පදනම් වූ ද්විපක්ෂ ක්‍රමය

ii සෝල්බරි ව්‍යවස්ථාවෙහි ගැබ්ව තිබූ වෙස්ට්මින්ස්ටර් අංග පෙන්වාදී ඒවා විස්තර කර සාකච්ඡා කිරීම: කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, ආණ්ඩුවේ ඒකීයවාදී රාමුව, කැබිනට් මණ්ඩය දේශපාලන විධායකය වීම, කැබිනට් මණ්ඩලය සහ අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් පත් කරනු ලැබීම, අගමැතිවරයා කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම, රාජ්‍ය නායකයා නාමික විධායකයේ ප්‍රධානියා වීම, ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය, ස්වාධීන අධිකරණය, ස්වාධීන රාජ්‍ය සේවය. මෙහිදී ව්‍යවස්ථාවේ වගන්ති උපුටා දැක්වීම අවශ්‍යම නැත. එහෙත් නිවැරදි ලෙස වගන්ති උපුටා දක්වන පිළිතුරුවලට සුදුසු අමතර ලකුණු ලබා දිය හැකිය.

iii සෝල්බරි ව්‍යවස්ථාව, වෙස්ට්මින්ස්ටර් මාදිලියෙන් වෙනස් වන අවස්ථා ගැන ද සමහර අපේක්ෂකයින් සාකච්ඡා කළ හැකිය. නිදසුනක් ලෙස දෙවැනි මන්ත්‍රී මණ්ඩලය සෙනෙට් සභාව ලෙස හැඳින්වීම, ලංකාවේ අධිකරණයෙහි පාර්ලිමේන්තු පනත් විමර්ශනය කිරීමේ බලය අප්‍රකාශිතව තිබීම, පාර්ලිමේන්තු පරමාධිපත්‍යයට සීමා (29 වැනි වගන්තිය). එවැනි සාකච්ඡාවක් තිබේ නම් එය පිළිතුරට අදාළ ලෙස සළකා ලකුණු ප්‍රදානය කරන්න.


**නිගමනය**

පිළිතුරෙහි ගොඩනගා ඇති සාකච්ඡාව හරයාත්මක ලෙස සාරාංශ කරමින් සෝල්බරි ව්‍යවස්ථාව බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ උරුමයක් ලෙස ද දැක්විය හැකිය. එමෙන්ම වෙස්ට්මින්ස්ටර් ලක්ෂණ පැවති නිසාම සෝල්බරි ව්‍යවස්ථාව විවේචනයට පාත්‍ර වූ බව ද කිව හැකිය.

### 3.3.10. ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.12**

ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු ප්‍රමාණය 20කි. ඉන්,


ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 41%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 26%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 67%ක් ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබාගෙන ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.13**

ප්‍රශ්න අංක 5 සඳහා පහසුතාව




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

ප්‍රශ්න අංක 5 සඳහා සමස්ත පහසුතාවය 39%කි. එය අඩු මට්ටමකි. වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය පිළිබඳ බොහෝ අපේක්ෂකයන් සතුව පුළුල් අවබෝධයක් නොමැති වීම මෙයට හේතු විය හැකිය.

**3.3.11. ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර**

**6. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවති ව්‍යවස්ථාදායකය, 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පැවති ව්‍යවස්ථාදායකයෙන් වෙනස් වූයේ කෙසේදැයි විමසන්න.**

**අභිමතාර්ථ :**

මෙම ප්‍රශ්නයෙහි අරමුණ වන්නේ (අ) සෝල්බරි සහ ප්‍රථම ජනරජ ව්‍යවස්ථා දෙක ගැන පොදුවේත්, ඒවායේ වයවස්ථාදායකය ගැන විශේෂයෙනුත් අපේක්ෂකයන් සතු දැනුමත්, (ආ) එම ව්‍යවස්ථා තේරුම් ගැනීමේදී ඔවුන් සතු තුලනාත්මක හැකියාවනුත් ඇගයීමට ලක් කිරීමයි.

පිළිතුරට ඇතුළත් විය යුතු විෂය කරුණු

i. සෝල්බරි ව්‍යවස්ථාදායකයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලයන් පැහැදිලි කිරීම.
ii. පළමු ජනරජ ව්‍යවස්ථාදායකයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලයන් පැහැදිලි කිරීම.
iii. ව්‍යවස්ථා දෙක පිළිබඳ සංසන්දනාත්මක සාකච්ඡාව.

**හැඳින්වීම**

මෙම ව්‍යවස්ථා දෙක එකිනෙකට වෙනස් පසුබිම් දෙකක් යටතේ පණවනු ලැබූ බවත්, ඒවායේ වෙනස් අරමුණු පැවති බවත්, පවසමින් පිළිතුර ආරම්භ කළ හැකිය. එම පසුබිම් තත්ත්වයන් විසින් ව්‍යවස්ථා දෙකේ මූලික රාමුවත්, ව්‍යවස්ථාදායකයන් දෙකෙහි ස්වභාවයත් තීරණය කරන ලද බව ද කිව හැකිය. නිදසුනක් ලෙස සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිර්මාණය කරන ලද්දේ යටත් විජිත පාලනයේ සිට දේශීය ප්‍රභූන් වෙතට දේශපාලන බලය මාරු කිරීමේ යාන්ත්‍රණයක් ලෙසය. ලංකාවේ නව දේශපාලන ක්‍රමයක් ගොඩ නගන ලද්දේ එය විසිනි. ඊට වෙනස්ව ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙහි අරමුණ වූයේ, සෝල්බරි ව්‍යවස්ථාව විසින් නිර්මාණය කර තිබුණු ආණ්ඩු ක්‍රම ව්‍යුහය වෙනුවට නව ව්‍යුහයක් ස්ථාපනය කිරීමටයි. එයට පැවතියේ යටත් විජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උරුමයෙන් කැඩී වෙන් වී, යටත් විජිතහරණය ඉදිරියට ගෙන යෑමේ අභිප්‍රායකි.

ව්‍යවස්ථාදායකයන් දෙකේ වෙනස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය මූලයන්. සෝල්බරි ව්‍යවස්ථාවෙහි පදනම වූයේ මඳ වෙනස්කම් සහිත වෙස්ට්මින්ස්ටර් මාදිලියයි. එය බ්‍රිතාන්‍ය කැබිනට් පාර්ලිමේන්තු සම්ප්‍රදාය සම්පූර්ණයෙන් අනුගමනය කළාය. පළමු ජනරජ ව්‍යවස්ථාව වෙස්ට්මින්ස්ටර් මාදියෙන් හරයාත්මකව වෙනස් විය. එය විසින් නිර්මාණය කරන ලද්දේ වෙස්ට්මින්ස්ටර් සහ සමුහාණ්ඩු යන මාදිලි දෙක මිශ්‍ර කර ගත් දෙමුහුන් (hybrid) ව්‍යවස්ථාවකි.

II පළමු ජනරජ ව්‍යවස්ථාවේ සමූහාණ්ඩුවාදී ලක්ෂණ මොනවාදැයි කෙටියෙන් පෙන්වා දීම. නිදසුන් ලෙස ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා වීම, පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය පිළිබඳ අධිකරණ විමර්ශන බලය තහනම් කිරීම.

III ව්‍යවස්ථාදායකයන් දෙක සන්සන්දනය කිරීම

(a) සංයුතිය : සෝල්බරි ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි, දෙවන ජන රජය යටතේ එය ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයකි.

(b) පාර්ලිමේන්තු බලතල :

සෝල්බරි ව්‍යවස්ථාදායකයඃ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය සීමා වීම.

දෙවන ජනරජ ව්‍යවස්ථාදායකයඃ පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාදායක පරමාධිපත්‍යය හිමිවීම.

(c) පාර්ලිමේනතුවේ සාමාජියන්

සෝල්බරි ව්‍යවස්ථාදායකයඃ - ජන්දයෙන් තෝරාපත් කර ගත් සහ නාමකරණය කරන ලද මන්ත්‍රීවරුන් දෙවර්ගයම.

පළමු ජනරජ ව්‍යවස්ථාව - මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා ලද සමාජිකයන් පමණි.

(d) සෝල්බරි ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික වූයේ, පාර්ලිමේන්තුව සමන්විත විය යුතුවන්නේ, සාමාන්‍ය ජනතාව මහජන මන්ත්‍රී මණ්ඩලය මාර්ගයෙනුත්, ඉඩම් හිමි ධනවත් සහ වංශාධිපති ප්‍රභූපන්තිය සාමි මන්ත්‍රී මණ්ඩලය මාර්ගයෙනුත් සමන්විත නියෝජන ආයතන දෙකකින් විය යුතුය යන බ්‍රිතාන්‍ය සම්ප්‍රදායට අනුවය. ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය ඒක මාණ්ඩලික වූයේ මෙම බ්‍රිතාන්‍ය පන්ති සම්ප්‍රදාය බැහැර කරමිනි. එයින් පිළිබිඹු වූයේ සාමාජයේ පන්ති බෙදීම් මත ව්‍යවස්ථාදායකය සකස් කිරීම නොව, සමාජ සමානත්වය ව්‍යවස්ථාදායකයේ සංයුතියෙන් ප්‍රකාශ විය යුතුය යන සමාජවාදී මූලධර්මයයි.

(e) පළමුවැනි ජනරජ ව්‍යවස්ථාව අනුව ජාතික රාජ්‍ය සභාව මහජන පරමාධිපත්‍යය ක්‍රියාත්මක කරන ප්‍රධාන ආයතනයයි.

සෝල්බරි ව්‍යවස්ථාවෙහි පාර්ලිමේන්තුව සම්බන්ධව මෙවැනි විධිවිධානයන් තිබුණේ නැත. පළමු ජනරජ ව්‍යවස්ථාවන්ට අනුව පාර්ලිමේන්තුවේ සියලුම සාමාජිකයින් ඡන්දයෙන් පත්වූ මහජන නියෝජිතයින් ය. සෝබරි ව්‍යවස්ථාවට අනුව බ්‍රිතාන්‍යයේ මහ රැජින පාර්ලිමේන්තුවේ කොටසකි ( 7 වැනි වගන්තිය)


**නිගමනය :**

ව්‍යවස්ථාදායකයන් දෙක අතර පැවති වෙනස්කම් පිළිබඳ ඉහත කී සාකච්ඡාව හරයාත්මකව සාරාංශ කොට, එහි ප්‍රධාන නිගමනවලින් මතු කරන, වෙනස් කම් එම ව්‍යවස්ථාදාකයන් පිළිබඳ වෙනස් මතවාද දෙකක් මත පදනම් වූ නිසා බව ප්‍රකාශ කළ හැකිය. පළමු වැනි මතවාදි පදනම වෙස්ට්මින්ස්ටර් පාර්ලිමේන්තු මූලධර්මයයි. දෙවැන්න වෙස්ට්මිනිස්ටර් සහ සමූහාණ්ඩුවාදී මූලධර්මවල මිශ්‍රණයකි.

### 3.3.12. ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.14**

ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු සංඛ්‍යාව 20කි. ඉන්,


ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 29%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 27%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 19%ක් ද

ලෙස අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. ලකුණු 10 හෝ ඊට වැඩියෙන් ලබාගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 46%කි.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.15**

ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 06 සඳහා සමස්ත පහසුතාවය 57%කි. මෙම ප්‍රශ්නයට අදාළ ව්‍යවස්ථාදායක ආයතන දෙකේ සංයුතිය, බලතල, ආයතනික ව්‍යුහය පිළිබඳ සංසන්දනාත්මකව කරුණු ඉදිරිපත් කිරීම සහ බලතල පිළිබඳව අවධාරණයකින් යුතුව පිළිතුරු ලිවීම සිදු වූයේ නම් තවදුරටත් අපේක්ෂක සාධනය වැඩි කිරීමට හැකිව තිබුණි. එවැනි සංසන්දනාත්මක පිළිතුරු ලිවීමට සිසුන් පුහුණු කිරීම ද ගුරුභවතුන්ගේ අවධානය යොමුවිය යුතු කරුණකි. ඉගැන්වීමේදී ද ඒ ගැන අවධානය යොමු කෙරෙන්නේ නම් ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේ දැනුම් මට්ටම ඉහළ නැංවිය හැකිය.

### 3.3.13. ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

**07. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ ව පහත දක්වා ඇති මාතෘකාවලින් දෙකක් සාකච්ඡා කරන්න.**

(i) 13 වන සංශෝධනයෙහි ප්‍රධාන ලක්ෂණ

(ii) ජනමත විචාරණය පිළිබඳ විධිවිධාන

(iii) ප්‍රංශයේ පස්වන සමූහාණ්ඩු ව්‍යවස්ථාව (1958) සහ ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාව (1978) යටතේ ස්ථාපිත කරන ලද ජනාධිපති ක්‍රම අතර ඇති සමානතා

**අභිමතාර්ථය :**

මෙම ප්‍රශ්නයේ අරමුණ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විවිධ පැති පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුමත්, එහි විවිධ පැති පිළිබඳව විස්තර කිරීමට ඇති නිපුණතාවත් පරීක්ෂා කිරීමයි.

**(i) දහතුන්වැනි සංශෝධනයෙහි ප්‍රධාන ලක්ෂණ**

**විෂය පිළිතුරෙහි කරුණු :**

(i) 13 වැනි සංශෝධන පසුබිම සහ අරමුණ හඳුන්වාදීම.

(ii) බලය බෙදා දීම සකස් වී ඇති ආකාරය සාකච්ඡා කිරීම.

(iii) පළාත් සභාක්‍රමය යනු කුමක්දැයි හඳුන්වා දීම.

**(අ) හැඳින්වීම :**

13 වැනි සංශෝධනය හඳුන්වා දෙන ලද්දේ ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විසඳුමක් සැපයීමේ අරමුණු සහිතව බව ප්‍රකාශ කරමින් ආරම්භ කෙරෙන කෙටි හැඳින්වීමක්. එය පරිපාලනය විමධ්‍යගත කිරීමෙන් ඈතට යන බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමයක් නිර්මාණය කිරීම තුළින් ලංකාවේ රාජ්‍යයේ ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම අරමුණු කරගත් ප්‍රථම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ද විය.

**<u>විෂය කරුණු සාකච්ඡාව</u>**

(I) 13 වැනි සංශෝධනයයෙහි පසුබිම පිළිබඳ කෙටි විස්තරයක් : එම පසුබිම් සාධක නම් ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් යෝජනා කිරීම සඳහා ගනු ලැබූ ඉන්දියානු ප්‍රයත්නය, බලය විමධ්‍ය ගත කිරීම පිළිබඳව අදහස් මතු වීම. බලය විමධ්‍යගත කිරීම පදනම් කොට ගත් දේශපාලන විසඳුමක් සඳහා ඉන්දියානු යෝජනා සහ ලංකා රජයේ ප්‍රතිචාරය; දිස්ත්‍රික් සංවර්ධන සභාවලට වඩා පුළුල් බලයක් සහිත පලාත් සභා ක්‍රමයක් ඇති කිරීම.

(II) ඒකීය රාජ්‍යයක් ඇතුළත බලය විමධ්‍යගත කිරීමේ මූලධර්මය: 13 වැනි සංශෝධනය පළාත් නවයකට බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමයක් නිර්මණය කළ ද ව්‍යවස්ථාවේ ඒකීය රාජ්‍ය වගන්තිය සංශෝධනයට භාජනය වූයේ නැත.

(III) 13 වැනි සංශෝධනයෙන් ඇති කරන ලද පලාත් සභාක්‍රමය: ඉන්දියානු සන්ධිය ක්‍රමය ළඟින්ම අනුගමනය කළ නමුදු, එය සන්ධීය ක්‍රමයක් ලෙස හඳුන්වාගන්නේ නැත. පලාත් සභා ක්‍රමය නව දේශපාලන අත්හදා බැලීමක්ද විය.

(IV) ඉන්දියානු ව්‍යවස්ථාවේ මෙන්ම බලතල ලැයිස්තු තුනක් යටතේ බලය විමධ්‍යගත කිරීම් (මධ්‍යම, පළාත් සභා, සහ සමගාමී) (අපේක්ෂකයින් මෙම බලතල නිවැරදි ලෙස දක්වා ඇත්දැයි බලන්න.)

(V) 13 වැනි සංශෝධන පලාත්වලට ව්‍යවස්ථාදායක සහ විධායක බලය විමධ්‍යගත කර ඇතත්, ඒ මගින් සන්ධිය ව්‍යවස්ථාවක් නිර්මාණය කර නැත. පලාත් සභාවලට ඇත්තේ, ප්‍රඥප්ති සෑදීමේ සීමිත ව්‍යවස්ථාදායක බලයකි. ඒවා මධ්‍යම පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත්ය.

(VI) විධායක බලතල ද ප්‍රධාන අමාත්‍යවරයෙකු සහිත අමාත්‍ය මණ්ඩලයක් වෙත විමධ්‍යගත කෙරිණ. පළාත් විධායක බලයට පලාත් රාජ්‍ය සේවයක් ද තිබේ.

(VII) අධිකරණ බලය විමධ්‍යගත කොට ඇත්තේ පළාත්බද මහාධිකරණයක් සහ පහළ අධිකරණ තුලිනි.

**නිගමනය**

13 වැනි සංශෝධනය ලංකාවේ රාජ්‍යයේ ව්‍යුහය යලි සකස් කිරිම තුඩු දුන් එකම සංශෝධනය බවත්, එහෙයින් එහි විශාල නෛතික මෙන්ම දේශපාලන වැදගත් කමක් පවතින බවත් නිගමනයෙන් ප්‍රකාශය කළ හැකිය. 13 වැනි සංශෝධනය වෙතින් හඳුන්වා දෙන ලද පළාත්සභා ක්‍රමය නිසා ලංකාවේ රාජ්‍යයේ ව්‍යුහාත්මක සැකැස්මේ වෙනසක් ඇති විය. එනම් මධ්‍යගත ව්‍යුහයක් තුළ විමධ්‍යගත ව්‍යුහයන්ද නිර්මාණය කිරීමයි 13 වැනි සංශෝධනයට කොතරම් විවේචන සහ විරෝධතා එල්ල වුවද, එය දශක තුනක් තිස්සේ අඛණ්ඩව පැවතී තිබේ.

**(ii) ජනමත විචාරණය පිළිබඳ විධිවිධාන**

විෂය කරුණු අන්තර්ගතය :

(i) 1978 මුල් ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණය පිළිබඳ විධි විධාන හඳුනා ගැනීම

(ii) නිතී සම්පාදකය සහ උපදේශක ජනමත විචාරණය විස්තර කර ඒවා 1978 ව්‍යවස්ථාවේ පවතින ආකාරය විස්තරකොට සාකච්ඡා කිරීම

(iii) 19 වැනි සංශෝධනය විසින් සිදු කරන ලද වෙනස හඳුන්වා දීම

**හැඳින්වීම :**

ජනමත විචාරණය සෘජු ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රණයක් ලෙස අර්ථකථනය බල හැකිය. එය නීති සම්පාදන කාර්යයයේදී ජනතාවට සෘජුව සහභාගිවීමට අවස්ථාව ලබාදෙයි. නූතන නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල ජනමත විචාරණය කලාතුරකින් භාවිතා කරන යාන්ත්‍රණයකි. එය ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියට 1978 දී හඳුන්වා දෙන ලද නව අංගයකි. 1978 දී ජනමත විචාරණය පිළිබඳව ජනාධිපතිවරයා සතු වූ බලය 19 වැනි සංශෝධනය මගින් සීමා කරන ලදී.

**විෂය කරුණු සහ සාකච්ඡාව**

(I) 1978 ව්‍යවස්ථාව ලංකාවට ජනමත විචාරණය හඳුන්වාදුන් පළමු ව්‍යවස්ථාවයි.

(II) 1978 ව්‍යවස්ථාවේ ජනමත විචාරයට අදාළව ප්‍රධාන වගන්ති වන්නේ 85, 86 සහ 87 යි

(III) 1978 ව්‍යවස්ථාවට අනුව ජනමත විචාරණය සඳහා ප්‍රධාන ආකාර දෙකක් තිබේ.

(අ) නීති සම්පාදනය/ ව්‍යවස්ථාදායකමය ජනමත විචාරණය (85 වගන්තිය)

(ආ) උපදේශාත්මක ජනමත විචාරණය (86 වගන්තිය)

(IV) ව්‍යවස්ථාදායකමය ජනමත විචාරණය යටතේ, ශ්‍රේෂ්ඨාධිකරණය හෝ කැබිනට් මණ්ඩලය මහජනතාවගේ අනුමැතිය ලැබිය යුතු යැයි තීරණය කරන කරුණක් ජනාධිපතිවරයා විසින් මහජන අනුමැතිය සඳහා ඉදිරිපත් කළ හැකිය.

කැබිනට් මණ්ඩලය ජනමත විචාරණයකට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර කැමැත්ත තිබිය යුතුය.

මෙසේ ජනමත විචාරණය සඳහා ඉදිරිපත් කරන ලද පනත් කෙටුම් පතක් නීතියක් බවට පත්වන්නට නම් අවශ්‍යවන්නේ වලංගු ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවක් සරල බහුතරයකි. එසේ වුවත් ජනමත විචාරණයේදී ඡන්දය දී ඇති ප්‍රමාණය ලියා පදිංචි වී ඇති ඡන්දදායක සංඛ්‍යාවෙන් $^{2}/_{3}$කට අඩු වී ඇති අවස්ථාකදී, එම පණත් කෙටුම්පත සම්මත වීම සඳහා ඊට පක්ෂව ප්‍රකාශ කර ඇති ඡන්ද ප්‍රමාණය මුළු ඡන්ද සංඛ්‍යාවෙන් $^{1}/_{3}$ක්වත් විය යුතුය.

(V) 1978 ව්‍යවස්ථාවේ තිබෙන 85 (2) වගන්තිය 19 වැනි සංශෝධනය මගින් අහෝසි කරන ලදී. එම වගන්තියට අනුව පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද පණත් කෙටුම්පතක්, ජනාධිපතිවරයාට සිය අභිමතය පරිදි ජනමත විචාරණයට යොමු කළ හැකි විය. එවැන්නකට කැබිනට් අනුමැතියද අවශ්‍ය නොවීය.

මෙම වගන්තිය පිළිබඳ විශාල විවේචනයක් එල්ල වී තිබීම නිසා 19 වැනි සංශෝධනය විසින් එය අහෝසි කරන ලදී. එම විවේචනය නම් පාර්ලිමේන්තුව අභිබවා යන ව්‍යවස්ථාදායක බලයක් ඒ මගින් ජනාධිපතිවරයාට ලබා දී තිබීමයි.

උපදේශන ජනමත විචාරණය : 86 වැනි වගන්තිය යටතේ ඇති උපදේශන ජනමත විචාරණය යටතේ, ජාතික වැදගත්කමක් තිබේ යැයි ජනාධිපතිවරයා සිතන ඕනෑම කරුණක් ජනමත විචාරණයක් සඳහා ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයාට බලය තිබේ. මේ වගන්ති යටතේ ජනතාව අනුමත කළ කරුණක් නීතියක් බවට පත් නොවීම විශේෂත්වයකි. මේ මගින් යම් කිසි ප්‍රතිපත්තිමය කරුණක් පිළිබඳව මහජනතාවගේ අදහස් දැන ගැනීමේ අවස්ථාව ජනාධිපතිවරයාට ලැබේ. තමන්ගේම දේශපාලන පක්ෂය හෝ පාර්ලිමේන්තුව හෝ රාජ්‍ය ප්‍රතිපත්ති කරුණක් සම්බන්ධව කරන කේවල් කිරීමේදී ජනාධිපතිවරයාට උපදේශක ජනමත විචාරණය අවියක් ලෙස භාවිත කළ හැකිය.

**නිගමනය :**

ජනමත විචාරණය 1978 ව්‍යවස්ථාවේ තිබෙන විවාදාත්මක වගන්තියකි. විවේචකයින්ගේ තර්කය වූයේ එය හඳුන්වා දෙන ලද්දේ පාර්ලිමේන්තුව අභිබවා යන නිති සම්පාදක බලයක් ජනාධිපතිවරයාට ලබා ගැනීම යන අරමුණ මත බවයි. 19 වැනි සංශෝධනය මගින් 85 (2) වගන්තිය අහෝසි කිරීම මෙම විවේචනයට දැක්වුණ එක් ප්‍රතිචාරයක් විය. ඊට අමතරව ජනමත විචාරණය ලංකාවේ ක්‍රියාත්මක කර ඇත්තේ එක් අවස්ථාවක් පමණි. එය 1982 එවකට තිබුණ පාර්ලිමේන්තුවේ ධුරකාලය තවත් වාරයකට දීර්ඝ කර ගැනීමටය. මේ මගින් සිදුවූයේ ජනමත විචාරණය යන සංකල්පයට ලංකාවේ අප කීර්තියක් ලැබීමයි.

**(iii) ප්‍රංශයේ පස්වන සමූහාණ්ඩු ව්‍යවස්ථාව (1958) සහ ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාව (1978) යටතේ ස්ථාපිත කරන ලද ජනාධිපති ක්‍රම අතර ඇති සමානතා**

අභිමතාර්ථ : මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ 1978 ශ්‍රී ලංකාවේ දෙවැනි ජනරජ ව්‍යවස්ථාවට ප්‍රංශයේ පස්වෙනි සමූහාණ්ඩු මාදිලි ආදර්ශයක් වීම පිළිබඳව අපේක්ෂකයින් සතු අවබෝධය සහ දැනුම පරීක්ෂා කිරීමයි.

පිළිතුරේ විෂය කරුණු

* ව්‍යවස්ථා දෙකෙහි සමානතා විස්තර කිරීම
* ව්‍යවස්ථා දෙකෙහි අරමුණුවල සමානතා පෙන්වා දීම
* ව්‍යවස්ථා දෙක කෙටියෙන් හඳුන්වා දීම

**හැඳින්වීම :**

ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩු මාදිලියෙන් ආභාසය ලැබීය. මෙම ව්‍යවස්ථා දෙකම නිර්මාණය කරන ලදදේ ඒවාට මූලික වූ දේශපාලන නායකයාගෙන් පුද්ගලික හා දේශපාලන අභිලාශවලට සේවය කිරීමටය. ව්‍යවස්ථා දෙකෙන්ම අපේක්ෂා කරන ලද්දේ බ්‍රිතාන්‍ය සහ ඇමරිකානු ව්‍යවස්ථා මාදිලිවලට වෙනස් ශක්තිමත් ජනාධිපති පාලන කේන්ද්‍රයක් ගොඩ නැගීමයි.

**විෂය කරුණු සාකච්ඡාව:**

i විධායක ජනාධිපති ක්‍රමය : ව්‍යවස්ථා දෙකෙන්ම අපේක්ෂා කෙරුණේ විධායකය ශක්තිමක් කරන ජනාධිපති ආණ්ඩුක්‍රමයක් නිර්මාණය කිරීමයි. විධායකය ශක්තිමක් කිරීමේ මෙම ප්‍රවණතාව නිසා ලංකාවේ ජනාධිපති ක්‍රමය විධායක ජනාධිපති ක්‍රමය ලෙස හැඳින්විණ.

ii ව්‍යවස්ථා මාදිලි දෙකෙහිම රාජ්‍ය බලයේ කේන්ද්‍රීය ආයතන සහ ධූරය වන්නේ ජනාධිපතිවරයායි. දේශපාලන බලය කේන්ද්‍ර ගත වූයේ ජනාධිපති ධූරය දරණ පුද්ගලයා වටාය.

iii මෙම ආණ්ඩුක්‍රම දෙකෙහිම, පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාට යටත් සහ ද්වීතියක වන එකකි. ජනාධිපතිවරයාගේ පත් වීම සහ ධූර අවසානය ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනය. එම ආයතන දෙක පත්වන්නේ සමගාමීව සිදුවන මැතිවරණවලින් නොවේ. විධායකයට ව්‍යවස්ථාදායකය මත රඳා පැවතීම අවශ්‍ය නැත.

මෙය වඩාත් පැහැදිලිව පෙනෙන්නේ බ්‍රිතාන්‍යයේ කැබිනට් පාර්ලිමේන්තු ක්‍රමය සමග සසඳන විටය. බ්‍රිතාන්‍ය ක්‍රමය තුළ අගමැතිවරයාත්, දේශපාලන විධායකය වන කැබිනට් මණ්ඩලයත් තෝරා ගැනේනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරිනි. ඔවුන්ට පාර්ලිමේන්තුවට වගකීමට ව්‍යවස්ථාමය බැඳීමක් තිබේ. එහෙත් ප්‍රංශ ක්‍රමයට අනුව, අගමැතිවරයාක් කැබිනට් අමාත්‍යවරුනුත් පාර්ලිමේන්තුව පිටතින් පත් කිරීමට ජනාධිපතිවරයාට බලය තිබේ. එබැවින් ඔවුන්ගේ මූලික වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවට නොව ජනාධිපතිවරයාටය. ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාව මෙම ප්‍රංශ මාදිලිය සම්පූර්ණයෙන් අනුගමනය නොකළත්, එය විසින් කරන ලද්දේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වඩා බලසම්පන්න කිරීමය. ශ්‍රී ලංකාවේ ක්‍රමයට අනුව, පාර්ලිමේන්තුවේ සමාජිකයකු නොවන ජනාධිපතිවරයා, කැබිනට් මන්ඩලයේ ප්‍රධානියා ද, එහි වෙනත් සමාජිකයකු ද වෙයි. එහෙත් ඔහු පාර්ලිමේන්තුවට වග නොකියයි.

iv ආණ්ඩුක්‍රම දෙකෙහිම, ඇමරිකානු ක්‍රමය වැනි බලතල වෙන් ක්‍රමක් හෝ සංවර්ණ සහ තුලන ක්‍රමයක් නැත.

v ආණ්ඩුක්‍රම දෙකමට පොදු ලක්ෂණයක් වූයේ ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීන විධායකයක් නිර්මාණය කරමින්, ආණ්ඩුවේ ස්ථාවරභාවය සහතික කිරීමයි. ව්‍යවස්ථා දෙකෙහිම අරමුණ වූයේ "දේශපාලන ස්ථාවරභාවය" සහතික කරනු සඳහා විධායකය, ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීන කිරීමයි.

vi ජනාධිපතිවරයාගේ බලය පාලනය කිරීමට පාර්ලිමේන්තුව සතු හැකියාව ඉතා දුර්වලය. ජනාධිපතිවරයා ඉවත් කිරීමේ දෝෂාභියෝග ක්‍රියාවලිය 1978 ව්‍යවස්ථාව ලබාගෙන ඇත්තේ ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩු ව්‍යවස්ථාවෙනි. ව්‍යවස්ථා දෙහිම ජනාධිපතිවරයා ඉවත් කිරීමේ එම ක්‍රියාවලිය දුෂ්කර සහ සංකීර්ණ එකකි.

vii "ජනමත විචාරණය" ප්‍රංශයේ පස්වැනි සමූහාණ්ඩු ව්‍යවස්ථාවේ ආදර්ශය ලබාගෙන 1978 ව්‍යවස්ථාවට ලබා ගන්නා ලද තවත් විධිවිධානයකි. ප්‍රංශයේ ජනාධිපති ඩිගෝල් ජනමත විචාරණය යොදාගත්තේ, ව්‍යවස්ථාදායකය අභිබවා ජනාධිපතිවරයාගේ බලය පවත්වා ගැනීමේ මාධ්‍යයක් ලෙසය. 1978 ව්‍යවස්ථාවට ද ජනමත විචාරණය හඳුන්වා දීමේ අරමුණ වූයේ පාර්ලිමේන්තුව අභිබවා ඍජුව මහජනතාවගේ අනුමැතිය ලබා නීති පැණවීමේ බලය ජනාධිපතිවරයා වෙතට ලබා ගැනීමේ අරමුණ ද සහිතවය.


**නිගමනය :**

ප්‍රංශයේ පස්වැනි සහ ලංකාවේ දෙවැනි සමුහාණ්ඩු ව්‍යවස්ථාවල ජනාධිපති කේන්ද්‍රිය ආණ්ඩුක්‍රමයක් ගොඩ නැඟීම නිසා එක සමාන ප්‍රතිඵලද, එක සමාන විවේචනද ඇති වී තිබේ. ප්‍රංශයේ ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් වුවත්, පස්වැනි සමුහාණ්ඩුවේ අතිශය බලසම්පන්න ජනාධිපතිවරයා හැසිරෙන්නේ අධිරාජයෙකු ලෙසය යන විවචේනය ප්‍රංශයේ ගොඩ නැගිණි. ලංකාවේද ජනාධිපතිධූරය ඒකාධිපති  පාලකයෙකුගේ තත්ත්වයට සමාන විම ගැන සහ විවේචනය ගොඩ නැගුණි. ඒ නිසා ලංකාවේ ජනාධිපති ධූරය සංශෝධනය කිරීමට ලක් වුවද, ප්‍රංශයේ තවමත් එවැන්නක් සිදු වී නැත.

### 3.3.14. ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.16**

ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.


ඉන්, ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 59%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 22%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 06%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයින්ගෙන් 81%ක් ලකුණු 10ක් ඊට වඩා අඩුවෙන් ලබාගෙන ඇත

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.17**

ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 07 කොටස් තුනකින් යුක්ත වේ. දී ඇති මාතෘකා තුනෙන් දෙකක් තෝරාගෙන පිළිතුරු ලිවිය යුතු ය. ප්‍රශ්නයට අදාළ කොටස් තුන සඳහා පිළිවෙළින් පහසුතාව 37%ක්, 24%ක්, සහ 30%ක් වැනි අඩු මට්ටමකි. ප්‍රශ්නයේ I කොටසින් 13 වැනි සංශෝධනය පිළිබඳව විමසා ඇති අතර ඒ පිළිබඳව පුළුල් අවබෝධයකින් තොරව පිළිතුරු සැපයීම අඩු අපේක්ෂක සාධනයට හේතුවක් වී තිබිය හැකිය. 13වන සංශෝධනයට අදාළ විෂය කරුණු ප්‍රමාණය ඉතාම පුළුල් හා සංකීර්ණ ස්වභාවයක් ගැනීමත් මෙයට හේතු විය හැකිය.

ප්‍රශ්නයේ II කොටසට අදාළව 1978 ආණ්ඩුක්‍රමයෙහි ජනමත විචාරණය පිළිබඳ විධි විධාන සම්බන්ධයෙන් විමසා ඇති අතර ඒ පිළිබඳව බොහෝ අපේක්ෂකයන් සතු දැනුම අවම මට්ටමක පැවතීම අඩු අපේක්ෂක සාධනයට හේතු වන්නට ඇත. ප්‍රශ්නයේ III කොටසෙන් බලාපොරොත්තු වී ඇත්තේ 1978 ආණ්ඩුක්‍රමය සහ ප්‍රංශ ආණ්ඩුක්‍රමය පිළිබඳ තුලනාත්මක විග්‍රහයකි. මෙහිදී සමස්ත ආණ්ඩුක්‍රම දෙකක් පිළිබඳ දැනුමක් තිබීම අවශ්‍ය වන අතර එම ආණ්ඩුක්‍රම තුලනාත්මක ව විග්‍රහ කිරීමේ පුළුල් දැනුමක් සහ අවබෝධයක්ද අපේක්ෂකයා සතු විය යුතු ය. එමෙන්ම මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වූ විෂය කරුණු පුළුල් පරාසයක ව්‍යාප්තව පැවතීමත් අඩු අපේක්ෂක සාධනයට බලපා ඇති බව උපකල්පනය කළ හැකිය. ඉගැන්වීමේදී සිසුන්ගේ බුද්ධි මට්ටම හුදු විස්තර කිරීමේ හැකියාවට සීමා නොකර ඉහළ මට්ටමකට ගෙන යාමේ අවශ්‍යතාවද මෙයින් අවධාරණය කෙරේ. මේ නිසා සමස්ත ප්‍රශ්නය සඳහාම සාර්ථක පිළිතුරක් ඉදිරිපත් කිරීම බොහෝ අපේක්ෂකයන්ට අභියෝගාත්මක වී ඇති බව පෙනී යයි.

### 3.3.15. ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

## III කොටස

**08. ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ ආධිපත්‍යය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා අදාළ වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.**

අභිමතාර්ථ :

මෙම ප්‍රශ්නයේ අරමුණවන්නේ (අ) ව්‍යස්ථානුකූලවාදය, නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුකරණය පිළිබඳව අපේකෂකයින්ගේ දැනුමත්, (ආ) ප්‍රජාත්‍රන්තවාදී ආණ්ඩුකරණය, ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ ආධිපත්‍යය අතර ඇති අන්තර් සම්බන්ධතා පිළිබඳ අවබෝධයත් පරීක්ෂා කිරීමයි.

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

- ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය අර්ථ දැක්වීම
- ව්‍යවස්ථානුකූලවාදය අර්ථ දැක්වීම
- නිතීයේ ආධිපත්‍යය අර්ථ දැක්වීම
- ව්‍යවස්ථානුකූලවාදය, නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාත්‍රන්තවාදී ආණ්ඩුකරණය එකිනෙකට සම්බන්ධවන ආකාරය පෙන්වා දීම.

විෂය කරුණු සහ සාකච්ඡාව

ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුකරණය ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ ආධිපත්‍යය අර්ථ දැක්වීම

(I) ප්‍රජාතන්තවාදි ආණ්ඩුකරණය 17 වැනි සියවසේ සිට යූරෝපයේ වර්ධනය විය. එය ලිබරල්වාදය සහ ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ද හැඳින්වෙන අතර, නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සමඟ විකාශනය විය. එහි කෙටි අර්ථය නම්, මහජනාතාව සිය නියෝජිතයින් මාර්ගයෙන් පාලනය සිදු කරන ආණ්ඩුක්‍රමය යන්නයි.

(II) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුකරණයේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් තිබේ. නිතීයේ ආධිපත්‍යය සහ ව්‍යවස්ථානුකූලවාදය ඒවායින් ප්‍රධානය. අනෙකුත් අංග නම්, මහජන පරමාධිපත්‍යය, බලතල වෙන්කිරීම, සංවරණ සහ තුලන, මානව අයිතිවාසිකම්, සීමිත ආණ්ඩුව, නිදහස් සහ සාධාරණ මැතිවරණ සහ මහජනතාවට වගවීමයි.

(III) ව්‍යවස්ථානුකූලවාදය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල ඇති මූලිකතම අංගයක් වේ. එය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි ව්‍යවස්ථා රාමුවක් තුළ නීතියේ ආධිපත්‍යය පවත්වා ගනිමින් සහ ප්‍රජාතන්ත්‍රික ආණ්ඩුකරණයේ අනෙක් මූලධර්ම ද පිළිපදිමින්, ප්‍රජාපීඩක පාලක පාලන තන්ත්‍ර ඇතිවීම වැළැක්වීම අරමුණුකර ගනියි.

ව්‍යස්ථානුකූලවාදය එහි පටු සහ පුළුල් යන අර්ථ දෙකකින් තේරුම් කෙරේ.

පටු අර්ථයෙන් ව්‍යවස්ථානුකූලවාදය යන්නෙන් අදහස් කරන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට අනුව රට පාලනය කිරීම යන්නයි. "ව්‍යවස්ථාවකට අනුව රට පාලනය කිරීම" යන්නම එයින් අදහස් වන්නේ නැත. ඊට හේතුව නිර්ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ද තිබෙන බැවිනි. ප්‍රජාත්‍රන්තවාදී වන්නට යම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් දේශපාලන බලයේ සීමාවන් ද නීර්ණය කළ යුතු වන අතර, දේශපාලන බලය සංවරණය සහ තුලනක්‍රමවලට යටත් වීම ද සිදු විය යුතුය.

පුළුල් අර්ථයෙන් ව්‍යවස්ථානුකූලවාදය යනුවෙන් අදහස් වන්නේ, ඉහත කී ආකාරයේ ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට පදනම් වන මූලධර්ම පද්ධතියයි. එම මූලධර්ම බලය කේන්ද්‍රගත වීම වළක්වමින්, බලයට සීමා පැණවීමේ සහ පුරවැසි නිදහස ආරක්ෂා කිරීමේ මූලධර්ම සහ යාන්ත්‍රණ ද, දේශපාලන ප්‍රජාවගේ ප්‍රතිමානීය ඉලක්ක ද නිර්මාණය කරති. එවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පණවාගනු ලැබූ, ලිඛිත එකක් ද විය එය හිතුවක්කාර අර්ථකථනවලට භාජනය නොවීම ද වැදගත්ය.

(IV) නීතියේ ආධිපත්‍යය යනු ඕනෑම නීතියක් මගින් සිදුවන පාලනය ද නොවේ. එහි අර්ථය වන්නේ පුරවැසියන්ගේ නිදහස සහ අයිතිවාසිකම් ද උල්ලංඝනය නොකරමින් ප්‍රජාතන්ත්‍රවාදීව සහ නිසිලෙස පණවන ලද නීතිය යටතේ සිදු වන පාලනයයි. එය සෑම දෙනාටම එක සමානව ක්‍රියාත්මක වන නිතීයක් ද විය යුතුය.

නීතියේ ආධිපත්‍යය පිළිබඳ සංකල්පය අර්ථ සම්ප්‍රදාය දෙකක් වෙතින් පැමිණ ඇත. පළමු වැන්න සම්භාව්‍ය රෝම සම්ප්‍රදායයි. එහි ප්‍රධාන මූල ධර්මය මිනිසුන්ගේ නොව නීතියේ පාලනය යන්නයි. දෙවැනි අර්ථය එන්නේ ජර්මන් සම්ප්‍රදාය වෙතිනි. ඒ අනුව නීතිය සාධාරණවන්නට නම් එය නීතිය මත පදනම් වන රාජ්‍යයේ, එනම් නෛතික රාජ්‍යයේ, නීතිය විය යුතුය. එනම් රාජ්‍යය ද නීත්‍යානුකූල එකක් විය යුතුය.

(v) නීතියේ ආධිපත්‍යය යන සංකල්පයෙන් පහත සඳහන් මූලධර්ම යෝජනා වෙයි.

(අ) ආණ්ඩුකරණයට සම්බන්ධ පුද්ගලයින්, එනම්, පාලකයින්, නීතියට යටත් විය යුතුය. ඔවුන් සිටින්නේ නීතියට ඉහළින් නොවේ.

(ආ) නීති පැණවීමට සහ ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව සතු බලය විසින් පුරවැසි නිදහස උල්ලංඝණය නොකරන බව සහතික කරනු සඳහා ඒවා සංවරණවලට පාත්‍ර කළ යුතුය.

(ඇ) පුරවැසියන් හිතුවක්කාර ලෙස අත් අඩංගුවට ගැනීම, වධ හිංසා පැමිණවීම, සිරභාරයට පත් කිරීම, ඔවුන්ගේ නිදහස සීමා කිරීම යන ප්‍රතිඵල ඇතිවන පරිදි නීතිය අවභාවිත කිරීමෙන් වැළකීමට ආණ්ඩුව වගබලා ගත යුතුය.

(ඈ) රාජ්‍යයේ/ ආණ්ඩුවේ අධිකාර බලයේ සීමාවන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නීතිවල සහ අධිකරණ තීන්දුවල ප්‍රකාශිතව සඳහන් විය යුතුය.

(ඉ) විධායකයේ හෝ ව්‍යවස්ථාදායකයේ බලපෑමෙන් ස්වාධීනව කටයුතු කරන අධිකරණයක් තිබිය යුතුය.

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතියේ ආධිපත්‍යය ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සඳහා අදාළවන ආකාරය :

(අ) ඒවා එකිනෙක මත රඳා පවතී. එකකට අනෙක නොමැතිව පැවතිය නොහැකිය.

(ආ) ප්‍රජාතන්ත්‍රවාදය යනු ජනතාව විසින් ජනතාව වෙනුවෙන් පවත්වන පාලන තන්ත්‍රයකි. මහජනතාවගේ ආරක්ෂාව, අයිතිවාසිකම් සහ නිදහස සහතික කිරීම ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුවක ප්‍රධාන වගකීමයි. මෙම වගකීම නිසි ලෙස ඉටු කිරීමට නම් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය සිදුවිය යුත්තේ ව්‍යවස්ථානුකූලවය. නීතියේ අධිපත්‍යය සහ අනෙකුත් ප්‍රජාත්‍රන්තවාදි මූලධර්මවලින් මග පෙන්වනු ලැබූ රාමුවක් තුළය.

(ඇ) එසේ නොවූවිට බිහිවන්නේ ප්‍රජා පීඩක සහ හිතුවක්කාර පාලන තන්ත්‍රයන්ය. රාජාණ්ඩු සහ ඒකාධිපති පාලනතන්ත්‍රවල වැසියන්ට ජීවත් වීමට සිදු වන්නේ තම නිදහස, අයිතිවාසිකම් සහ ජීවිතය උල්ලංඝනය කරනු ලැබීමට ඇති ඉඩකඩ පිළිබඳව නිරන්තර බියෙනි.


**නිගමය :**

පහත සඳහන් ආකාරයේ නිරීක්ෂණ මගින් නිගමනය ඉදිරිපත් කළ හැකිය. ව්‍යවස්ථානුකූලවාදය, නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රික ආණ්ඩුකරණය අතර සම්බන්ධය සෑම විටම පහසු එකක් නොවේ. විධායකය විසින් ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට තම බලපෑම සහ පාලනය යටතට ගැනීමේ උත්සාහය බොහෝ රටවල ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සීමා කිරීමට තුඩු දී තිබේ. නීතියේ ආධිපත්‍යයට සීමා පැනවීමේ ප්‍රවණතාවක් ද මෑත කාලයේ වර්ධනය වී තිබේ. එම තත්ත්වයට එම සමාජවල ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩුකරණයේ අර්බුද ඇති වීමටද තුඩු දී තිබේ. ඒ නිසාම ව්‍යවස්ථානුකූලවාදය සහ නීතියේ ආධිපත්‍යයේ වැදගත්කම ද නැවත නැවතත් මතු වේ.

### 3.3.16. ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.18**

ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.

ඉන්, ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 39%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 64%ක් වැනි ඉතා ඉහළ ප්‍රතිශතයක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට අඩු ප්‍රතිශතයකි.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.19**

ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 08 සඳහා සමස්ත පහසුතාවය 42%කි. මෙම අඩු අපේක්ෂක සාධනයට හේතු වී ඇත්තේ දේශපාලන න්‍යාය සහ භාවිතය එකට ගලපා ගැනීමේ අභියෝගය බොහෝ අපේක්ෂකයන්ට පැවති නිසා බව උපකල්පනය කළ හැකිය. මෙම හැකියාව ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබාදීමට ද ගුරුභවතුන් උනන්දු වන්නේ නම් මැනවි.

**3.3.17. ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර**

**09. වර්තමාන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය එහි සාම්ප්‍රදායික ඒකීය මාදිලියෙන් ඈත් වී ඇති ආකාරය පෙන්වා දෙන්න.**

**අභිමතාර්ථය :**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ (අ) බ්‍රිතාන්‍යයේ ඒකීය ආණ්ඩුක්‍රමයෙහි මෑතකාලයේ සිදුවී තිබෙන වෙනස්වීම් පිළිබඳව අපේක්ෂකයන් සතු දැනුමත් (ආ) ඔවුන්ගේ විග්‍රාහාත්මක නිපුණතාවත් පරීක්ෂා කිරීමයි.

(ලකුණු 02 යි)

පිළිතුරෙහි අන්තර්ගත විය යුතු මූලික කරුණු

- බ්‍රිතාන්‍යයේ සම්ප්‍රදායික ඒකීය රාජ්‍ය ක්‍රමය හඳුනා ගැනීම
- එහි මෑත කාලීන වෙනස් වීම් ඇතිවීමේ පසුබිම පෙන්වා දීම
- එය වෙනස්වී ඇති ආකාරය පෙන්වා දීම සහ සාකච්ඡා කිරීම
- නව ප්‍රවණතාවන් හැඳින්විය හැක්කේ කෙසේදැයි දැක්වීම

**හැඳින්වීම :**

බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය සියවස් කිහිපයක්ම පැවත තිබෙන්නේ ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල ආදර්ශ මාදිලිය ලෙසයි. ප්‍රංශ සමූහාණ්ඩුව ඒකීය ආණ්ඩුක්‍රමය සඳහා වූ අනෙක් ආණ්ඩුක්‍රම මාදිලියයි. බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත එකක් නොවේ. එය ප්‍රඥප්ති. නීති සහ සම්ප්‍රදාය වටා ගොඩ නැගුණකි. රාජ්‍යයේ ඒකීයවාදය නොවන බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රම සම්ප්‍රදායේ මූලික ලක්ෂණයක් විය. එහෙත් මෑත කාලයේ බ්‍රිතාන්‍යයේ සිදු වූ වර්ධනය නම් මෙම ඓතිහාසික ඒකීය මාදිලියෙන් වෙනස් වී බලය විමධ්‍යගත කිරීම කරා ගමන් කිරීමයි. 1998 දී ස්කොට්ලන්තයට, වේල්සයට සහ උතුරු අයර්ලන්තයට බලය විමධ්‍යගත කිරීම මෙම පරිවර්තනයේ වැදගත් සන්ධිස්ථානයකි. මේ අනුව වර්මාන බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය සමන්විත වන්නේ මධ්‍යම ආණ්ඩුවකින් සහ ප්‍රාන්ත ආණ්ඩු තුනකිනි.

විෂය කරුණු සහ සාකච්ඡාව

I පසුබිම :

බ්‍රිතාන්‍යය එක්සත් රජාධානිය ලෙස හඳුන්වා ඇති නමුත් එය එක්සත් වී තිබුණේ යුද්ධයෙන් භූමිය අත්පත් කර ගැනීම සහ නීතිය මාර්ගයෙන් පමණි. අයර්ලන්තයේ නිදහස සඳහා දීර්ඝ කාලීන යුද්ධයකුත්, ස්කොට්ලන්තයේ සහ වේල්සයේ ජාතිකවාදී ව්‍යාපාරයත්, බ්‍රිතාන්‍ය දේශපාලනයේ යථාර්ථයක් වී තිබිණි. මෙම ජාතිකවාදි අරගල උත්සන්න වීමේ පසුබිම තුළ බ්‍රිතාන්‍යයේ ඒකීය අණ්ඩුක්‍රමය, එම ජනයාට ස්වයං පාලන අයිතිය ලැබෙන පරිදි සංශෝධනය කිරීමට සිදු වී තිබේ.

මෙපරිදි බ්‍රිතාන්‍යයේ 1998 වසරේ පටන් ශ්‍රී ලංකාවට සමානව බලය විමධ්‍යගත කිරීමේ ක්‍රමයක් පිහිටුවා තිබේ.

II ස්කොට්ලන්තයට, වේල්සයට, සහ උතුරු අයර්ලන්තයට බලය විමධ්‍යගත කිරීම වෙනම පණත් මගින් සිදුකර තිබේ. ඒවා නම්,

(i) 1998 ස්කොට්ලන්ත පණත

(ii) 1998 වේල්ස් ආණ්ඩු පණත

(iii) 1998 උතුරු අයර්ලන්ත පණත

III ජනවාර්ගික දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ කරුණ මෙම ප්‍රාන්ත තුනටම බලය විමධ්‍යගත කිරීමේ පොදු සාධකය විය. උතුරු අයර්ලන්තයේ පැවතියේ අයර්ලන්ත සමුහාණ්ඩුව සමග එකතු වීම සඳහා බ්‍රිතන්‍යයෙන් නිදහස ලැබීමේ සන්නද්ධ කැරැල්ලකි. ස්කොට්ලන්තයේ පැවතියේ ස්කොට්ලන්තයට ජනමත විචාරණයක් තුළින් නිදහස ලබා ගැනීමේ නිදහස් ව්‍යාපාරයකි. වේල්සයේ පැවතියේ ප්‍රාදේශීය ස්වයං පාලනය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ ජාතික ව්‍යාපාරයකි.

IV බලය විමධ්‍ය ගත කිරීම අවශ්‍යය යන තර්කය බ්‍රිතාන්‍ය දේශපාලන පක්ෂ අතර ද 1970 ගණන්වල පටන් වර්ධනය විය. ස්කොට්ලන්තයේ, උතුරු අයර්ලන්තයේ, සහ වේල්සයේ නිදහස් ව්‍යාපාර ශක්තිමත් වීම නිසා එම ප්‍රාන්ත බ්‍රිතාන්‍යට අයත් ප්‍රදේශ ලෙස තබා ගැනීමේ එකම මාර්ගය බලය විමධ්‍යගත කිරීමය යන තර්කය, ලේබර් පක්ෂයෙන් ද ප්‍රබල ලෙස ඉදිරිපත් විය.

V උතුරු-අයර්ලන්තය, වේල්ස් සහ ස්කොට්ලන්තය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව අනුගමනය කළ දැඩි ප්‍රතිපත්ති අසාර්ථක වීම නිසා බලය විමධ්‍යගත කිරීමේ තර්කයට කොන්සර්වටිව් පක්ෂය ද එකඟ විය. 1998 දී බලය විමධ්‍යගත කිරීම නීතිගත කරන ලද්දේ මෙම පසුබිම තුළය. පසුව, ඒකීය රාජ්‍ය ව්‍යුහයෙන් වෙනස්ව බලය විමධ්‍යගත කිරීම සඳහා පරිවර්තනය කිරීමට සර්ව පාක්ෂික එකඟතාවක් බ්‍රිතාන්‍යයේ ඇති විය.

VI බ්‍රිතාන්‍යයේ ලිඛිත ව්‍යවස්ථාවක් නැති නිසා, බලය විමධ්‍ය ගත කිරීම සිදු කරන ලද්දේ උතුරු අයර්ලන්තය, ස්කොට්ලන්තය සහ වේල්ස් ආණ්ඩු පනත යන පාර්ලිමේන්තු පණත් මාර්ගයෙනි. එය සිදුවූයේ 1998 වසරේදීය.

VII බ්‍රිතාන්‍යයේ ඇත්තේ අසමමතික බලය විමධ්‍යගත කිරීමකි. ඒ අනුව වැඩිම ස්වයං පාලන බලයක් හිමිවන්නේ ස්කොට්ලන්තයටයි. ස්කොට්ලන්තයේ ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය හැඳින්වන්නේ ස්කොට්ලන්ත පාර්ලිමේන්තුව නමිනි. වේල්සයට ඇත්තේ අඩු බලතලය. උතුරු අයර්ලන්තයට හිමිවී තිබෙන්නේ ස්කොට්ලන්තය සහ වේල්සයට අතරමැදි බලතල ප්‍රමාණයකි.

VIII ස්කොට්ලන්ත ප්‍රාන්ත ආණ්ඩුවට පහත සඳහන් බලතල තිබේ. අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිසරය, සමාජ සේවා, නීතිය, අධිකරණ පත් කිරීම්, පළාත් පාලනය, පොලිසිය, ප්‍රවාහනය, ක්‍රීඩා, කලාව සහ සංස්කෘතිය, සංචාරක සේවා, සීමිත අයබදු බලය.

වේල්ස් ප්‍රාන්ත ආණ්ඩුව සතු බලතල; බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ නීති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රාන්ත නිති පැණවීමේ බලය, ධීවර කටයුතු, වන සම්පත, ග්‍රාමීය සංවර්ධනය, සංස්කෘතිය, ආර්ථික සංවර්ධනය, මහාමාර්ග සහ ප්‍රවාහනය, පලාත් පාලනය.

උතුරු අයර්ලන්ත ප්‍රාන්ත ආණ්ඩුව සතු බලතල : සෞඛ්‍යය, අධ්‍යාපනය, සංස්කෘතිය, පරිසරය, කෘෂිකර්මය, රැකියා, නිපුණතා සංවර්ධනය, ආර්ථික සංවර්ධනය

IX බ්‍රිතාන්‍යයේ ඇති බලය විමධ්‍ය ගත කිරීමේ ක්‍රමයට අනුව මහජන ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, ආගමන විගමන කටයුතු, විදේශ ප්‍රතිපත්ති, රැකියා, ගුවන් විදුලිය, වෙළඳාම, සහ කර්මාන්ත, න්‍යෂ්ටික බලය ශක්තිය, සහ විදුලිය, පාරිභෝගික අයිතීන්, දත්තවල ආරක්ෂාව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යන විෂයයන් අයත් වන්නේ මධ්‍යම රජයටය. එම මධ්‍යම රජයේ බලතල හඳුන්වනනේ ''සංචෘත බලතල'' යනුවෙනි. ප්‍රාන්තවලට බෙදා දෙන ලද බලතල හැඳින්වෙන්නේ "පවරන ලද බලතල" (Transferred Towers) නමිනි.


**නිගමනය :**
බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තවදුරටත් ඒකීය එකක් නොවේ. එය සන්ධිය ව්‍යස්ථාවක් ද නොවේ. එය සන්ධි ලක්ෂණ සහිත ඒකීය ව්‍යවස්ථාවකි. එබැවින් එය දෙමුහුන් ආණ්ඩුක්‍රම මාදිලියක්යයි හැඳින්වීම වඩාත් සුදුසුය යන නිගමනය ඉදිරිපත් කළ හැකිය.

මෙම ආණ්ඩුක්‍රමික වෙනස ඇති කරන ලද්දේ සුළුජන අයිතීන් සහ ප්‍රාදේශීය ස්වයං පාලනය සඳහා වූ ප්‍රාදේශිය ජාතික ව්‍යාපාර විසින් ඇති කරන ලද බලපෑම්වලට ප්‍රතිචාර වශයෙනි. මේ අනුව බ්‍රිතාන්‍යයේ ඇත්තේ බහු වාර්ගික සමාජයක්ය. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ව්‍යුහය තුළින් එය ප්‍රකාශයට පත්වේ.

### 3.3.18. ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.20**

ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි. ඉන්,


ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 49%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 15%ක් ද

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. අපේක්ෂකයන්ගෙන් 49%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 05ක් හෝ ඊට වඩා අඩු සංඛ්‍යාවකි. ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 68%කි.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.21**

ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ ප්‍රශ්න අංක 09 සඳහා සමස්ත පහසුතාව 29%කි. විෂය කරුණුවල ඇති පුළුල් බව හා සංකීර්ණ බවත්, මෙවැනි පුළුල් සංකීර්ණ කරුණු තුලනාත්මකව විග්‍රහ කිරීමේ ඇති අපහසුතාවයත් මෙම අඩු අපේක්ෂක සාධනයට හේතු විය හැකිය. විශේෂයෙන්ම ඒකීය රාජ්‍ය පරිවර්තනයේ බලය බෙදීමේ සංකල්පය පිළිබඳව අපේක්ෂකයන්ට මනා අවබෝධයක් නොතිබූ බව පෙනී යයි. මෙම ප්‍රශ්නයට අදාළ තේමාව පිළිබඳ අවශ්‍ය දැනුම සහ විග්‍රහාත්මක හැකියාව සිසුන්ට ලබාදීමේ අවශ්‍යතාවද මෙයින් අවධාරණය වේ.

### 3.3.19. ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර

**10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.**

**(i) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරය**

**(ii) දේශපාලන ආයතන අධ්‍යයනය කිරීමේ වැදගත්කම**

**(iii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල මෑතකාලීන ප්‍රවණතා**

**(iv) සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ**

**(v) ජාතික දේශපාලනය සහ ජාත්‍යන්තර දේශපාලනය අතර පවතින වෙනස්කම්**

**අරමුණ :**

මෙම කෙටි ප්‍රශ්න නිර්දේශ පත්‍රයේ සමස්තය නියෝජන කරන ඒවාය. ඒවායින් අපේක්ෂා කරන්නේ දී ඇති මාතෘකා පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම සහ ඒවා නිසි ලෙස යොදා ගනිමින් විස්තරාත්මක තර්ක ගොඩ නැගීමේ හැකියාව පරීක්ෂා කිරීමයි.

**(i) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී දේශපාලන පක්ෂවල කාර්යයභාරය**

පිළිතුරේ ප්‍රධාන විෂය කරුණු :

* දේශපාලන පක්ෂවල ප්‍රධාන කාර්යය අර්ථ දැක්වීම
* දේශපාලන පක්ෂ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට සහභාගී වන අවධි සහ මාර්ග දැක්වීම.

(අ) හැඳින්වීම

දේශපාලන පක්ෂවල පොදු කාර්යයභාරය පිළිබඳව කෙටි හැඳින්වීමක් සහ ප්‍රතිපත්ති සම්පාදනය යනු කුමක් දැයි හඳුන්වා දීම.

විෂය කරුණු සහ අන්තර්ගතය

I. දේශපාලන පක්ෂ තම ප්‍රතිපත්ති සහ න්‍යාය පත්‍ර මාධ්‍යයෙන් රාජ්‍යප්‍රතිපත්ති සම්පාදනයේ සෑම අදියරකදීම වැදගත් කර්ය භාරයක් ඉටු කරති.

II. පක්ෂවල න්‍යාය පත්‍ර මගින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට ඇතුළත් කළ යුතු තේමා සහ කරුණු පිළිබඳව මහජන සාකච්ඡා සහ කතිකා ඇති කිරීමට දේශපාලන පක්ෂ සමත් වෙති. රාජ්‍ය ප්‍රතිපත්තිවලට මහජන සහයෝගය ඒකරාශි කිරීමට ද ඒ මගින් දේශපාලන පක්ෂවලට හැකි කම ලැබේ. මෙපරිදි පක්ෂ ප්‍රතිපත්ති සහ න්‍යායපත්‍රවලට, රාජ්‍ය ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය සකස් කිරීම කෙරෙහි බලපෑම ඇති කළ හැකිය.

III. ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල දේශපාලන පක්ෂ සිදුකරන කාර්යයක් වන්නේ මහජනතාව උනන්දුව දක්වන කරුණු මහජන ක්ෂේත්‍රය තුළ සාකච්ඡාවට සහ විවාදයට ලක්කොට, ඒවා ප්‍රතිපත්ති කරුණු බවට පත් කරමින්, ප්‍රතිපත්ති න්‍යාය පත්‍ර සමඟ සම්බන්ධ කිරීමයි.

IV. මහජනතාවගේ අවශ්‍යතා සහ අභිලාෂ රාජ්‍ය ප්‍රතිපත්ති සාකච්ඡා සමග අනුබද්ධ කරන්නේ ද දේශපාලන පක්ෂයි.

V. රාජ්‍ය ප්‍රතිපත්තිවල සාධනීය සහ නිෂේධනීය පැතිකඩ පිළිබඳ මහජනතාව දැනුවත් කරන්නේ ද දේශපාලන පක්ෂ යි. මේ මගින් රාජ්‍ය ප්‍රතිපත්ති මහජන විවේචනයට ප්‍රතිචාර දක්වන තත්ත්වයට ද පත් කළ හැකි වේ.

VI. රාජ්‍ය ප්‍රතිපත්තිවලට මහජනතාව දක්වන ප්‍රතිචාර සමග ප්‍රතිපත්ති සම්පාදනය සම්බන්ධ කිරීමේ කාර්යය කරන්නේ ද දේශපාලන පක්ෂයි. මේ මගින් දේශපාලන පක්ෂ මහජනතාව සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර පුරුකක් ලෙස ක්‍රියාකරති.

**නිගමනය**

රාජ්‍ය ප්‍රතිපත්ති සහ මහජනතාව සම්බන්ධ කරන පුරුකක් ලෙස දේශපාලන පක්ෂවල කාර්යය ප්‍රතිපත්ති ක්‍රියාවලිය පුරාම පැතිර පවතී. ඒ මගින් ප්‍රතිපත්ති සම්පාදනය සහ ප්‍රතිපත්තිවලින් ප්‍රතිලාභ ලබන සමාජය අතර සම්බන්ධය පවත්වන පුරුකක් ලෙස ක්‍රියාකරනේ දේශපාලන පක්ෂයි.

**(ලකුණු 03)**

**දේශපාලන ආයතන අධ්‍යයනය කිරීමේ වැදගත්කම**

පිළිතුරේ ප්‍රධාන විෂය කරුණු :

* දේශපාලන ආයතන අර්ථ දැක්වීම
* ප්‍රධාන දේශපාලන ආයතන නම් කිරීම සහ විස්තර කිරීම
* දේශපාලන අධ්‍යයනයේදී ඒවායේ වැදගත්කම පෙන්වා දීම

**හැඳින්වීම**

දේශපාලන ආයතන යන්න අර්ථකථනය කිරීමෙන් පිළිතුර ආරම්භ කළ හැකිය. දේශපාලන ආයතන යනු (අ) නිශ්චිත අරමුණක් සහිතව සමාජයේ දේශපාලන පරිවර්තනය තුළ යම්කිසි කාර්ය කොටසක් ඉටුකිරීම අරමුණු කරගෙන (ආ) නීති රෙගුලාසි පිරිස්බලය සහ ද්‍රව්‍යමය සම්පත් ද සහිත, සංවිධානගත සමාජ ප්‍රපංචයන්ය. ඒවා දේශපාලනය තුළ විවිධ කාර්යයන් සිදු කරති.

සංවිධානගත සමාජ ප්‍රපංචයන්ය. ඒවා දේශපාලනය තුළ විවිධ කාර්යයන් සිදු කරති.

(i) සමාජයක් තුළ විධිමත් සහ අවිධිමත් යනුවෙන් හැඳින්විය හැකි බොහෝ ආයතන තිබේ. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරන දේශපාලන ආයතනවනාහී සාමාන්‍යයෙන් විධිමත් ආයතනයි.

විධිමත් දේශාපාලන ආයතනවලට නිදසුන් - රාජ්‍යය, ආණ්ඩුව, ව්‍යවස්ථාදායකය, විධායකය, නිලධර තන්ත්‍රය අධිකරණ, දේශපාලන පක්ෂ, සිවිල් සමාජය, බලපෑම් කණ්ඩායම්

(ii) එවැනි දේශපාලන ආයතන අධ්‍යයන කිරීමේ වැදගත්කම පෙන්වා දෙමින් කරන සාකච්ඡාවඃ

රාජ්‍යය - සමස්ත දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතන ලෙස ක්‍රියා කරයි. ආණ්ඩුව යනු රාජ්‍යයේ ව්‍යවස්ථායක, විධායක සහ අධිකරණ පරිපාලන සහ සංවර්ධන කාර්යයන් ඉටු කරන ප්‍රධාන ආයතනයයි.

දේශපාලන පක්ෂ - ආණ්ඩුව සහ මහජනතාව සම්බන්ධකරන පුරුක ලෙස ක්‍රියා කරන ප්‍රධාන ආයතන වෙති.

සිවිල් සමාජය - රාජ්‍යයෙන් සහ ආණ්ඩුවෙන් ස්වාධීනව සමාජය තුළ පුරවැසියන්ගේ සමාජ සහ දේශපාලන ක්‍රියාකාරිත්වය ඉඩ සළස්වන පුරවැසි ආයතනයි.

(iii) මෙවැනි දේශපාලන ආයතනවලින් නියෝජනය වන්නේ දේශපාලන ක්‍රමයක් තුළ ඇති විවිධ කාර්යයන්ය. සෑම ආයතනයක්ම කෘත්‍යමය විශේෂීකරණයක් ද, තමන් අතර කෘතමය ශ්‍රම විභජනයක් ද තිබෙන බව ප්‍රකාශ කරති. දේශපාලන ආයතන, ව්‍යවස්ථාදායකය, විධායක, අධිකරණ, පරිපාලන, ආරක්ෂක වශයෙන් බෙදී තිබෙන්නේ ඒ නිසාය.

(iv) මේ සෑම ආයතනයක්ම දේශපාලන සමාජයක සංවිධානාත්මක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වෙති. ඒවා හැදෑරීම මගින් දේශපාලන ක්‍රමයක් ක්‍රියාකරන්නේ කෙසේද යන්න අවබෝධ කර ගැනීමට හැකිකම ලැබේ.

(v) දේශපාලන ආයතන ක්‍රියාකරන ආකාරය තේරුම් ගැනීමේදී

ආයතනවලට සම්බන්ධ පිරිස් බලය, නීති රීති, රෙගුලාසි යනාදිය අධ්‍යයනය කිරීම වැදගත්ය. එම ආයතනවල සංයුතිය, ක්‍රියාකාරිත්වය සහ පැවැත්ම ගැන අවබෝධ කර ගැනීමට අන් අයට හැකි වන්නේ එවිටය. නිලබල ක්‍රමය දේශපාලන ආයතනවලට සම්බන්ධ ප්‍රධාන තේමාවක් වන්නේ එබැවිනි.

**නිගමනය :**

දේශපාලන ආයතන යනු දේශපාලන ක්‍රමයක් තුළ තිබෙන සංවිධාන ඒකකයි. ඒවාට ද්‍රව්‍යමය සම්පත්, පිරිස්බලය ද නීති සහ රෙගුලාසි ද තිබේ. දේශපාලන ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ මෙම ආයතන මාධ්‍ය කොට ගෙනය. සමාජයක ඇති දේශපාලන ආයතන බොහොමයක් විධිමත් ආයතන වන අතර, ඒවා දේශපාලන ක්‍රමයේ ඇති විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා ගොඩ නැගී ඇත. ඒවා අධ්‍යයනය කිරීමෙන්, දේශපාලන ක්‍රමයක ක්‍රියාකාරිත්වය, ආයතනික සංයුතිය, කෘත්‍යමය ශ්‍රම විභජනය යනාදිය හඳුනා ගැනීමට අපට අවකාශය ලැබේ.

**(iii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල මෑතකාලීන ප්‍රවණතා**

**අභිමතාර්ථ :**

මෙම පිළිතුරෙන් අපේක්ෂා කරන්නේ ලංකාවේ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුමත්, ඒවායේ මෑතකාලීන වර්ධනය පිළිබඳ ඔවුන් සතු විචාරාත්මක අවබෝධයත් පරීක්ෂා කිරීමයි.

පිළිතුරේ ප්‍රධාන විෂය කරුණු :

* ලංකාවේ දේශපාලන පක්ෂවලත්, පක්ෂ ක්‍රමයේත් ප්‍රධාන ප්‍රවණතා දක්වා විස්තර කිරීම
* ඒවාට හේතු කෙටියෙන් දැක්වීම

(i) **හැඳින්වීම :**

ලංකාවේ දේශාපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය පිළිබඳ හැඳින්වීමක් සමග පිළිතුර ආරම්භ කළ හැකිය. නිදසුනක් ලෙස එය බහු පක්ෂ ක්‍රමයක් වීම, අධිපති ද්වි-පක්ෂ ක්‍රමයක් වීම, කුඩා පක්ෂ බොහොමයක් මෙන්ම ජන වාර්ගික පක්ෂ ද, පැවතීම යන මේවාය. දේශපාලන පක්ෂ ක්‍රමයේ පරිවර්තන, දේශපාලන සහ සමාජ සාධක මෙන්ම මැතිවරණ ක්‍රමය, එහි වෙනස්වීම් සහ ගතිකත්වය, ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රියාකාරිත්වය වැනි සාධකමත ද තීරණය වී ඇති බව ප්‍රකාශ කළ හැකිය

(ii) සාම්ප්‍රදායික ප්‍රධාන පක්ෂවල පරිහානිය - එ.ජා.ප.ය සහ ශ්‍රීලපනිය

(iii) නව ප්‍රධාන පක්ෂ දෙකක් බිහිවීම - ශ්‍රීලපොපෙ සහ ස.ජ.බ

(iv) පක්ෂ නායකත්වයයේ වෙනස්වීම් සහ නව පක්ෂ නායකත්ව බිහිවීම

(v) පක්ෂවල අභ්‍යන්තර අර්බුද, බෙදීම් සහ පිපිරීම් - ශ්‍රීලනිපය, එජාපය

(vi) සිංහල, දෙමළ සහ මුස්ලිම් සමාජවල නව කුඩා පක්ෂ බිහිවීම

(vii) වාමාංශික පක්ෂවල සිදුවන නිරන්තර දුර්වල වීම

(viii) දේශපාලන පක්ෂ, සම්ප්‍රදායික පක්ෂ නොවන ලිහිල් දේශපාලන ව්‍යාපාර බවට පරිවර්තනය වීම

(ix) ප්‍රධාන පක්ෂවල සාම්ප්‍රදායික මතවාදි බෙදීම් සහ අභ්‍යන්තර අර්බුද

(x) සාම්ප්‍රදායික දේශපාලන/ පාලක පවුල් දේශපාලන පක්ෂ මත පවත්වාගෙන ගිය අධිපත්‍යය බිඳ වැටීම.

(xi) මෙම පරිවර්තනයට දායක වූ සාධක අතර පහත සඳහන් හේතු ප්‍රධාන වේ : සමාජ පරිවර්තනය, මැතිවරණ ක්‍රමයේ වෙනස් වීම්, වාර්ගික දේශපාලනයේ නැගීම, තම සම්ප්‍රදායික නායකත්ව වෙනස් කරන ලෙස පක්ෂවලින් මතුවන ප්‍රජාතන්ත්‍රවාදී තෙරපීම් සහ සාම්ප්‍රදායික පක්ෂ මතවාද දුර්වල වීම යන ඒවායි.

**නිගමනය :**

ශ්‍රී ලංකාව එයටම විශේෂ වූ දියුණු දේශපාලන පක්ෂ ක්‍රමයක් තිබේ. එහි ද්වි-පක්ෂ ක්‍රමය කුඩා පක්ෂ කිහිපයක් මැද්දේ 1950 ගණන්වල මුලදී ආරම්භ විය. ඉන් පසුව ක්‍රමයෙන් ආධිපති ද්විපක්ෂ ක්‍රමයක් සහිත බහු පක්ෂ ක්‍රමයක් ලාංකාවේ වර්ධනය විය. ද්‍රවිඩ සහ වාමාංශික පක්ෂ ද ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ වැදගත් කොටසක් වූහ. එහෙත් පසුගිය අවුරුදු දශක කිහිපය තුළ එක් එක් පක්ෂවලත් පක්ෂ ක්‍රමයේත් වැදගත් වෙනස්වීම් සිදුවී තිබේ. ඒවා ලංකාවේ සමාජයෙත් දේශපාලනයෙත්, මැතිවරණ ක්‍රමයෙත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීයේදීත් ඇති වූ පරිවර්තනයද පිළිබිඹු කරයි.

අපේක්ෂිකයින් ස්වාධීනව ලබාගත් දැනුම නව අදහස් ඉදිරිපත් කිරීමද නිදසුන් ඉදිරිපත් කිරීම ද මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

## (iv) සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ

**අභිමතාර්ථ :**

දේශපාලන මතවාදයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ පිළිබඳව අපේක්ෂකයින් සතු දැනුම සහ අවබෝධය පරීක්ෂා කිරීම මෙම මාතෘකාවේ අරමුණයි.

පිළිතුරේ ප්‍රධාන විෂය කරුණු :

* සමාජ ප්‍රජාතන්තවාදය දේශපාලන මතවාදයක් ලෙස අර්ථ දැක්වීම
* එහි ඓතිහාසික පසුබිම
* දේශපාලන මතවාදයක් ලෙස එහි ප්‍රධාන අංග සහ ලක්ෂණ

i **හැඳින්වීම :**

සමාජ ප්‍රජාතන්ත්‍රවාදය දහනව වැනි සියවසේ බිහිවී විසිවැනි සියවස දක්වා පැතිරුණ දේශපාලන මතවාදයක් බවත්, එයට යුරෝපීය සම්බන්ධයක් තිබුණද, යුරෝපීය නොවන සමාජවලට ද එය පැතිරී තිබෙන බවත්, පෙන්වා දෙමින් හැඳින්වීම ඉදිරිපත් කළ හැකිය.

කරුණු විස්තර සහ සාකච්ඡාව

ii සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මතවාද යුරෝපයේ බිහිවීමේ පසුබිම පිළිබඳව කෙටි සාකච්ඡාවක්. එයින් උත්සාහ ගැනුණේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේත්, සමාජවාදයේත් හොඳම අංගලක්ෂණ සංයෝගයෙන්, ධනවාදී ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට තුඩුදෙන දේශපාලන දෘෂ්ටියක් ගොඩ නැගීමටය.

iii සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පළමුවෙන් වර්ධනය වූයේ 19 වැනි සියවසේ දෙවන භාගයේ යුරෝපයේය. ඒ වෘත්තීය සමිතිවල දේශපාලන ව්‍යාපාරයක් ලෙසිනි. මුලදී එය සම්බන්ධ වී සිටියේ යුරෝපීය මාක්ස්වාදී ව්‍යාපාරයටය.

iv විසිවැනි සියවසේ මුල්කාලයේදී ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු මාක්ස්වාදයෙන් කැඩී වෙන්වූහ. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරයේ එම නව දේශපාලන ප්‍රවණතාවයේ නායකයා වූයේ එඩ්වර්ඩ් බර්න්ස්ටීන්ය. යුරෝපයේ කම්කරු පන්ති විප්ලවයක් අනිවාර්යයෙන්ම සිදුවනු ඇත යන මාක්ස්වාදී ප්‍රවාදය ප්‍රතික්ෂේප කළ බර්න්ස්ටීන්, කම්කරු පන්ති විප්ලයකින් තොරව, පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ තුළින් සමාජවාදයට ළගාවිය හැකිය යන නව ප්‍රවාදය ගොඩ නැගුවේය.

v 1930 ගණන්වලින් පසුව සමාජ සුභසාධනවාදය ද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මතවාදයට එකතුවිය.

vi දේශපාලන මතවාදයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන අංග මෙසේය.

(අ) ධනවාදය විසින් ඇති කරනු ලබන සමාජ අසමානතා, දුගී බව සහ අසාධාරණතා විසැඳීමට එයට නොහැකි නිසා ධනවාදය ප්‍රතික්ෂේප කළ යුතුය.

(ආ) සමාජවාදය ධනවාදය ඇති කරන ගැටලුවලට විසඳුම් යෝජනා කළත්, කම්කරුපන්ති විප්ලවයක් තුළින් සමාජවාදයට ළඟාවීමේ මාක්ස්වාදී දැක්ම ප්‍රායෝගික නැත.

(ඇ) ධනවාදයේ ප්‍රශ්නවලට ඇත්තේ සමාජවාදී විසඳුම්ය. එවැනි විසඳුම් ලබා ගැනීම ඇති හොඳම ක්‍රියාමාර්ගය වන්නේ සමාජ ප්‍රතිසංස්කරණ තුළින් සමාජ සමානත්වය ඇති කිරීමයි.

(ඈ) සමාජවාදී ප්‍රතිපත්ති තුළින් ධනවාදය ප්‍රතිසංස්කරණය කිරීමට පහත සඳහන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග අවශ්‍යය.

i. රාජ්‍යය ආර්ථික ක්‍රියාකාරිත්වයට සහභාගී වීම
ii. මිශ්‍ර ආර්ථිකය
iii. සමාජ සුභසාධනය
iv. ආදායම් සහ ධනය යලි බෙදා හැරීම
v. ප්‍රාග්ධනය සහ ශ්‍රමය (වෘත්තීය සමිති) අතර සාමූහික කේවෙල් කිරීම

(ඉ) දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ජර්මනිය සහ ස්කැන්ඩියනේවියානු රටවල් යලි ගොඩනැගීම සඳහා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබිණ. යුරෝපයේ වර්තමානයේදී ද සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ තිබේ.

**නිගමනය :**

දේශපාලන මතවාදයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ආකර්ෂණය තිබුණේ එය ධනවාදී සහ සමාජවාදි යන අන්ත දෙකටම යන්නේ නැතිව, එම දෙකෙහිම යහපත් අංග මිශ්‍ර කිරීමයි. සමාජවාදයේ ඇති සමාජ සමානත්වය හා සමාජ සාධාරණත්වයත්, ඒ සඳහා වෙළෙඳ පොළේ පමණක් නොව රාජ්‍යයේ කාර්යයභාරය අවධානය කිරීමත්, ධනවාදී සමාජය විප්ලවයෙන් තොරව ප්‍රතිසංස්කරණ කිරීමේ ඉදිරි දැක්මත් නිසා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මතවාදය, ආකර්ෂණයටත් විවේචනයටත් භාජනය වූවකි.

**(v) ජාතික දේශපාලන සහ ජාත්‍යන්තර දේශපාලනය අතර පවතින වෙනස්කම්**

අභිමතාර්ථය :

ජාතික සහ ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ වෙනස්කම් හඳුනාගෙන ඒවා සංසන්දනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණයි.

කරුණු විස්තර සහ සාකච්ඡාව (ලකුණු 06 යි)

I ජාතික සහ ජාත්‍යන්තර දේශපාලනය අර්ථ කථනය කිරීමඃ ජාතික දේශපාලනය ජාතික රාජ්‍ය ඇතුළත සිදුවන දේශපාලනයයි. ජාත්‍යන්තර දේශපාලන යනු ජාතික රාජ්‍ය අතර පවත්නා දේශපාලන සම්බන්ධතායි.

II ජාතික දේශපාලනය අධ්‍යයන කරන්නේ ජාතික රාජ්‍යයන් ඇතුළත දේශපාලන සිදුවන ආකාරයයි. එය අවධානය යොමු කරන්නේ ජාතිය, රාජ්‍යය, ඒවා ඇතුළත ඇති බල ව්‍යුහ, බලය, බල සම්බන්ධතා පුරවැසිභාවය සහ ජාතික රාජ්‍ය ඇතුළත ඇති ගැටුම් යනාදී තේමාවන්ටය. ජාත්‍යන්තර දේශපාලන අවධානය යොමු කරන්නේ ජාතික රාජ්‍ය අතර සිදුවන සම්බන්ධතා, ගැටුම් සහ බල දේශපාලනටයි. ජාතීන් සහ රාජ්‍යයන් අතර ඇති සම්බන්ධතා ජාලවලට ද එය උනන්දුව දක්වයි.

III ජාතික දේශපාලන අධ්‍යනය කිරීමේ විග්‍රහාත්මක ඒකක වන්නේ ජාතික රාජ්‍යයයි. ජාතික රාජ්‍යය ඇතුළත සිටින ඉහළම අධිකාර බලය වන්නේ රාජ්‍යයයි. ජාත්‍යන්තර දේශපාලන තුළ එවැනි විශේෂ බලයක් නැත. ජාත්‍යන්තර සංවිධානවල කාර්යය ජාත්‍යන්තර වශයෙන් සිදු විය හැකි අරාජිකත්ව වැළැක් වීමයි.

IV ඒ අතර රාජ්‍යයට ජාත්‍යන්තර දේශපාලනයේ ඇති වැදගත්කම අහෝසි වී නැත. ජාත්‍යන්තර දේශපාලනයේදී රාජ්‍යයන් කේන්ද්‍රිය කාර්යය ක් සිදුකරන නිසා ජාත්‍යන්තර දේශපාලන අධ්‍යයනය ජාත්‍යන්තර දේශපාලන තුළ රාජ්‍යයෙහි එම කාර්යය අධ්‍යයනය කිරීමට උනන්දු වෙයි.

V ජාත්‍යන්තර ක්‍රමය තුළ රාජ්‍යයන් පවතින්නේ හුදෙකලාව නොවේ. ඒවාට ආර්ථික සම්බන්ධතා ද තිබේ. ජාත්‍යන්තර දේශපාලන ආර්ථ ශාස්ත්‍රය කරන්නේ ඒවා අධ්‍යයනය කිරීමයි.

VI ගෝලීය ආරක්ෂාව ජාත්‍යන්තර දේශපාලනයේ තවත් වැදගත් පැතිකඩකි. ගෝලීය ආරක්ෂාව තහවුරු කිරීමට ජාතික රාජ්‍ය එකිනෙක සමග සහයෝගයෙන් ක්‍රියා කරති. ඒ සඳහා ද්වි-පාර්ශ්වික සහ බහු-පාර්ශ්වික ක්‍රියා මාර්ග තිබේ. බහු පාර්ශ්වික සහ ද්වි-පාර්ශ්වික ගිවිසුම් සහ ආරක්ෂණ ක්‍රියාමාර්ග ඒ සඳහා භාවිතයට ගැනේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර සාමය සහ සහයෝගිතාවයත්, ආරක්ෂාවත් ගොඩ නැගීමේ ප්‍රධානම ජාත්‍යන්තර ආයතනයයි.

VII ජාතික රාජ්‍ය අතර මෙන්ම රාජ්‍ය සහ රාජ්‍ය නොවන රැඩිකල් ව්‍යාපාර අතර ඇතිවන ගැටුම් සහ යුද්ධ ද ජාත්‍යන්තර දේශපාලනයේ තවත් වැදගත් තේමාවකි. රාජ්‍ය අතර ගැටුම් නිසා යුද්ධ, අවි තරගය, අරක්ෂණ ගිවිසුම් සහ ක්‍රියාමාර්ග, අන්තර් රාජ්‍ය යුද සන්ධාන, සහ සාම ගිවිසුම් යනාදිය ඇතිවේ. ඒවාද ජාත්‍යන්තර දේශපාලනයේ වැදගත් අංග වෙති.


**නිගමනය :**

ජාත්‍යන්තර සහ ජාතික දේශපාලනය ප්‍රායෝගික දේශපාලනයෙත්, දේශපාලන අධ්‍යයනයේත් එකිනෙකට සම්බන්ධ තේමා වෙති. අධ්‍යයන ක්ෂේත්‍ර වශයෙන් ඒවාට නිශ්චිත වූ අධ්‍යයන තේමා ප්‍රවේශ, න්‍යාය, සහ විධික්‍රම ද තිබේ. එසේ වූවත් ජාතික සහ ජාත්‍යන්තර දේශපාලනය අතර කිට්ටු අන්තර් සම්බන්ධතා ද තිබේ.

### 3.3.20. ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.22**

ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය





මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.
ඉන්,
ලකුණු 0 - 5 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 6 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 6%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.
මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගෙන් 73%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 10ක් හෝ ඊට වඩා අඩුවෙනි. 6%ක් වැනි ඉතාම සුළු ප්‍රතිශතයක් පමණක් 16-20 ලකුණු පරාසයට හිමි ලකුණක් ලබා ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.23**

ප්‍රශ්න අංක 10 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත 2020, ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රයේ 10 ප්‍රශ්නය වන මෙය කොටස් 05කින් යුක්ත වේ. අපේක්ෂකයා ඉන් ප්‍රශ්න 2ක් පමණක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්නය තුන්වන කොටසේ ජනප්‍රිය ප්‍රශ්නයයි. මෙම කොටස් පහෙහි පහසුතාව පිළිවෙළින් 45%, 44%, 40%, 38%, හා 45% කි. මෙහි සාමාන්‍ය පහසුතාව 42%ක් වැනි අඩු මට්ටමකි. කාල කළමනාකරණයේ අවශ්‍යතාවයත් කෙටි සටහන් බලාපොරොත්තු වීමත් නිසා අපේක්ෂකයන් වැඩි ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇති බව සිතිය හැකිය. ප්‍රශ්න කොටස් සමස්ත විෂය නිර්දේශය ආවරණය වන ආකාරයට සකස්ව තිබීමත්, සමස්ත විෂය නිර්දේශය පිළිබඳව පුළුල් දැනුමක් අපේක්ෂකයන් සතු නොවීමත් නිසා ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වන පිළිතුර ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන්ට අපේක්ෂක සාධනය අඩුවීමට හේතු වී ඇතැයි සිතිය හැකිය. සමස්ත විෂය නිර්දේශයම ආවරණය වන සේ ප්‍රශ්න පත්‍රය සකස් වන බව ගුරුභවතුන් තම සිසුන්ට පැහැදිලි කිරීමේ වැදගත්කම මෙයින් පෙනී යයි.

## 4. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා පොදු නිර්දේශ

අ.පො.ස (උ.පෙළ) දේශපාලන විද්‍යාව සඳහා පිළිතුරු පත්‍ර නිරීක්ෂණය කිරීමේ දී අපේක්ෂකයන් I පත්‍රය සඳහා පිළිතුරු සලකුණු කර ඇති ආකාරය, II පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, පිළිතුරු සපයා ඇති ආකාරය සහ එකී ප්‍රශ්නවල පහසුතාව පිළිබඳව සැලකිලිමත් වීමේ දී අපේක්ෂකයන් තුළ පහත සඳහන් පොදු දුර්වලතා නිරීක්ෂණය විය.

- ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර නොගැනීම.
- කටපාඩම් කරගත් පිළිතුරු ලියා දැක්වීම
- ව්‍යවස්ථාමය වගන්ති, නිර්වචන, අදාළ ග්‍රන්ථ සහ කතුවරුන් පිළිබඳ මතකය ගිලිහී තිබීම.
- බාහිර පොත පත පරිශීලනය නොකිරීම.
- විෂය කරුණු පිළිබඳ නිශ්චිත, නිරවුල් සහ තුලනාත්මක අවබෝධයකින් තොරව කරුණු දැක්වීම.
- ඉදිරිපත් කරන කරුණු සනාථ කිරීම සඳහා නිදසුන් ඉදිරිපත් කිරීමේ නොහැකියාව.
- ජාතික හා ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳ දැනුම හා අවබෝධය යාවත්කාලීන කර නොගැනීම.
- විභාගය සඳහා පෙර සූදානමක් නොමැති වීම මාසික පරීක්ෂණ, පෙරහුරු පරීක්ෂණ වාර විභාග සහ ඒකක පරීක්ෂණ සඳහා සම්බන්ධ නොවීම.
- පිළිතුරෙහි විශ්වසනීයත්වයක් නොමැති වීම මෙන්ම කරුණු සංවිධානය කරගැනීමේ දුර්වලතා
- අදාළ කරුණු පමණක් තෝරා නොගැනීම.
- විෂය කරුණු ඉදිරිපත් කිරීමේ දී න්‍යාය, භාවිතය සහ ගළපා ගැනීමේ නොහැකියාව

ආදි දුර්වලතා මගහරවා ගැනිමට පහත නිර්දේශ යෝජනා කළ හැක.

01. ගුරුවරයා විෂය පිළිබඳ පුළුල් අවබෝධයකින් ද, යාවත්කාලීන වූ දැනුමකින් ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වීම.

02. විෂයයෙහි අරමුණු හා ඉගෙනුම් ඵල පිළිබඳ සිසුන් දැනුවත් කිරීම

03. විෂය සම්බන්ධ සංකල්ප, පාරිභාෂික පද, නව විෂය ප්‍රවණතා හඳුනාගැනීම කෙරෙහි සිසුන්ට මග පෙන්වීම.

04. පාඨ, ග්‍රන්ථ පරිශීලනයට හා එදිනෙදා ජාතික හා ජාත්‍යන්තර සිදුවීම් පිළිබද දැනුම යාවත්කාලීන කරගැනීමට සිසුන් යොමු කරවීම.

05. ජාතික හා ජාත්‍යන්තර දේශපාලන ක්‍රියාකාරකම් සහිත ලිපි ලේඛන එකතුවක් පවත්වාගෙන යාමට සිසුන් යොමු කරවීම.

06. විෂය බාහිර හා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවීම (උදා- ශිෂ්‍ය පාර්ලිමේන්තුව ක්ෂේත්‍ර චාරිකා, විවාද, කථික තරග,...... වැනි )

07. පෞද්ගලිකව විශ්වසනීයත්වය තහවුරු කරගත් කරුණු පමණක් පිළිතුරු සඳහා භාවිතයට හුරු කරවීම.

08. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අඛණ්ඩ සිසු සහභාගීත්වය තබාගැනීම.

09. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරුවරයා සිසුන්ව අගය කිරීම

ආදී නිර්දේශ අනුගමනය කිරීම තුළින් අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල සංවර්ධනය කිරීමට යෝජනා කරමු.

## 5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා වන යෝජනා

සුවිශේෂී නිරීක්ෂණ යටතේ දැක්වූයේ 2020 අ.පො.ස (උ.පෙළ) විභාගයේ දේශපාලන විද්‍යාව I ප්‍රශ්න පත්‍රයේ ඇතැම් බහුවරණ ප්‍රශ්නවල හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්නවල අඩු සාධන මට්ටමක් ඇතිවීම කෙරෙහි බලපා ඇති හේතු සාධකයන්ය. එම දුර්වලතා මගහරවා ගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කළ හැකිය.

01. දේශපාලන න්‍යාය සහ භාවිතය පිළිබඳ සිසුන්ගේ දැනුම සහ අවබෝධය නිවැරදිව ගොඩනැගීම සඳහා නිවැරදිව මාධ්‍ය භාවිතය සඳහා යොමු වීම.

02. ජාතික වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රායෝගික දේශපාලනය පිළිබඳ සිසුන්ගේ දැනුම නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සඳහා කාලීන දේශපාලනික සිදුවීම් අන්තර්ගත තොරතුරු ගොනුවක් පවත්වාගෙන යාම සහ එය පරිශීලනය සඳහා සිසුන් යොමු කරලීම.

03. දේශපාලන විද්‍යා විෂය පිළිබඳ ප්‍රවීණයන්ගේ සහභාගීත්වයෙන් තම පාසලේ මෙන්ම ආසන්න පාසල්වල දේශපාලන විද්‍යාව හදාරන සිසුන්ගේ දැනුම සංවර්ධනය සඳහා සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම.

04. ශිෂ්‍යයින්ගේ දැනුම, අවබෝධය, උනන්දුව වර්ධනය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
   - ⋆ කණ්ඩායම් ක්‍රියාකාරකම්
   - ⋆ විෂය කඳවුරු
   - ⋆ පැවරුම්
   - ⋆ බුද්ධි කලම්භන
   - ⋆ විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
   - ⋆ කෙටි ලිඛිත
   - ⋆ බිත්ති පුවත්පත් නිර්මාණය කිරීම
   - ⋆ විවාද
   - ⋆ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
   - ⋆ ක්ෂේත්‍ර චාරිකා
   - ⋆ කථනය ....... ආදී

05. අඩු සාධන මටට්මක් පෙන්වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමත් මට්ටම දක්වා ගෙන ඒමට විශේෂ ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

06. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සමස්ත විෂය නිර්දේශයටම අවධානය යොමු කිරීම.